# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.11.17

වර්ෂ 2020 ක් වූ නොවැම්බර් මස 17 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ නොවැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
02. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020-10-13 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-10-13 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-10-13 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 2020-10-13 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

සංශෝධන නැතිබවයි පෙනෙන්නේ.

2020-10-13 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02) 2020-10-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-10-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-10-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2020-10-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, 2020-10-20 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ 46 වෙනි පිටුවේ මම කරපු ප්‍රකාශයේ ''රුදිගු ජයවික්‍රම'' කියන නම වැරදියට තියෙන්නේ. ඒක ''රුදිගු'' කියලා අකුරු තුනෙන් තියෙන්න ඕන. ඒකට දාලා තියෙන්නේ ''සුදිරුක්කු'' කියලා එකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තමයි කිවුවේ නේද.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ''රුදිගු'' කියන එක සාමාන්‍ය ව්‍යවහාර භාෂාවේදී කතා කරනකොට, ගමේ ගොඩේදී ''සුදිරුක්කු'' කියලා කිවුවට ඒකෙ නියම වචනය තියෙන්නේ ''රුදිගු''. මේකට මේ නඩුවක් තියෙන කතන්දරයක් නිසා කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නියම විදියට කතා කරන්න. ''සුදිරුක්කු ජයවික්‍රම'' කියලා තමයි තියෙන්නේ බොහොම පැහැදිලිව.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** හා. එහෙම නම් ප්‍රශ්නයක් නැහැ. එහෙම නම් මම ඒක ඉල්ලා අස්කර ගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මන්ත්‍රීවරු විශේෂයෙන් දැනගන්න ඕන. තමන් ප්‍රකාශ කරන එක තමයි සභා වාර්තාවේ සඳහන් වෙන්නේ. තමන්ට ප්‍රකාශ කරන්න ඕන විදියට ප්‍රකාශයන් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

2020-10-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා දන්නවා පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු ප්‍රකාශයට පත් වුණා පෙරේදා දිනයේදී. ඉතිං අපි සතුටු වෙනවා ලංකාවේ පළමුවෙනි ස්ථානය ගනිපු ලකුණු 200 න් 200 ම ලබා ගනිපු 10 දෙනා අතර ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ දැරියක් ඉන්න එක ගැන. ලංකාවේ පළමුවෙනියා පදිංචි වෙලා ඉන්නේ වටරැක අපේ බලප්‍රදේශයේ. මගේ හොඳම යාලුවෙක්ගේ දැරියක් ඒ. මාත් සමඟ ගාල්ල මහින්ද විද්‍යාලයේ අධ්‍යාපනය ලබපු ඉන්දික කරුණාතිලක මහත්මයාගේ දියණිය මේ. ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 200 ක් ලබා ගෙන එම දැරිය ලංකාවේ පළමුවෙනියා වීම සම්බන්ධව බලප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මගෙත්, උප සභාපතිවරයාගේත්, සියලුම මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ සුභ පැතුම් හා සුභාභිංෂන ඒ වටරැක පදිංචි එස්.ඩී. සියති විතුම්සා කරුණාතිලක දියණියට එක්කරනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාවේ සියලුම දෙනාගේ සුභාශිංෂන ඒ දියණියට ලිපියකින් දන්වා යවන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. මොකද ඒක ඇත්තටම අපිට, අපේ බලප්‍රදේශයට ගෞරවයක්. වටරැක නැගෙනහිර පදිංචි දැරියක් මේ. ඉතිං ඒ පිළිබඳව සිහිපත් කරන්න ඕන.

අද රැස්වීම පැවැත්වෙන්නේ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට යටත්ව. අපිට තියෙන උපරිම පහසුකම් යටතේ මේක කරන්නේ. කොවිඩ් 19 වෛරසයේ පැතිරීම එතරම් හොඳ මට්ටමක නෙමෙයි වර්තමානයේදී තියෙන්නේ. ඉතිං අපි ප්‍රාදේශීය සභාව විදියට යම් යම් කාරණා වලට, අපේ ප්‍රදේශයේ කාරණා වලට මේ වෙලාවේදී දායකත්වය දක්වනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ අවශ්‍යතාවයන් අනුව අපෙන් ඉල්ලපු කාරණා වලට, විෂබීජහරණය සහ අනෙකුත් කාරණා වලට, පර්යේෂණ වලට උදවු කිරීම් ආදිය අපි සිදු කරනවා. අපි ඊයේ දිනයේදීත් ඒ ආකාරයෙන් කටයුතු කරා. ඒ පිළිබඳවත් ඔබතුමන්ලාව දැනුවත් කරන්න ඕන. ඉදිරියට අපිට මොන තත්ත්වයන් යටතේ මුහුණ දෙන්න සිදුවේවිද දන්නේ නැහැ. ඒක හින්දා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විදියට අපි ඒ පිළිබඳව නිරන්තරයෙන්ම අවධානයෙන් ඉන්න ඕන කියන එක තමයි මගේ හැඟීම තියෙන්නේ. ඒකත් මේ වෙලාවේදී සිහිපත් කරන්න ඕන.

**<u>(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** 2021 වර්ෂය සඳහා අදාළ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව මම කෙටියෙන් සඳහන් කරන්නම් අවශ්‍ය කාරණා ටික අයවැය පිළිබඳව.

<u>ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය.</u>

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස බල ප්‍රදේශයේ ජනතා අපේක්ෂාවන් ඉටු කරලීම මාගේ පරම යුතුකමක් වන අතර එම පරමාර්ථය පෙරදැරි කරගෙන 2021 වර්ෂයේ බල ප්‍රදේශයේ සංවර්ධිත ඉලක්කයන් ඇතුළත්ව අයවැය ලේඛනයට මෙසේ සුභ පැතුම් පණිවුඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් ලෙස සලකමි.

පළාත් පාලන ආයතනයක් ලෙස අපගේ පූර්ණ වගකීම වනුයේ ජනතාවගේ සුබ විහරණය හා සුභසාධනය යන සියලු පහසුකම් ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීමට අදාළ සියලු කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම වේ. මෙම කරුණු රාශිය ක්‍රියාවට නැංවීමේදී සිවිල් සමාජය, පුරවැසියන් හා පළාත් පාලන ආයතන අතර සබැඳියාවක් නිර්මාණය වීම නිරන්තරයෙන් ගත හැකිය. මෙම සබැඳියාවන් වඩාත් ගුණාත්මක බවින් හා කාර්යක්ෂමතාවයෙන් වර්ධනය කිරීම මාගේ මෙන්ම උප සභාපතිතුමා ඇතුළුව සහෝදර මන්ත්‍රී මණ්ඩලයේ වගකීම හා යුතුකම වන බව මා අදහස් කරන්නෙමි.

මෙම අරමුණු පෙරදැරි කර ගනිමින් 2021 අයවැය තුළින් සභා බලප්‍රදේශය තුළ දියුණු මංමාවත් පද්ධතියක් ඇති කිරීම, බල ප්‍රදේශයේ ජනතාව නීරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බවට පත් කිරීම උදෙසා සෞඛ්‍ය පහසුකම් නංවාලීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි අයුරින් නොකඩවා සිදු කරගෙන යාම, වීථි ආලෝකකරණය, සුභසාධක පහසුකම් නංවාලීම මාගේ ප්‍රධාන පරමාර්ථය වේ.

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ඉතිහාසය තුල සභාවාර කීපයකදීම උත්සාහ කල නමුත් සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වූ මූලික සංවර්ධන ඉලක්කයන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මග පෙන්වීම යටතේ සහ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ අනුශාසකත්වය යටතේ මාගේ සභා පාලන කාලය තුලදී සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වෙමි. එමගින් සභා බල ප්‍රදේශය තුල ජීවත් වන ජනතාවගේ ජීවන තත්වයන් තවදුරටත් නගා සිටුවීමත් දක්ෂිණ අභිමානවත් නවමු පුරවරයක් බවට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පත් කිරීමත් මාගේ පරම සහ ඒකායන බලාපොරොත්තුවයි.

මෙම අයවැය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව හා දැනුම ලබාදීමට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා, දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය ඇතුළු ආයතනවලින් ලැබෙන සහයෝගය අගය කරන අතර ඒ සඳහා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කරමි.

එමෙන්ම ගරු උප සභාපති සුමිත් ජයසේකර මැතිතුමා ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සහ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරන අතර ඔබ සැමට සෞභාග්‍යයෙන් පිරුණු සාමකාමී නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

මේ අතරේ දී කියන්න ඕන අපිට දීර්ඝ කාලයක් තිස්සේ තිබුණ අඩුපාඩුවක් තමයි ආදාහනාගාරයක අඩුපාඩුව. ඒක මේ වෙන කොට නරාවල සිට්ට්‍රස්වත්ත ප්‍රදේශයේ ඉදිකරන්න අවශ්‍ය මූලික බිම සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන්න පුළුවන් අද ගන්න සභා තීරණයත් එක්ක. අපි ඒකෙ වැඩ ආරම්භ කිරීමට සියළු කටයුතු සංවිධානය කරලා තියෙන්නේ. ඇස්තමේන්තු සකස් කරලා තියෙන්නේ. ටෙන්ඩර් ක්‍රියාවලියට යොමු වෙන්න ඕන ඒකට. ඒ අනුව ගත්තම ඒ කාරණය එළඹෙන මාසය තුළ අපිට ආරම්භ කරලා වැඩ පටන් ගන්න පුළුවන් මට්ටමක තියෙනවා.

ඊළඟට දෙවැනි කාරණය පොළ භූමියේ ඉදිවෙන අපේ දෙමහල් වෙළඳසංකීර්ණ ගොඩනැගිල්ල. ඉතිං ඒ දෙමහල් වෙළඳසංකීර්ණ ගොඩනැගිල්ලේ සම්පූර්ණ සැලැස්ම අපිට ලැබිලා තියෙන්නේ. ඒ වගේම ඒකට ඇස්තමේන්තු සකස් කරන්න කියලා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුතුමාට යොමු කරලා තියෙනවා. ඒකට අපි ණය වැඩසටහනක් යටතේ අවශ්‍ය මුදල් ලබා ගෙන අපි ඒ වැඩ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ආදාහනාගාරයේ කටයුතු සඳහා අපි දැනට දළ වශයෙන් ඇස්තමේන්තු ගත කරලා තියෙනවා කෝටි තුනහමාරක වගේ මුදල් ප්‍රමාණයක් වැය වේවි කියලා. නමුත් ලංකාව පුරා විවෘත ටෙන්ඩරයක් කරන්නේ. ඒ ටෙන්ඩරයෙන් අපිට ඊට වැඩිය අඩු ප්‍රමාණයකට මේක කර ගන්න හැකියාව ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ සියලු මුදල් අපිට ලැබෙන්න ඕන මුද්දර ගාස්තු විදියට ගරු ආණ්ඩුකාරතුමාගෙන් අපිට ඒ වැඩේට ලැබෙනවා. ඒකට ණයක් ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. රමේෂ් පතිරණ ඇමතිතුමාගේ මැදිහත්වීම මත දැනටමත් අපිට කෝටියක මුදලක් එවලා තියෙනවා ආදාහනාගාරයේ වැඩ කටයුතු ආරම්භ කරන්න. ඉතිං එතනදී සිහිපත් කරනවා රමේෂ් පතිරණ ඇමතිතුමාගේ මැදිහත්වීම පිළිබඳව. ඒක අපි මේ වෙලාවේදී අගය කරන්න ඕන. ඉතිං ඒ ආකාරයෙන් ගත්තම ඒවා ප්‍රධාන කාරණා දෙකක්.

ඊළඟට සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහාත් අපි මේ වන විට සැලැස්ම සකස් කරමින් යන්නේ. ඒකට රමේෂ් පතිරණ ඇමතිතුමා, ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමත් එක්ක සාකච්ඡා කරලා තිබුණා. මොකද ආණ්ඩුව වසර දෙකකට ඉදිකිරීම් ප්‍රමාණය සීමා කරලා තියෙන්නේ, මොකද මේ පවතින තත්ත්වයත් එක්ක, රටේ ආර්ථික තත්ත්වයත් එක්ක. ඒ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුදල් ලබා දීමට යම් එකඟතාවයක් දීලා තිබුණා. කෙසේ හෝ මුදල් ලබා දෙනවා කියලා තිබුණා. ඉතිං අපි මේ ඉටුකරන්න බලාපොරොත්තු වන ප්‍රධාන කාරණා තුන මේ.

ඊට අමතරව, යටිතල පහසුකම්, ග්‍රාමීය සංවර්ධන කටයුතු ඒ ආකාරයෙන්ම සිද්ධ වෙනවා. ඒ වගේම දැනට මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ මාර්ග කාපට් කරනවා. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මට මාර්ග කිලෝමීටර් 10 ක්, රමේෂ් පතිරණ ඇමතිතුමාගෙන් මාර්ග කිලෝමීටර් 25 ක්, ඔය ආකාරයෙන් ගත්තම මාදුගොඩ හිටපු පළාත් සභා මන්ත්‍රීතුමාගෙන් මාර්ග කිලෝ මීටර් 15 ක් කාපට් වෙනවා. ඔය ආකාරයෙන් ගත්තම මම හිතන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පාරවල් වලින් 40% ක් විතර කාපට් පාරවල් බවට පත්වෙනවා. ඊට අමතරව මම හිතනවා අද වෙන විට 90% ක් විතර පාරවල් සකස් කරලා තියෙනවා. සපිරි ගමක් වැඩසටහන යටතේ සෑම ග්‍රාම සේවා වසමකටම රුපියල් ලක්ෂ 20 ක මුදලක් වෙන් වෙලා තියෙනවා. ඒ අනුව ගත්තම 90% කට වැඩි ප්‍රමාණයක් යටිතල පහසුකම් මේ වසර වන විට බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුල අවසන් වෙනවා. නමුත් මම දකින්නේ යටිතල පහසුකම් විදියට පාරවල් සංවර්ධනය කරනවා වගේම මගේ අරමුණ තියෙන්නේ ලබන වසරේදී විධිමත් කාණු පද්ධතියනුත් සකස් කරන්න. පාරවල් කොච්චර සංවර්ධනය කරත් වැඩක් නැහැ කාණු පද්ධතිය හරියාකාරව සකස් නොවුනොත් අපිට පාරවල් වලින් එතරම් ප්‍රයෝජනයක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම විදියට ලබන වසරේදී කාණු පද්ධති සඳහා ප්‍රමුඛත්වය දීලා වැඩ කරන්න. මේ සෑම වැඩ කටයුතු වලදීම ගරු උප සභාපතිතුමා, ඒ වගේම සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සභාපතිවරයා විදියට මට මේක මෙහෙය වන්න, කළමනාකරණය කරන්න දක්වන සහයෝගය පිළිබඳව ඇත්තටම මම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම නිරන්තරයෙන්ම මේ කටයුතු පිළිබඳ අවධානයට ලක් කරමින්, නිලධාරීන් මෙහෙයවමින් අපේ ලේකම්තුමා ප්‍රධාන සියලුම නිලධාරි මහත්ම, මහත්මීන් දක්වන සහයෝගය අගය කරනවා. අපේ දිස්ත්‍රික්කයේ නායක වැවිලි කර්මාන්ත ගරු අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ ඇමතිතුමා නිරන්තරයෙන්ම මේ සංවර්ධන කටයුතු පිළිබඳව එතුමාගේ අධීක්ෂණය යොමු කරමින් අපිව දිරිමත් කරගෙන, අපිත් සමඟ නිරන්තරයෙන්ම මේ කටයුතු සාකච්ඡා

කරලා විශේෂ උනන්දුවකින් ජනතාව වෙනුවෙන් කටයුතු කරනවා. වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාටත්, මේ වෙලාවේදී කෘතවේදී ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

අයවැය සාරාංශය පිළිබඳවත් යම් සඳහනක් කරන්න ඕන. ඒක ඔබතුමන්ලාට ලබා දීලා තියෙන්නේ.

මෙතන ගැටළු මොනව හරි තියෙනවා නම් ඉදිරිපත් කරන්න. දළ වශයෙන් මේ අන්තිම පිටුවල සමස්ථ සාරාංශය සකස් කරලා තියෙනවා.

**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව අයවැය සාරාංශය - 2021**

**2021 වර්ෂයට අපේක්ෂිත මුළු ආදායම - රු. 149,246,000**

| | |
|---|---|
| **පුනරාවර්තන ආදායම** | **රු. 136,246,000** |
| **ප්‍රාග්ධන ආදායම** | **රු. 13,000,000** |

**2021 වර්ෂයට අපේක්ෂිත මුළු පුනරාවර්තන ආදායම - රු. 136,246,000**

| | |
|---|---|
| • වරිපනම් හා බදු | 16,645,550 |
| • කුලී | 5,859,800 |
| • බලපත්‍ර ගාස්තු | 1,370,150 |
| • සේවා සඳහා ගාස්තු | 6,134,600 |
| • වරෙන්තු ගාස්තු හා දඩ | 2,491,450 |
| • වෙනත් ආදායම් | 57,310,000 |
| | **136,246,000** |

**2021 වර්ෂයට අපේක්ෂිත මුළු ප්‍රාග්ධන ආදායම - රු. 13,000,000**

| | |
|---|---|
| • ප්‍රාග්ධන ආධාර | 13,000,000 |
| • ණය ලැබීම් | - |
| | **13,000,000** |

**2021 වර්ෂයට අපේක්ෂිත මුළු වියදම - රු. 149,246,000**

| | |
|---|---|
| **පුනරාවර්තන වියදම** | **රු. 91,596,000** |
| **ප්‍රාග්ධන වියදම** | **රු. 57,650,000** |

**2021 වර්ෂයට අපේක්ෂිත මුළු පුනරාවර්තන වියදම - රු. 91,596,000**

| | |
|---|---|
| • වැටුප් හා දීමනා | 60,022,000 |
| • ගමන් වියදම් | 1,606,500 |
| • සැපයුම් හා උපකරණ | 7,641,000 |
| • ප්‍රාග්ධන වත්කම් අ.වැ. හා නඩත්තු | 11,200,000 |

- වෙනත් ආවශ්‍යක සේවා 8,964,000
- පොළී ගෙවීම් -
- ආධාර මුදල් හා සහනාධාර 102,500
- විශ්‍රාම වැටුප් 2,060,000

**91,596,000**

**2021 වර්ෂයට අපේක්ෂිත මුළු ප්‍රාග්ධන වියදම - රු. 57,650,000**

- ප්‍රාග්ධන වැය 57,650,000
- ණය ආපසු ගෙවීම් -

**57,650,000**

දැන් මේ පුනරාවර්තන වියදම් යටතේ මේ එක එක කාරණා පෙන්නුවට සාමාන්‍යයෙන් සේවා සඳහාත් ඒ පුනරාවර්තන වියදම් වලින් වෙන් කරලා තියෙන බවත්, සිහිපත් කරන්න ඕන. කෙටියෙන් සාරාංශගතව මම ඉදිරිපත් කරේ. ඊට වැඩිය පුළුල්ව ඔබතුමන්ලාට බලන්න පුළුවන් මේක. වැඩසටහන් පහක් යටතේ තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ. ඒකෙදී ඔබතුමන්ලාට දකින්න පුළුවන් පොදු පරිපාලනය සහ කාර්ය මණ්ඩල සේවා, ඊට පස්සේ සෞඛ්‍ය සේවාව, ඊට පස්සේ භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් සහ ගොඩනැගිලි, ඒ වගේම වෙනත් උපයෝගිතා සේවා සහ සුභසාධක සේවා තියෙන්නේ. අපි මේ ශීර්ෂයන් පහ යටතේ තමයි සභාවේ වැඩ කටයුතු කරගෙන යන්නේ. වර්තමානයේ අයවැය මේ ශීර්ෂයන් පහ යටතේ තමයි සකස් කරලා තියෙන්නේ.

මන්ත්‍රීවරුන්ට අදහස් දැක්වීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මම අවධානය යොමු කරන්න හදන්නේ ඔබතුමා පළවෙනියට කරපු සංවර්ධන වැඩපිළිවෙලට අදාළ විස්තරය සඳහා. ගරු සභාපතිතුමනි, අපි පිළිගන්නවා මේ වසර තුළ මේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඉතා විශාල වැඩ කොටසක් කෙරුණා. කාපට් පාරවල් ඉදිවෙනවා. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලක්ෂ 20 ක කර්මාන්ත ඉදිවෙනවා. සංවර්ධන කටයුතු විශාල වශයෙන් සිද්ධ වෙනවා. නමුත් අපි දිගින් දිගටම කියනවා මේ වෙන්දේසිකරුවන් හින්දා මේ සිදු වෙන පාරවල් සෝදා යාම පිළිබඳව. මම දිගින් දිගටම කිව්වා අර කළුපහන පාර ගැන. පාර කාපට් කරලා අවුරුදු 7 ක් 8 ක් විතර වෙන්න ඇති. මම හිතන්නේ ඔබතුමත් ගියා, මමත් ගියා මේක විවෘත කරන කොට. අද වෙන කොට අර තරංගා ලෑන්ඩ්ස් ආයතනය කරන ඒ වෙන්දේසියෙන් තනිකරම දැන් අර පාරේ පළල අඩි 06 ක් වත් නැහැ. එදා තිබුණ කාපට් මාර්ගයේ දැන් වලවල් හැදිලා. තව ටික දවසක් යන කොට දෙවියන්ගේ, බුදුන්ගේ සරණයි පාරට. මම දන්නේ නැහැ මොකක්ද කරන්නේ කියලා. දැන් නම් පාර දෙපැත්තම හදලා ඕන. එක පැත්තක් හදලා දෙන්න කියලා කලින් කිව්වේ. වහාම මේ වැඩ නවත්වන්න. මේවා අපි කොච්චර සංවර්ධනය කරත් වැඩක් නැහැ. ගිහිල්ලා බලන්න. දැන් එතනම සේනාරත්න මහත්තයලගේ ගෙට උඩින් තියෙන ඉඩමේ බණ්ඩාරනායක මහත්තයලගේ නිවස අසලින් තියෙන ඉඩම විනාශ වෙලා. බණ්ඩාරනායක මහත්තයා මට දුරකථනයෙන් කතා කරලා කිව්වා. ඒ මහත්තයාගේ ඉඩමට යන පාර සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. මෙහෙමයි සංවර්ධන කටයුතු කරන්න පුළුවන්. අපිටත් මේක නොතේරෙනවා නෙමෙයි. නමුත් වෙලා තියෙන්නේ මේ කාරණා කරන කොට සත පහකට සභාවේ ඉන්න ලේකම්තුමා, සභාපතිතුමා හෝ එහෙම නැත්නම් නිලධාරීන් කියන දෙයක් අහන්නේ නැතුව තමයි මේ වෙන්දේසිකරුවන් වැඩ කරන්නේ. මේක බෝපෙ පෝද්දලට ඇවිල්ලා අපිට කනට ගහනවා වගේ වැඩක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා හෙට නෙමෙයි අනිද්දා ඔබතුමා සහභාගි වෙන්න තාක්ෂණ නිලධාරිතුමා එක්ක. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට තිස්ස මන්ත්‍රීතුමත් එන්න. අපි ගිහිල්ලා බලමු මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. අපි එතකොට සාකච්ඡා කරලා බලමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි පරීක්ෂණයකට ගියපු අවස්ථාවේදී දැක්කා, මේ සභාවේ තාක්ෂණ නිලධාරිතුමා මෙහෙන් ලියුම යැව්වම, ඒක පරීක්ෂා කරන්න, බලන්න ගියාම මේක නවත්වන්න, මේ ටික කරලා ඉවර වෙලා මේවා කරන්න කිව්වට, ගියාට පස්සේ ආයෙම ඒ වැඩ ටික පටන්ගන්නවා.

කාගේ හයියකට කරනවද දන්නේ නැහැ. ප්‍රාදේශීය සභාව හැල්ලුවට පත් වෙලා. මේ ගමන යන්න බැහැ. අපි කොච්චර සංවර්ධන කටයුතු කරත්, ගරු රමේෂ් පතිරණ ඇමතිතුමා මේකට උදවු කරත්, අපිට ගමේ මිනිස්සුන්ගෙන් අහන්න ලැබෙන අපවාද වලින් ගොඩ එන්න බැහැ. සමහර වෙලාවට කොච්චර හොඳ කරත් වැඩක් නැහැ, එක වැරැද්දක් කරහම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි සුගත් මන්ත්‍රීතුමා මම ඇත්තටම මන්ත්‍රීවරු කියන දේ අහන කෙනෙක් මම දකින විදියට නම්. ඔබතුමා මට ඊයේවත් කිවුවා නම් හරි. අපි මෙතන හිටියා. එවෙලේ මම තාක්ෂණ නිලධාරිතුමාට කිවුවේ සම්පූර්ණයෙන්ම ඒ පිළිබඳව අවධානයෙන් ඉන්න කියලා. මාව දැනුවත් වුණේ උදේ තිස්ස මන්ත්‍රීතුමා ඇවිත් කවුද කතා කරලා දොස් කිවුවා කියලා කිවුවට පස්සේ. ඉතිං ඇත්තටම ඊයේ අපිට ගිහිල්ලා බලන්න තිබුණා. මේක ඔබතුමා පිළිගන්නවද, නැද්ද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගිය සභා වාරයේදීත් මම කිවුවා මතකද දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ තාක්ෂණ නිලධාරිව යවලා තිබුණා ලේකම් මහත්තයා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කියපු ටිකවත් අහන්නේ නැහැනේ. ඒ මනුස්සයා කවුද දන්නේ නැහැ. මම නම් කවුද කියලා දැකලාවත් නැහැ. මම කියන්නේ මේ අය නිසා ගමට වෙන අසාධාරණය පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒකෙ වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** බලන්නකෝ ගිහිල්ලා මොකක්ද වෙලා තියෙන්නේ කියලා. මුළු පැත්තම ඉවරයි. දැන් සභාපතිතුමා මෙහෙමයි. දැන් මම කියන්නේ වෙන දෙයක් නෙමෙයි. ඉස්සෙල්ලා අපේ පාර බේරලා දෙන්න කියන්න. ඊට පස්සේ සංවර්ධන කටයුතු කරන්න කියන්න. එහෙම කරන්න ඕන. එතකොට හරි වැඩේ කෙරේවි. අපි දන්නවානේ මේවායෙන් එකට තුනක් ලාභ ගන්නවා. ලාභ නොගන්නවා නෙමෙයිනේ. වෙන්දේසි කරන්නේ නිකං නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකට අනිද්දාට ඔබතුමා අනිවාර්යයෙන්ම සම්බන්ධ වෙන්නකෝ. අපි ඒක බලමු.

මම කියනවා දැන් අයවැය සම්බන්ධව අදහස් දක්වමු. අනෙක් කාරණා සඳහා මන්ත්‍රීවරුන්ට ඊළඟට අවස්ථාව ලබා දෙන්නම්. මොකද, සෞඛ්‍ය නීතිත් අපි රකිමින් තමයි මේ සභාව පවත්වන්නේ. අපි දීර්ඝ කාලයක් සභාව කරගෙන යනවාට වඩා මම හිතන්නේ අවශ්‍යම ටික කතා කරමු. ඔබතුමාගේ අදහස හොඳයි කිසි ගැටලුවක් නැහැ. අවශ්‍යයම කාරණා ටික කතා කරලා අපි සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න කටයුතු කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඇත්තටම අයවැය ගැන දීර්ඝව කතා කරන්න යන්නේ නැහැ. මොකද හේතුව අපි ඔබතුමන්ලාට මේක මීට වඩා නිවැරදිව අයවැය ගේන්න කියලා කිවුවා. කමක් නැහැ අපි දැන් මේක කරගෙන යමු. නමුත් ගරු සභාපතිතුමනි, සුගත් මන්ත්‍රීතුමා ඉතා නිවැරදිව දේවල් ඉදිරිපත් කරා. ගරු අමාත්‍යතුමා, සියලු දෙනා සංවර්ධන කටයුතු සඳහා වැඩ කරනවා. ඒ වගේමයි පහුගිය කාලය තුළ මොන ප්‍රශ්න තිබුණත් තමුන්නාන්සේලා දන්නවා මම නියෝජනය කරපු රජය ඒ කාලයේදී විශාල සංවර්ධන වැඩපිළිවෙලක් යෝජනා කරලා ගෙනාවා. නමුත් ඒවා කරා. ඒවා කොහෙන් හරි කෙරිච්ච එක කමක් නැහැ. කවුරු කරත් ඉතිහාසයේ කවදාවත් නොකරපු දේවල් කරා. ප්‍රතිපාදන ගෙනාවම ඒකෙ ගෞරවය තියෙන්න ඕන ඒ අයට. නමුත් ඒක එහෙම නෙමෙයි වෙන විදියකට ගියා. ප්‍රදේශයේ මනුස්සයෝ දන්නවා මොකක්ද වුණේ කියලා. ඉතිං මේ සංවර්ධන වැඩපිළිවෙල හොඳයි. ගරු සභාපතිතුමා, ඔබතුමා ඉතා නිවැරදිව දෙයක් දැක්කා. ඒ කියන්නේ පාරවල් කඩලා යන එක නෙමෙයි මීනි ටිකක් මැරෙනවා. කාපට් කරන එක ඉතාම වටිනවා. හැබැයි කාණු නොදැම්මොත් ඒක ප්‍රශ්නයක්. දැන් මේ තද පල්ලම් තියෙන්නේ. වාහනයක් අයින් කරන්නවත් බැහැ. හැබැයි දෙපැත්තේ කාණු දැම්මොත් තව අඩියක් දෙකක් පාර පළල් වෙලා එනවා. ඉතිං මම හිතන්නේ ඔබතුමන්ලාට තමයි ගරු ඇමතිතුමා හරහා ඒක කරන්න පුළුවන්කම තියෙන්නේ ඒක යෝජනා කරලා. හැබැයි ගරු සභාපතිතුමනි, ඇත්තටම මේක ඉතා නිවැරදියි. ඒ කියන්නේ ගම් වල තියෙන අදහස් ගන්න ඕන. අයවැය යෝජනා එහෙම ගන්නවා නම් ප්‍රජා මූල සංවිධාන වලින් අදහස් ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගත්තා. සියලු ප්‍රජාමූල සංවිධාන අපි දැනුවත් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සියලු ප්‍රජාමූල සංවිධාන කොහොම වෙතත් අරගෙන තියෙනවා. දැන් අඩුගානේ මම දැක්කේ ලබුදූව, අබේසුන්දර වත්ත, හපුගල, අද්දරගොඩ, කහදූව වත්ත එච්චරයි. දැන් ඒ කියන්නේ මේකෙ ඔබතුමන්ලාගේ නියෝජිතයෝ ඉන්නවානේ හැම තැනම නියෝජනය වෙන විදියට. දැන් අපිට නියෝජනයක් නැති හින්දානේ අපිව කැඳවන්නෙත් නැත්තේ. ඉතිං ඒ හැම තැනකින්ම ගන්නවා නම් වටිනාකමක් තියෙනවා. ගරු සභාපතිතුමා ඉතිං ඊළඟට විශේෂයෙන්ම ඔබතුමාට කියන්න ඕන දැන් ප්‍රශ්නයක් ඇවිල්ලා තියෙනවා. ඒක නිතර නිතර මතු කරා. ඒ කියන්නේ පී.ආර්.ඩී. පාරවල් වල ගැටළුව. දැන් නාවින්න පාර උදාහරණයකට ගත්තම යන්න බැහැ. ඔබතුමාට කරන්න පුළුවන් දෙයක් තමයි පී.ආර්.ඩී. එකෙන් මුදල් ටික ගන්න. ඒ අයට අවුරුද්දකට වැය වෙන මුදලක් තියෙනවානේ. ඒ අවුරුද්දකට වැයවෙන මුදල අරගෙන සභාවෙන් හරි ඒක කරවන්න බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක පැහැදිළි නැහැ. ඒකලු මේකලු පාරේ යන්න බැහැලු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කීපපාරක්ම සභාවේ යෝජනාවල් ගෙනල්ලා තියෙනවා. පී.ආර්.ඩී. එකට තියෙන පාරවල් නියමිත ආකාරයෙන් සුද්ධ කරන්නේ නැහැ. පවිත්‍ර කරන එක, තණකොල කපන එක, කාණු සුද්ධ කරන එක කරන්නේ නැහැ. ඒ නිසා මම උදාහරණයකට කියනවා නාවින්න පාර ගැන. ඔබතුමා බලන්න යන්නකෝ. ඒ නාවින්න පාරේ යන්න බැහැ. පාරත් පටුයි. ජේන්නෙත් නැහැ. තණකොළ ඔක්කොම වැවිලා. ඉතිං පී.ආර්.ඩී. එකෙන් අවුරුද්දකට මුදලක් වෙන් වෙනවා. ඒ මුදල අපිට ඉල්ල ගන්න ඒක එයාලට කරන්න බැරි නම්. ඉල්ලගෙන ඉවර වෙලා අපේ කම්කරුවෝ දාලා හරි, කොන්ත්‍රාත් පදනමින් හරි ඒක කරන්න. මේක මම දිගින් දිගටම ඉදිරිපත් කරා.

ඉතිං ඊළඟට ඔබතුමාගේ ප්‍රධාන යෝජනාවක් විදියට ආදාහනාගාරය හදන එක ඉතාම හොඳයි. ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා 19 න්ම ඒ අඩුව තිබුණේ අපිට. ඒක ඉතාම හොඳයි. ඇමතිතුමා මහන්සිවෙලා ඒක ගනිපු එක හොඳයි. මම පෞද්ගලිකව මගේ ජීවිතයේදී සන්තෝෂ වෙනවා. මම මේ යෝජනාව මුල ඉඳලා කරා. හැබැයි ඇමතිතුමාට වුණත් මේක ඒ කාලයේදී කරන්න තිබුණා. මොකද හේතුව වෙන දෙයක් නෙමෙයි නරාවල ප්‍රදේශයේ ඉන්න ජයතිලක මහත්තයා මේකට බොහොම මහන්සිවෙලා අක්කර පහක් ගන්න මැනුම් කටයුතු පවා කරගෙන ගියා. නමුත් ඒක ඉතිං එවෙලේ කෙරුණේ නැහැ. මේක දැන් හරි කෙරුන එක ගැන පෞද්ගලිකව මම සන්තෝෂ වෙනවා. මේක අත්‍යාවශ්‍ය දෙයක් මේ ප්‍රදේශයට. ඒ වගේමයි ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ප්‍රාදේශීය සභාවට සියලු ජනතාවට එන්න බැරි හින්දා තමයි මේ නියෝජිතයෝ එවලා තියෙන්නේ. ඒක හින්දා මේ සභාවේ සංවර්ධන කටයුතු වලදී, ගොඩනැගිලි හදන කොට, වෙළඳ සංකීර්ණය හදන කොට ගරු ඇමතිතුමා ඒකෙ නායකත්වය ගන්න එක බොහොම හරි. ඒක නිවැරදියි. හැබැයි ඒ වෙලාවට මේ මන්ත්‍රීවරුන්වත් සහභාගි කර ගන්න බලන්න. මම කියන්නේ මන්ත්‍රීවරු කියන දේ කරන්න නෙමෙයි. අදහස් තියෙනවා. සමහර වෙලාවට දැන් ඇත්තටම මේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, එහෙම නැත්නම් වෙළඳ සංකීර්ණය යන දෙකම හදන කොට අපිට තියෙනවා අදහස්. ඔබතුමන්ලා අපි පහුගිය කාලවල යෝජනාවල් ගෙනල්ලා පස පිළිබඳව පරීක්ෂණ කරලා ඒ ඔක්කොම කරලා තිබුණේ. ඇත්තටම මම හැමදාම කියනවා භූමිය කියන එක ලියලන්නේ නැහැ. මේකෙදි තව අවුරුදු 25 ක්, 50 ක් ඉස්සරහට බලලා ඉවර වෙලා ඇත්තටම අපිට කරන්න පුළුවන් දේ කරන්න. ඒකෙ ගෞරවය ඇත්තටම ඇමතිතුමාට, ඔබතුමාට එනවා. ඒක ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි තට්ටු හතරක් හදන්න පුළුවන් තැන තට්ටු දෙකක් හදලා නතර කරන එක කරන්න එපා ගරු සභාපතිතුමනි, අපිට ආවා නම් මේ අදහස් දක්වන්න පුළුවන්. අපි කියන දේ නොකෙරෙන්න පුළුවන්. හැබැයි ඒ ඇමතිතුමා, සියලු දෙනා ඉන්න තැන ඕක කියන එකේ වගකීම මේ සභාවේ හැම මන්ත්‍රීවරයෙකුටම තියෙනවානේ. ඔබතුමාගේ අවධානය ඒ සඳහාත් යොමු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඔබතුමා කියපු කාරණය පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න ඕන. ඔබතුමා නිවැරදිව ප්‍රකාශ කරා මහජන නියෝජිතයෝ කියන්නේ ජනතාවගේ මතය මේ සභාවේ ප්‍රකාශ කරන අය කියලා. ඉතිං ඒකේදී අපි ඒක තමයි මහජන නියෝජිත ඔබ සියලු දෙනාගෙන්ම, උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සියලු දෙනාගෙන්ම අයවැය සඳහා සාකච්ඡාවක් තිබ්බේ. කාලය ලබා දුන්නා. යෝජනා කැඳෙව්වා. ඔබතුමන්ලාගෙන් ඒ සියලු දේ කැඳෙව්වා. ඉතිං මම දන්නේ නැහැ සියලු දෙනාම ඒකට යෝජනා ඉදිරිපත් කරාද කියන එක. ඒක මම දන්නේ නැහැ. සියලු දෙනාවම කැඳෙව්වා. දැන් ඔබතුමා නිකං ඒක බොහොම හැල්ලුවකට වගේ ලක් කළා. ස්වේච්ඡා සංවිධාන පහකින් වගේ යෝජනා ආවා, ඒවා නම් කියලම කිව්වා. නමුත් ගිය සැරේ ස්වේච්ඡා සංවිධාන වලින් යෝජනා කැඳෙව්වම මන්ත්‍රීවරු චෝදනා කරා. මතකද ගිය සැරේ ස්වේච්ඡා සංවිධාන වලින් යෝජනා කැඳෙව්වා. එතකොට මන්ත්‍රීවරු චෝදනා කරා අපි මන්ත්‍රීවරු විදියට ඉන්න කොට ස්වේච්ඡා සංවිධාන කැඳවලා යෝජනා ගන්නේ ඇයිද කියලා. ඒක නිසා මම මේ සැරේ කැඳෙව්වේ නැහැ. ස්වේච්ඡා සංවිධාන වලට ලිඛිතව දැනුම් දීලා මේ ආපු එක තමයි තියෙන්නේ. අපිට බලහත්කාරයෙන් ස්වේච්ඡා සංවිධාන වලින් යෝජනා ගෙන්න ගන්න බැහැ. අපි ලියුමක් යැවුවම ගෙනත් දීපු යෝජනා මේ තියෙන්නේ. ඉතිං ඒ පිළිබඳව සඳහන් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ස්වෙච්ඡා සංවිධාන වලින් යෝජනා ගන්න එකේ වැරැද්දක් නැහැ. නමුත් අපි බොහොම පැහැදිළිව කියන්න ඕන. අපිට බල්බ් එකක් දා ගන්න එකවත් පහුගිය අවුරුදු දෙකේදී කර ගන්න බැරි වුණා. අපි ගෙනාපු සංවර්ධන යෝජනාවල් අපිට කර ගන්න බැරි වුණා. ඉතිං ඒක නිසා ඒකට කමක් නැහැ. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඔබතුමා දැන් මේ වැඩපිළිවෙලට ප්‍රවිශ්ඨ වෙලා තියෙනවා. අපිට විරුද්ධ පක්ෂය විදියට ඒ වෙච්ච අඩුපාඩු නිසා කරන්න තියෙන්නේ විරුද්ධව ඡන්දය දෙන එක. ඒක පැත්තකින් තියන්න. ඔබතුමන්ලට මේක සම්මත කර ගන්න පුළුවන්. ඔබතුමා දැන් යම් කිසි වැඩපිළිවෙලකට ප්‍රවිශ්ඨ වෙලා තියෙනවා. අපි ඒක අගය කරනවා. මුලින්ම අපේ සුගත් මන්ත්‍රීතුමාම කියපු විදියට මේවා නිවැරදි වෙන්න ඕන. ඒක හින්දා ඔබතුමා දැන් වැඩපිළිවෙලකට ප්‍රවිශ්ඨ වෙලා තියෙනවා. ඒක ඉදිරියට ගෙනියන්න අපි ඔබතුමාට ශක්තිය දෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මේක ඉවර කරමු. මොකද ඔබතුමා සඳහන් කරා රමේෂ් පතිරණ ඇමතිතුමාට මේක කලින් කරන්න තිබුණා කියලා. නමුත් අමතක කරන්න එපා ගයන්ත කරුණාතිලක ඇමතිතුමා තමයි හිටියේ. රමේෂ් පතිරණ මැතිතුමා ඇමතිකමක හිටියේ නැහැ කලින්. නමුත් ඔබතුමා දන්නවා මේකෙ වතු අධිකාරි විදියට ඉන්නේ ගයන්ත කරුණාතිලක මැතිතුමාගේ සහෝදරයා. නමුනුකුල වැවිලි සමාගම මේක. ඒ වගේම හිටපු ඉඩම් ඇමතිවරයා විදියට හිටියේ ගයන්ත කරුණාතිලක මැතිතුමා. ඉතිං ලේසියෙන්ම මේ ප්‍රධාන කාරණා දෙකම ඉෂ්ඨ කර ගන්න තිබුණා. ඉතිං මේක මෙතනදී හැල්ලුවට ලක් කරන්න එපා රමේෂ් පතිරණ ඇමතිතුමා ගැන කියලා. ඔබතුමා ඒක කිවුවා. ඇමතිවරයා මේක කරන එක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කිවුවේ ඇමතිතුමාට මේක කලින් කරන්න තිබුණා කියලා. ඊට කලින් කරන්න ගොඩක් අවස්ථාව ඔබතුමාට තිබුණා. ඒක අපි මේ වෙලාවේදී අමතක කරමු. ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හැල්ලුවට ලක් කරේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීට කලින් එතුමාට කරන්න තිබුණ දෙයක් කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙහෙම තියෙන්නේ ගරු සභාපතිතුමා. මීට කලින් කරන්න තිබුණ ගොඩක් දේවල් තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්න ගියේ ඒක නෙමෙයි. මම කියන්න ගියේ එතුමා මන්ත්‍රීවරයෙක් විදියට විතරයි හිටියේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විදියට ඉන්න කොට ඒ හයිය තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒ හයිය තිබුණා කියලා කිවුවට මම කිවුවේ මීට වැඩිය හයියක් එතකොට තිබුණා අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක අඩු තක්සේරුවට ලක් කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ ඊට වැඩිය හයියක් තිබුණා. ගයන්ත කරුණාතිලක මැතිතුමා ඇමතිවරයා විදියට හිටියේ. එතුමාගේ සහෝදරයා වතු අධිකාරි විදියට හිටියේ. මේකෙ මොන ඇමතිවරයා හිටියත් වැඩක් නැහැ වතු අධිකාරිවරයාගේ එකඟතාවයක් තියෙන්න ඕන. මෙතනදී අපි දකින සුවිශේෂිකම තමයි ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වතු අධිකාරිවරයාගේ එකඟතාවයක් තියෙන්න ඕන කියලා කතාවක් නැහැ. 51% ක් රජය සතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාගේ එකඟතාවය මෙතනදී ඕන. ඇත්තටම වතු අධිකාරිවරයාටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕන මෙතනදී. එතුමා කිසිම බාධාවකින් තොරව ඉඩ දුන්නා. ලේසි නැහැ. මොකද විශාල ගස් ප්‍රමාණයක් කැපෙනවා. මේක අවතක්සේරු කරන්න එපා අබේසේකර මන්ත්‍රීතුමා. මොකද මේකේදී දරුවෝ වගේ හදා ගනිපු ගස් විශාල ප්‍රමාණයක් කැපෙනවා. අපිටත් දුකයි. රබර් කිරි කපන ගස් 60 ක් විතර කැපෙනවා. ඒ අය වවලා හොඳට ඵලදාව ලබා ගන්න කාලය මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම ඔබතුමාට කියන්නම්. මේ වැවිලි සමාගම් වලින් කෙරිච්ච දේවල් බැලුවොත් අද තියෙන්නේ හිස් භූමි. කරලා තියෙන එකම දේ තමයි තිබුණ ගස් කොලන් ටික කපලා පඩි ගෙවා ගෙන හිටපු එක. ඇත්තටම ඒක ලොකු අඩුවක්. මොනයම් ක්‍රමයකින් හරි ඒවා ආයේ අරගෙන වවන්න දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි අබේසේකර මන්ත්‍රීතුමා. මේ ඊළඟ කාරණාව. ඔබතුමා සඳහන් කරපු කාරණාව වන්නේ කලේගාන පොළ භූමියේ වෙළඳ සංකීර්ණයක් ඉදිකරන එක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක කියන එක වටිනවා. මේකට කවුරු මොනවා කිව්වත් පොඩිම අඩු තක්සේරුවක්වත් නැහැ. දැන් ඇත්තටම කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ කතාව ගත්තොත් එහෙම ඒක බොහොම පැහැදිළිව ගරු සභාපතිතුමා මේ වෙලාවේදී කරන්න පුළුවන්. ඒකෙදි එහෙම පක්ෂ භේදයකින් තොරව දෙන්න පුළුවන් සියලු හයිය දෙනවා. ඒ නිසා ගැසට් එක අහෝසි කරන තැනට යමු. සභාවේ කතා කරලා ඉවර වෙලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමා සඳහන් කරා තට්ටු තුනකට හෝ හතරකට හදන්න පුළුවන් කියලා කලේගාන පොළ භූමියේ ඉදිකරන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල. නමුත් අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙම දේකුත් තියෙනවා. අපි සැලැස්ම හැදුවා තට්ටු හතරකට. අපි තට්ටු හතරක ගොඩනැගිල්ලකට ඇස්තමේන්තු සකස් කරා. මිලියන 380 ක් ඒකට යනවා. කෝටි 38 ක මුදලක් යනවා ඒකට. මොකද ඒකේ තට්ටු ප්‍රමාණය වැඩි වෙන්න වැඩි වෙන්න අත්තිවාරම ශක්තිමත් වෙන්න ඕන. ඉතිං ඒ හින්දා ගොඩනැගිල්ලට යන මුදලින් බාගයකට කිට්ටුවෙන්න යනවා අඩිතාලම ඉදිකරන්න. උදාහරණයක් මම කියන්නම්. මේ ප්‍රදේශයේ හැමතැනම එහෙම තත්ත්වයක් තියෙන්නේ. එහා පැත්තේ පර්චස් 06 හදන ගොඩනැගිල්ලට දැනට අත්තිවාරම සඳහා පමණක් ලක්ෂ 25 කට ආසන්න මුදලක් ගිහිල්ලා තියෙනවා. අත්තිවාරම සඳහා විතරක් ඒ මුදල ගිහින් තියෙනවා. ගොඩනැගිල්ලටම ලක්ෂ 40 යි වැය වෙන්නේ කියලා බලාපොරොත්තු වෙන්නේ. ඔන්න ඕකයි තත්ත්වය. ඒක හින්දා ඇමතිතුමා කිව්වේ අපිට කරන්න පුළුවන් දේ අපි කරමු කියලා. අපිට නිකං බොරුවට අඩිතාලමට කෝටි 10 ක් 15 ක් වියදම් කරලා නිකං තට්ටුවක් විතරක් හදලා තියෙනවට වැඩිය අපි තට්ටු දෙකක් හදනවා. එතුමාගේ දැක්ම නිවැරදියි. ලබුදූව වෙළඳ සංකීර්ණය ගත්තම අද වන විට එන ප්‍රධාන චෝදනාවක් තමයි උඩ තට්ටුවේ කඩ වලට වෙළඳාමක් නැහැ කියන එක. අද ඔහොම හරි පොඩි වෙළඳාමක් තියෙන්නේ ඔතනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය ආපු නිසා. ඉතිං ඒ ඇවිල්ලත් දැනට රුපියල් හාරදහස් පන්සියයක මාසික කුලියක් අපි අය කරන කොට චෝදනා ගොඩයි. ඉතිං ඒක හින්දා මමත් හිටපු මතය වෙනස් කරා. මමත් හිතන් හිටියේ තට්ටු තුන හතරක ගොඩනැගිල්ලක් හදන්න. අපි තට්ටු දෙකක අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් හදන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒක මේ පවතින තත්ත්වයත් එක්ක කරන්නේ. නැත්නම් බොරුවට මේ භාග ගොඩනැගිලි හදලා කාටවත් හදන්න තියලා යන්නේ නැහැ. අපි වැඩේ ඉවර කරලා තමයි යන්නේ අනිවාර්යයෙන්ම.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ අබේසේකර මන්ත්‍රීතුමා කිව්වා වගේ අර පී.ආර්.ඩී. පාරවල් සම්බන්ධව මටත් ඇත්තටම ප්‍රශ්නයක් තියෙනවා. හේතුව දැන් ගිංතොට ප්‍රදේශය ගත්තම වක්වැල්ල, ගිංතොට පාර ආර්.ඩී.ඒ. පාරක්. හැබැයි මම හිතනවා ඒක මාස තුන හතරකට පාරක් සුද්ධ කරනවා. ඒක කම්කරුවෝ දාලා සුද්ද කරනවා. නමුත් දැන් බලන්න උක්වත්ත පියදිගම පාර. ඒ පාරේ යන්න බැහැ. සුගත් මන්ත්‍රීතුමත් ඒක දන්නවා. අර ගිනිකුරුන්ද කන්ද හරියේ ලොකු වංගුවක් තියෙනවා. ඒ වංගුවේ කැලෑව වැවිලා. පාරෙන් කාලක් ඒ කැලෑවෙන් වැහිලා තියෙන්නේ. ඒක නිසා යන්න බැහැ. මේක පළාත් සභා පාරක්. පී.ආර්.ඩී. පාරක්. එතකොට පාර සුද්ධ පවිත්‍ර කරන්න ඕන. ඉතිං ඒක කරන්නේ නැහැ. එතකොට අබේසේකර මන්ත්‍රීතුමා කිව්වා වගේ එක්කෝ පාර සුද්ධ කරන එකට අපේ සභාවට ඒ අදාළ මුදල් එවලා අපි ඒක කරන්න වැඩපිළිවෙලක් හදමු. එහෙම නැත්නම් අපි ඒකට වැඩපිළිවෙලක් හදන්න ඕන. ඒ පී.ආර්.ඩී. පාරවල් වල යන්න බැහැ. ඒ පාරවල් ටික සුද්ධ කරන වැඩපිළිවෙලකට යන්න ඕන.

ඒ වගේම මේ අයවැය ලේඛනයේ දාලා තියෙනවා ආදායම් ප්‍රවර්ධන යෝජනාවල්. අයවැය ලේඛනය කියන්නේ ඉදිරි වර්ෂයේදී අපි වියදම් කරන්න බලාපොරොත්තු වෙන ඉලක්කයන්. මොකක්ද කරන්නේ කියන බලාපොරොත්තුව මේක. මේක ඉලක්කයක්. මේ ඉලක්කය කරගෙන යන්න පුළුවන්ද, බැරිද කියන එක ප්‍රශ්නයක්. එතකොට මේ අවුරුද්දේ කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය යන විදිය අනුව ඊළඟ අවුරුද්ද මොන වගේ තත්ත්වයක් උදා වේවිද කියලා කියන්න බැහැ. කොරෝනා වෛරසය ව්‍යාප්ත වෙන වේගය අනුව හෝ තුන්වෙනි රැල්ලක් ආවොත් තව ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. දැන් මේකෙ ආදායම් ප්‍රවර්ධන යෝජනා හැටියට දාලා තියෙනවා “ජංගම සේවා තුලින් හිඟ වරිපනම් සහ අනෙකුත් හිඟ ආදායම් අය කර ගැනීම සඳහා පියවර ගැනීමටත්, හිඟ ආදායම් ගෙවීම පැහැර හරින පුද්ගලයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් යෝජනා කරමි.” කියලා. ඉතිං මේක ඊළඟ අවුරුද්දට සාර්ථක වෙන්නේ නැහැ. හේතුව දැන් මිනිස්සුන්ගේ ව්‍යාපාර කටයුතු අඩපණ වෙලා තියෙන වෙලාවක් මේ. ව්‍යාපාර කටයුතු කර ගන්න බැරුව ඉන්න වෙලාවේදී මේ මිනිස්සු ඉතා අමාරුවෙන් ඉන්නේ. ඒ මිනිස්සු අමාරුවෙන් ඉන්න අවස්ථාවක අපිට බලෙන් ගිහිල්ලා ඒ මිනිස්සුන්ගෙන් හිඟ ආදායම් එකතු කරන්න බැහැ. ඒකට ජංගම සේවාවල් පවත්වලා හිඟ ආදායම එකතු කරන්න යන්නත් බැහැ. මොකද ඊළඟ අවුරුද්දෙදි ඒක අසාර්ථක වෙන්න පුළුවන්. ඒක නිසා අපි දැන් බලාපොරොත්තු වෙනවා මේක කරනවා කියලා. නමුත් අපිට මේක කරගන්න බැරි වෙන්න

පුළුවන්. ඒක නිසා එතනදී ඔබතුමන්ලා වියදම් කරන කොට පොඩ්ඩක් පරිස්සම් වෙන්න. අපි ඉල්ලීමක් කරනවා ඊළඟ අවුරුද්ද ගැන. අපි ගිය මාර්තුවල වැටිච්ච වැටිල්ල බලන්න. මගේ කොට්ඨාශයේ, ගිංතොට ප්‍රදේශයේ බහුල වශයෙන් රජයේ සේවකයෝ නැහැ. ඔක්කොම එදිනෙදා ජීවත් වෙන්න රැකියාවල් කරන මිනිස්සු ඉන්නේ. ව්‍යාපාරිකයෝ ඉන්නේ. මැණික් ව්‍යාපාරය කරන්නේ. සංචාරක ව්‍යාපාරයේ නියුක්තව ඉන්නේ. ඇත්තටම සංචාරක ව්‍යාපාරය, මැණික් ව්‍යාපාරය කඩා ගෙන වැටිලා තියෙන්නේ. දැන් මාර්තු මාසයේ ඉඳන් තවම ව්‍යාපාර කටයුතු සිදු වෙන්නේ නැහැ. චීනයට කොරෝනා ආව දවසේ ඉඳලා ආර්ථිකය කඩා වැටිලා තියෙන්නේ. ඒක නිසා මේ මිනිස්සු දැන් එදා වේල කන්නෙත් බොහොම අමාරුවෙන්. දැන් මැණික් ව්‍යාපාරය ඇත්තෙම නැහැ. ලෝකය පුරාම වහලා තියෙන කොට ආදායමක් ලබා ගත හැකි ව්‍යාපාරයක් කරන්න බැහැ. දැන් මම දන්න තරමින් අපේ පැත්තේ තරුණ කොටස් පුත්තලම පැත්තේ කුලී වැඩ කරන්න යනවා. හරි කණගාටුයි. හරි දුකයි. හොඳට මැණික් ගල් ඔපදාගෙන ඉඳපු කට්ටිය දැන් බදාම අනන්න පුත්තලම ප්‍රදේශයේ කොන්ත්‍රාත් වැඩ කරන්න යනවා. හේතුව ඒ මිනිස්සුන්ට කන්න බොන්න ඕන නිසා. වෙනත් ආදායම් මාර්ගයක් නැහැ. එදිනෙදා ආදායම් මාර්ග විදියට තිබුණේ මැණික් ව්‍යාපාර කටයුතු. දැන් ඒක නැහැ. ඒ ව්‍යාපාරය දැන් කඩන් වැටිලා. දැන් සංචාරකයෝ නැහැ. ඒක නිසා ඔබතුමන්ලා ඒක ගැන අවධානය යොමු කරන්න. ජංගම සේවාවල් කරලා බලකිරීම් සම්බන්ධව අවධානය යොමු කර වන්න. අනිත් එක තමයි ඊට අමතරව මේකෙ දාලා තියෙනවා සභා බලප්‍රදේශයටම වරිපනම් බදු පැනවීම මඟින් සභා ආදායම ඉහළ නැංවීමට යෝජනා කරමි කියලා. වරිපනම් බදු ඉහළ නංවන්නත් එපා. ඒ කියන්නේ අපි මේ අවුරුද්දට සහනයක් දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ මන්ත්‍රීතුමා වරිපනම් නැති ප්‍රදේශ වලින් අපෙන් ඉල්ලීම් කරනවා එයාලටත් වරිපනම් බදු ගෙවන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වරිපනම් බදු නැති ප්‍රදේශ වලට වරිපනම් අංක නැති වෙන්න පුළුවන්. ඒ වරිපනම් බදු අංක නැති ප්‍රදේශ වලට ඒක දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි වැඩ කරද්දි කොයි වෙලාවකවත් බලන්නේ නැහැ ඒ පැත්තට වරිපනම් තියෙනවද, නැද්ද කියලා. පොදුවේ අපි සභාවෙන් කරන වැඩ කොටස කරනවා. නමුත් ඔබතුමා දන්නවද, බෝපෙ පෝද්දල බල ප්‍රදේශයෙන් හතරෙන් එකකට විතර වරිපනම් නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක හරි. ඒක අනුමත කරනවා. ඒක හොඳයි. ඒ යෝජනාව හොඳයි. වරිපනම් දාන්න ඕන. වරිපනම් දාලා එකවර ඒ මිනිස්සුන්ට තද කරන්න එපා. මුදල් ගන්න තද කරන්න එපා. පොඩි සහනයක් දෙන්න. අනිත් එක මේකෙ දාලා තියෙන ආදායම් මාර්ග පිළිබඳව පැහැදිළි කිරීමක් නැහැ. දැන් මේකෙ දාලා තියෙනවා ආදාහනාගාරයක් ඉදිකිරීම මඟින් සෞඛ්‍ය සේවා ආදායම් ලබා ගැනීමට යෝජනා කරමි කියලා. එතකොට මේ ආදාහනාගාරය ඉදිකරන්න සම්පූර්ණයෙන්ම සූදානම් කරලා තියෙනවා. නමුත් අවුරුද්දකින් මේක සිදු කරන්න පුළුවන්ද, අපිට සාමාන්‍යයෙන් ආදාහනාගාරයක් හදලා ඉවර වුණාට පස්සෙනේ ඒකෙන් ආදායම එන්නේ. මේකෙ ආදායම් විදියට ඒක දාලා තියෙනවා. ඒකෙන් මම හිතන්නේ නැහැ ඊළඟ අවුරුද්දට අපිට ආදායමක් ගන්න පුළුවන් වේවි කියලා. හේතුව ආදාහනාගාරයක් හදලා ඉවර වෙන්න එපැයි. හදලා ඉවර වුණාට පස්සේනේ ඒකෙ පුච්චන්න ගෙනියන්න පුළුවන් වෙන්නේ. එතකොට මේකෙන් ආදායම ගන්න බලාපොරොත්තු වන්නේ ඊළඟ අවුරුද්දට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා නිවැරදියි. ඔබතුමාගේ සඳහන් කිරීම නිවැරදියි. නමුත් අපි බලාපොරොත්තු වන්නේ මන්ත්‍රීතුමා අයවැය කිවුවම අය, වැය දෙකම සමානව මේකෙ පෙන්වන්න ඕන. අපිට ආදායම් ලැබෙන සහ වියදම් වෙන ක්‍රම පෙන්වන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඔය සියළු දේ අයවැයට සඳහන් කරාට රජයේ ඉල්ලීම අනුව සහ පවතින තත්ත්වයන් තුළ ජනතාවට දෙන්න පුළුවන් සහනය දී ගෙන තමයි අපි යන්නේ. දැන් මේ වර්ෂයේදී අපි රුපියල් ලක්ෂ 40 ක සහනාධාර බෙදුවා පවුල් 8000 කට කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම නිසා ඇඳිරිනීතිය දාපු කාලයේ. නමුත් අපිට ඒ රුපියල් ලක්ෂ 40 ක මුදල වරිපනම් බදු විදියටවත්, මම හිතන්නේ ඇවිල්ලා නැහැ. ඒකයි කිවුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම ඒක සඳහන් කරේ මේකට විරුද්ධ වෙන්නවත්, වෙන මොහොකටවත් නෙමෙයි. කරුණු පැහැදිළි කිරීමක් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා නිවැරදියි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන කොට සාමාන්‍යයෙන් බලාපොරොත්තු වෙනවා ජනතාවගේ පැත්තෙනුත් බලලා. වෙළඳ සංකීර්ණයේ ප්‍රශ්නය ඒ වගේම එකක් තමයි. දැන් මේකෙ ආදාහනාගාර දෙකක් කියලා දාලා තියෙනවා. උසාවි දඩ එහෙම නම් ප්‍රශ්නයක් නැහැ. ඒවා අපිට ගෙන්වා ගන්න පුළුවන්. ඒවා ගන්න. මමත් ස්තුතිවන්ත වෙනවා රමේෂ් පතිරණ මැතිතුමාට ඒක අරන් දෙන එකට. අපිට වෙනදට සාමාන්‍යයෙන් අවුරුදු 04 කට විතර පස්සේ තමයි හම්බ වෙන්නේ. 2020 දී දඩ ගත්තට 2025 දී විතර තමයි ඒක හම්බවෙන්නේ. එහෙම තමයි යන්නේ. ඒවා දෙන්නේ නැහැ. ඒක පළාත් සභාව සතු කර ගෙන තමයි ඉන්නේ. නමුත් ඒක ගනිපු එක ලොකු දෙයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආණ්ඩුකාරතුමා මැදිහත්වුණ නිසා ඒක වුණේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඇත්තටම ඒවා අරගෙන ඒවායින් වැඩ කරන්න පුළුවන්නම් ඒක ලොකු දෙයක්. එතකොට මෙතන තව එකක් තියෙනවා කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම කියලා. ඔබතුමා කිවුවා මේකට ණයක් අරගෙන ඉදිකරනවා කියලා. මේක හොඳයි. ඒ ණයක් අරගෙන ඒකෙ බාගයක් හැදුවට පස්සේ අපිට පුළුවන් ගරු සභාපතිතුමනි, ඒක අතරමැදදී ටෙන්ඩර් කරන්න. ඒක ටෙන්ඩර් කරලා බදු දීලා තැන්පත් මුදලක් ගන්න පුළුවන් ඒ මිනිස්සුන්ගෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි බලාපොරොත්තු වෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම එකක් අපිට කරන්න පුළුවන්. ඉතිං ඒක නිසා ඒකත් හොඳ යෝජනාවක්. ඒ නිසා මේකෙ තවත් අඩුපාඩුකම් නම් මම දකින්නේ නැහැ. මේ සැරේ අයවැය ලේඛනයේ අපිට බලාපොරොත්තු වෙන්න බැහැ ඒ තරම් දුරට ආදායමක්. රජයෙන් තමයි යම්කිසි ආදායමක් බලාපොරොත්තු වෙන්න පුළුවන් වෙන්නේ. පළාත් සභාවෙන් හෝ වෙනත් ආදායම් බලාපොරොත්තු වෙන්න තමයි වෙන්නේ. එහෙම නැතුව ජනතාවගෙන් බදු ගන්න එකට ඔබතුමාලා තද කරන්න යන්න එපා. මොකද, ජනතාව පොඩ්ඩක් අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඒක නිසා මේ ගැන අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙනුත්, මාධ්‍යවේදී, මහත්ම මහත්මීන්ගෙනුත් අවසරයි.

දැන් ඔබතුමන්ලා මෙතනදී මේක මතුකරා. අපෙන් ලිඛිතව යෝජනා ඉල්ලුවා 2021 අයවැය සඳහා. හැබැයි මම යෝජනා තුනක් දුන්නා බෝපෙ පෝද්දල බලප්‍රදේශයටම බලපාන. බෝපෙ පෝද්දල සෑම මිනිසෙක්ටම දැවෙන ප්‍රශ්න වන යෝජනා තුනක් දුන්නා. නමුත් ඒක මේකට ඇතුළත් වෙලා නැහැ. ඉතිං ඒකට මම දන්නේ නැහැ මොකක්ද කියලා හේතුව. ඇතුළත් කරන්නේ නැත්නම් සාමාන්‍යයෙන් ඒක ඒ මන්ත්‍රීවරයාට දැනුවත් කරන්නත් ඕන. එහෙම දෙයක් නම් මේ වෙනතුරු සිද්ධ වුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සමිති වලින් දීපු යෝජනා විතරයි ඇතුළත් කරේ අයවැය ලේඛනයට. අනෙක් ඒවා මන්ත්‍රීවරු සභාවේදී යෝජනා විදියට ගෙනල්ලා ඒවා ක්‍රියාත්මක කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙමනම් ගරු සභාපතිතුමා, 2021 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා අයවැයට ඉදිරිපත් කරන්න කියලා අපෙන් යෝජනා ඉල්ලන්න අවශ්‍ය නැහැ. ලිඛිතව අපිට ලිපි එවුවා. ඉතිං මම දන්නේ නැහැ එක එක කාලෙට එක එක වෙලාවට තීන්දු තීරණ වෙනස් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදි මංමාවත් සහ ගොඩනැගිලි වලට අපි මුදල් වෙන් කරන්නේ ඒ මන්ත්‍රීවරුන්ගෙන් එන යෝජනා අනුව. ඒ මන්ත්‍රීවරුන්ගෙන් එන යෝජනා වලට ඇස්තමේන්තු හදලා තමයි මුදල් වෙන් කරන්නේ. ඉතිං එතනදී ඔබතුමන්ලා දෙන ඒවත් තියෙනවා. සභාවේදී තමයි සාකච්ඡා කරලා ඔබතුමන්ලාගේ යෝජනා ඇතුළත් කරන්න පුළුවන් වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** හොඳයි අපි පිළිගන්නම් කොහොමත් ඉතිං අපි උනන්දුවෙන් යෝජනා දෙන්නේ නැහැ. මේ තාක්කල් අපි පහුගිය අයවැය වලටත්, ඔබතුමන්ලාටත් සහය දක්වලා තියෙනවා. අනියමිනුත් දුන්නේ ඔබතුමන්ලට සහාය. ගියසැරේ අත උස්සලම සහාය දුන්නා. ඉතිං අපි දන්නවා ඕවා දැම්මත්, නැතත් අපිට වෙන් වෙන්නේ නැහැ කියලා. මේ අයවැය කෙටුම්පතක්, මේක ඇයවැය ලේඛනයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මේකෙදී මේ ගැන කියන්න ඕන. ඉදිරි වර්ෂයේදී, අද සම්මත වෙන අයවැයේදී මම මේක කොහොමත් කියනවා ඡන්දය ප්‍රකාශ කරන්න කලින්. මට පක්ෂව ඡන්දය දෙන සියලු දෙනාට යම් දෙයක් කරනවා අනිවාර්යයෙන්ම.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා ගිය අයවැයේදීත් ඕක කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පක්ෂ වෙන්න එපැයි ඉස්සෙල්ලා. පක්ෂ වෙලා සහයෝගය දෙන අයට අපි මන්ත්‍රී කණ්ඩායමත් එක්ක කතා කරලා යම් දෙයක් කරනවා. ඒක මම මේ වෙලාවේදී කියනවා. අපි මන්ත්‍රී කණ්ඩායමත් එක්ක කතා කරලා යම් සහනයක් දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් මට මගේ අදහස් ටික මතකත් නැහැ. මම එදත් කිව්වා ඔබතුමාට. අපේ අතින් වැරදි ප්‍රකාශ වෙන්න පුළුවන්. අපි ආධුනික මන්ත්‍රීවරු. දන්නේ නැහැනේ අපි. ඔබතුමා පොඩ්ඩක් කොලයක් තියාගෙන ඒවා සටහන් කර ගන්න. මගේ අදහස් ඔක්කොම අවුල් වුණා. මේ මන්ත්‍රීවරුන්ට තියෙන ගැටළුවක් මේක. ඔබතුමා පැහැදිළිව කිව්වා. ගිය අයවැය යෝජනාවලිය සම්මත වෙන වෙලාවේ කතාව අරගෙන බලන්න ඕන නම්. ඔබතුමාට අද වගේ මතක නැතුව ඇති ඒකයි ඔහොම කියන්නේ. අපි අත උස්සලා සහාය දුන්නා. ඔබතුමා කිව්වා අපිට ප්‍රතිපාදන දෙනවා කියලා. අද වෙනතුරු දුන්න දෙයක් කියන්නකෝ. නිකං බොරුවට සුරංගනා කතා කියන්න එපා සභාපතිතුමා මෙතනදී දුන්නොත් දෙනවා කියලා. අපි දෙනවා තමයි හැබැයි ඔබතුමා දුන්නේ නැහැ. ඔබතුමා ඒක කිව්වා මෙතනදී අනිවාර්යයෙන්ම උදවු කරන අයට දෙනවා කියලා. ඔබතුමන්ලාට මතක නැද්ද, හදවතට තට්ටු කරලා අහන්න. අපිට හාෆ්ෂීට් කොලයක් දුන්නද මේ වෙනතුරු. නිකං බොරුවට කියන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අයට දීලත් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් මේක ඔබතුමා වෙන පැත්තකට අරගෙන ගියා. මම මෙහෙම කතාවක් කරන්න නෙමෙයි හිටියේ. ඔබතුමා මේ සැරේ දාලා තියෙන යෝජනා හොඳයි. අපි ග්‍රාමීය පුරවැසියෝ විදියට මේ ආදාහනාගාරය ඉදිකරන සටනේදී මම පුරෝගාමියෙක් විදියට මේ ප්‍රදේශයේ කටයුතු කරා. මන්ත්‍රීවරයෙක් විදියට නෙමෙයි ගමේ පුරවැසියෙක් හැටියට සටන් කරා. මොල්ලිගොඩවත්තට ඒක ගේන්න කියලා මේ සභාවට ලියුම් එවලා තියෙනවා. අපේ ගාව ලිපිගොනු තියෙනවා. සභාවේ ලිපිගොනු තියෙනවද දන්නේ නැහැ. ගමේ ප්‍රදේශවාසීන්ගෙන් අත්සන් ගත්තා. මොකද ඒවගේ කැක්කුමක් වුවමනාවක් අපිට තියෙනවා. අපි මේක කඩාකප්පල් කරන්න නෙමෙයි කතා කරන්නේ. ඔබතුමන්ලාට ශක්තියක් ධෛර්යක් මානුෂිකව හරි දෙන්න අපි කතා කරනවා. ඔබතුමන්ලාගේ පැත්තෙන් මොකක්ද කරන්නේ. හැමදාම අපිට පළ නොකියා පලා බෙදනවා. ඉතිං මම කියන්නේ මේක අපි කාගේ හරි අපේක්ෂාවක් පමණයි. දැන් මේ පහුගිය අයවැය වාර්තා අරගෙන බැලුවත් ඒවාගේ සියල්ල ඉෂ්ඨ වෙලා නැහැනේ. ඉතිං මේකටත් බය වෙන්න ඕන නැහැ. දෙන්න පුළුවන් ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මේක කාගේ හරි අපේක්ෂාවක් පමණයි. මේකෙන් ඔය පාරක්, කැඩිච්ච බිඳිච්ච තැනක් හදන්න, ලයිට් එකක් දෙකක් දාවි. හැබැයි මතක තියා ගන්න මේ ලයිට් එකක් දාන එක, පාරක්, කාණුවක් හදන එක මේ සභාවට බදු මුදල් ගෙවන ජනතාවගේ වරිපනම් බදු වලින් කරන නඩත්තු කටයුතු. මන්ත්‍රීවරයා ගිහින් ඉන්නවා ලයිට් එක දාලා ඉවර වෙනකම් ගහ මුල. මහජන නියෝජිතයෝ විදියට ඒක අපි අනුමත කරන්නේ නැහැ. ඉතිං මම යෝජනා කරන්නේ ඔබතුමන්ලා දැන් මේ ගන්නා වූ උත්සාහයට සුභ පතන්න. දැන් අතන අර කතාවක් ගියා. මම මතුකරන්න හිටියා කරුණු කිහිපයක්. කියාස් මන්ත්‍රීතුමා ඒවා කතා කළ නිසා ඒක මම නැවත නැවත කියන්න යන්නේ නැහැ බදු සම්බන්ධව. අනිත් එක තමයි දැන් මේ අබේසේකර මන්ත්‍රීතුමා එක්කත් පොඩි විවාදයකට සම්බන්ධ වුණා මේ ආදාහනාගාරය බලප්‍රදේශයේ ඉදිකිරීම සම්බන්ධව. අපේ වෛද්‍ය රමේෂ් පතිරණ ගරු ඇමතිතුමා නායකත්වයේ ඉන්නවා. ඇත්තනේ එතුමාගේ ගෙදරනේ මේක. ගයන්ත කරුණාතිලක මැතිතුමා ඉන්නේ කොහෙද. රමේෂ් පතිරණ ඇමතිතුමා අනිවාර්යයෙන්ම ඒ ශක්තිය ධෛර්යය දීලා ඒක ඉෂ්ඨ කරන්න ඕන. එතුමාගේ ගෙදරනේ මේක. එතකොට අර ගයන්ත කරුණාතිලක මැතිතුමා නොකරපු වැඩේ නෙමෙයි අපි කියන්නේ. රමේෂ් පතිරණ ඇමතිතුමා මේකෙ පුරෝගාමියෙක් විදියට, අපිත් ආදරය කරන උගත් බුද්ධිමත් නායකයෙක් විදියට මේ කරන කටයුතු හොඳයි. මේ අපේ ගෙදර. අපේ ගෙදරට අපි ධෛර්යය දීලා එකතුවෙලා ඒක කරගන්න ඕන. අයවැයට නෙමෙයි, මම නැගිට්ටේ අපි දාපු යෝජනාවලිය මේකට ආවේ නැහැ. ඉල්ලීමක් කරපු නිසානේ අපි දුන්නේ. ඒක වුණේ නැති එක ඇහුවේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, මාධ්‍යවේදිනි, සියළුම නිලධාරිනි, සුභ උදෑසනක් වේවා ප්‍රථමයෙන්ම සියලුම දෙනාට. මම හිතන්නේ අයවැය ගැන සාකච්ඡා කිරීමට පළමුව මතක් කරන්න ඕන ඔබතුමා පළමුවෙන්ම මතක් කළ ලංකාවේ ශිෂ්‍යත්ව විභාගයෙන් පළමුවෙනියා ලෙස සමත් වුණ ඒ සංඝමිත්තා විද්‍යාලයේ දැරිය පිළිබඳව. විභාග අංකය 6025374 දරණ එස්.ඩී. සියති විතුම්සා කරුණාතිලක දියණියට මම හිතන්නේ ඔබතුමාගේ මෙන්ම මන්ත්‍රී මණ්ඩලයේ සුභාශිංෂන පිරිනැමුවා. අපි සියලු දෙනාගේම සුභාශිංෂන පිරිනමනවා. මොකද අපිට ආඩම්බරයි අපේ පළාතේ ළමයෙක් ඒ තත්ත්වයට පත්වීම පිළිබඳව සහ ලකුණු 200 න් 200 ම ලබා ගැනීම සම්බන්ධව. ඒ වගේම තව ළමයි 10 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් ඒ මට්ටමේ ඉන්නවා. දුෂ්කර පාසල් වශයෙන් ඇහැළියගොඩ ප්‍රාථමික විද්‍යාලයේ සෙනුකි දම්සරා දියණියත්, ඒ වගේම ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලයේ දෙවිඳු චිරන්දිත් පුතාත්, ඉංගිරිය සුමනජෝති විද්‍යාලයේ දෙව්ලි යසස්මි දියණියත්,

ෆර්හාන් මොහොමඩ් පුතා ඇතුළු ඒ සියලුම දෙනාට මම සුභපතනවා. ඒ ලකුණු 200 න් 200 ම ගනිපු ලංකාවේ ශිෂ්‍යත්වලාභීන්. ඒ වගේම මතක් කරන්න ඕන ශිෂ්‍යත්ව විභාගය අසමත් ළමයි මේ අවස්ථාවේ ඉන්නවා. අපි එයාලා ගැනත් සඳහන් නොකරොත් මම හිතනවා සභාවක් වශයෙන් ඒක වැරදියි. මොකද අද ලෝකයේ වුණත්, ලංකාවේ වුණත් රජයේ ඉහළ තනතුරු වල ඉන්න කථිකාචාර්යවරු, මහාචාර්යවරු, වෛද්‍යවරු ඒ වගේම වෙනත් රජයේ රැකියාවල නියුතු ගොඩක් දෙනා ශිෂ්‍යත්ව විභාගයෙන් අසමත් වුණාට අ.පො.ස. සා.පෙල, අ.පො.ස. උ.පෙල විභාගයන් සමත් වෙලා තියෙනවා. ඉතින් ශිෂ්‍යත්ව විභාගයෙන් විතරක් ළමයෙක්ගේ ජීවිතය තීරණය කරන්න බැහැ. ගොඩක් ළමයි මානසිකව කඩා වැටෙන්න හේතුවක් තමයි ශිෂ්‍යත්ව විභාගය. සමහර වෙලාවට බලාපොරොත්තු බිඳ ගන්නවා තමන් අසමත් කියලා අනිත් අය ලේබල් ගහනකොට. ඒ හින්දා ඒ සියළු දෙනාමවත් ධෛර්යමත් කරන්න ඕන මේ වෙලාවේදී සභාව වශයෙන්. ඒ සියළු දෙනාටමත් අපි සුභ පතන්න ඕන. මොකද එක විෂයකට ලකුණු 80 ගාණේ ගත්තත් මුළු ලකුණු 160 යි. ඒත් එයා අසමත්. ලකුණු 80 ක් ගන්නවා කියන්නේ ගොඩක් ඉහළ තලයක ඒ ළමයාගේ දක්ෂතාවය තියෙනවා. අපි ඒකත් අගය කරන්න ඕන මේ අවස්ථාවේදී. මොකද අපිට ශිෂ්‍යත්ව විභාගයෙන් විතරක් ළමයෙක් මනින්න බැහැ කියන කාරණාව මතක් කරනවා. මොකද ඔවුන් අර ගොල්ලන්ව අභිබවා ඉදිරියට යන පුරවැසියන් බවට පත් වෙන්න පුළුවන්. මහාචාර්යවරුන්, කථිකාචාර්යවරුන් බවට ඔවුන් පත්වෙන්න පුළුවන්. ඒ සියලු දෙනාටමත්, මම මේ අවස්ථාවේදී සුභ පතනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න ඕන අයවැය ගැන. බොහොම හොඳ යෝජනා ටිකක් ගෙනත් තිබුණා. ඒකට මන්ත්‍රීවරු වශයෙන් සන්තෝෂ වෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අපේ උප සභාපතිතුමාගේ දියණියත් විශිෂ්ඨ අන්දමින් සමත් වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම හිතන්නේ මතක් කරන්න ඕන මේ අවස්ථාවේදී මට අමතක වෙච්ච කාරණයක් තියෙනවා. අපේ උප සභාපතිතුමාගේ දියණියත් විශිෂ්ඨ අන්දමින් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වෙලා තියෙනවා. අපේ මන්ත්‍රීවරුන්ගේ සහ මන්ත්‍රීවරියන්ගේ මෙන්ම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සියළු දෙනාගේම සුභාශිංෂන මේ අවස්ථාවේදී මම යොමු කරනවා අපේ උප සභාපතිතුමාගේ දියණියටත්. මොකද ඒක නැත්නම් අපෙන් වෙච්ච අඩුපාඩුවක් වෙනවා. අපි සියළු දෙනාගේම, සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගේම සුභාශිංෂන ගරු උප සභාපතිතුමාගේ ඒ දියණිය වෙනුවෙන් අපි පිරිනමනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලකුණු 187 ක් අරගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගොඩක් හොඳ ලකුණු මට්ටම් තියෙන ළමයි ඉන්නවා ඇත්තටම ලකුණු 200 න් 200 ම ගන්න බැරි වුණාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පුතත් ලකුණු 182 ක් ගත්තා. දෙන්නම සිරිධම්ම විද්‍යාලයේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අපි ඒ දක්ෂතාවයන් විශේෂයෙන්ම අගය කරනවා. උප සභාපතිතුමනි, අප සියළු දෙනාගේම සුභ පැතුම් මේ වෙලාවේදී පිළිගන්න.

ඒ වගේම මතක් කරන්න ඕන ගරු සභාපතිතුමනි, ඔබතුමා කිවුවා අයවැය කතාවේදී කාපට් පාරවල් දැම්මට වැඩක් නැහැ කාණු පද්ධතියක් නැත්නම් කියලා. ඒ කරුණ මම සනාථ කරනවා. බෝගහවේල්ලේ සිට දිවෙන මාර්ගය පහුගිය දවස්වල කාපට් කරා. මම දකිනවා මේ අවස්ථාව වන විට ඒකෙ කාණු පද්ධතිය සකස් කරන්න නොහැකි වීම නිසා බොහෝ රථ වාහන අනතුරු සිදු වෙනවා. වේගයෙන් එන මෝටර් බයිසිකල් සහ වාහන වලට අර වංගුවේදී සමහර වෙලාවට තණකොළ වැවීම නිසා සහ ගස් වැවීම නිසා පාර පේන්නේ නැහැ. ඒ නිසා සමහර වෙලාවට අයින් කරන්න ගියාම වැටෙන්නේ කාණුවට. වාහන ඇල වෙනවා. ගොඩක් අනතුරු සිදු වුණා පහුගිය දවස්වල. ඉතිං ගොඩක් ඒවා සුභදව බේරගෙන ගියා. සමහර ඒවා රණ්ඩු වලින්ම කෙලවර වුණා. ඒක හින්දා මම කියන්නේ කාණු පද්ධතියත් සකස් කරමින් අපි සභාවක් වශයෙන් ඒ දේවල් සමඟ සංවර්ධනය කර ගෙන යා යුතුයි. ඊළඟට පාරක් කාපට් කරන කොට අඩි 02 ක ප්‍රමාණයක් මාර්ග සංවර්ධන අධිකාරියේ නීති අනුව දෙපැත්තෙන්ම පස් පුරවනවා අනතුරු සිදුවීම වැළැක්වීමට. මෙතනදී අඩි දෙකක් පස් පිරෙව්වොත් වෙන්නේ අර ඔක්කොම පස් ටික වැටෙන්නේ කාණුවට. ඒ කාණුව ගොඩ වෙනවා. ඉතිං ඒක හින්දා එතනත් ලොකු ගැටළුවක් තියෙනවා. මම හිතන්නේ බෝගහවේල්ල පාරේ පස් පුරවලා ඒ අඩි දෙක සකස් කරලා නැහැ. මොකද එතන පස් පිරෙව්වොත් කෙලින්ම කාණුවට තමයි වැටෙන්නේ. ඒක හින්දා ඒ කාණු පද්ධතිය නිසියාකාරව සකස් කරලා දෙන මෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම හිතන්නේ වසර ගණනාවක් තිස්සේ මම යෝජනාවක් කරා. ලියනගේ මන්ත්‍රීතුමත්, ඒ යෝජනාවම කරා කාලයක් තිස්සේ. ඒක අර ගොඩකන්ද, බෝගහවේල්ල වැරැල්ලාන වත්තේ කාණු පද්ධතිය

සකස් කරලා දෙන්න කියලා. මම හිතන්නේ අද වෙනකම් ඒක ඉෂ්ඨ වුණේ නැහැ. ඒ ගැනත් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර වන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ ප්‍රියන්ත මන්ත්‍රීතුමා මේක මතක් කරා. මම හිතන්නේ අපි අයවැයේදී බොහොම සහයෝගයක් ලබා දුන්නා සභාවක් වශයෙන් ඔබතුමන්ලාගේ කාර්යභාරයට. නමුත් අද වෙනකම් මම හිතන්නේ අපිට ලයිට් එකක්වත්, කිසිම දෙයක්වත් ලැබිලා නැහැ. ඉතිං අපි පෞද්ගලික යහපතට නෙමෙයි ඉල්ලන්නේ. මිනිස්සුන්ගේ සුභසාධනය පිණිස ඉල්ලන්නේ. ඒ නිසා ඒවා හොයලා බලලා, අඩුපාඩු බලලා ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඔබතුමා ඇතුළු සියලු දෙනාටම සුභ ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙමයි මන්ත්‍රීතුමා. අඩුපාඩුවක් වුණා. ඒක මම පිළිගන්නවා. ඉදිරියේදී කොට්ඨාශයේ මන්ත්‍රීවරයා එක්කත් සාකච්ඡා කරලා කරනවා. ඒකෙදි ඔබතුමන්ලා දන්නවා තියෙන වාතාවරණය පිළිබඳව. ඒක අමුතුවෙන් සඳහන් කරන්න අවශ්‍ය නැහැ. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා එක්ක සාකච්ඡා කරලා ඒ සාධාරණය අන්තිම වර්ෂය හින්දා මම කරනවා. ඒක බොහොම පැහැදිළියි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කොට්ඨාශයේ මන්ත්‍රීවරයා එක්ක මගේ කිසිම ගැටුමක් නැහැ. එතුමත් ඒ යෝජනාව කරලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඒක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක කඩිනමින් ක්‍රියාත්මක කරලා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමා සම්බන්ධව විතරක් නෙමෙයි, අපි හිතමු අනිත් මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා එක්ක සාකච්ඡා කරලා ඒ වැඩේ ඉදිරියට කරමු.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි.

ගරු සභාපතිතුමනි, ඔබතුමා 2021 අයවැය ඉදිරිපත් කරලා තියෙනවා. ඒ අවස්ථාවේදී මම වචන දෙකක් කතා කරන්න අවස්ථාව ගත්තේ. ප්‍රථමයෙන්ම මම කියන්න ඕන දෙයක් තියෙනවා. පෞද්ගලික ආරෝග්‍යශාලා වලින් අය කිරීම් කරන්න ක්‍රමයක් කියලා නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වෙළඳ බලපත්‍රයක් විදියට යන්නේ. එතන අඩුපාඩුවක් තියෙනවා. නමුත් පනතේ ඊට වැඩිය ක්‍රමවේදයක් නැහැ. ඒකේදී ඔබතුමා කියන එක හරි. කෝටි ගණන් හොයනවා ඉතිං.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** දැනට අපේ කොට්ඨාශයේ තියෙන ලොකුම රෝහල තමයි රුහුණු රෝහල.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඒක බැරිද අතුරු ව්‍යවස්ථාවක් විදියට සකස් කරලා යන්න. ඔබතුමා කියන දේ මට පැහැදිළියි. ඒකටම කීපපාරක් කියලත් තියෙනවා. වැඩක් නැහැ කතා කරලා. අපි ඒවායේ කසළ එකතු කිරීමේදී නම් අය කරනවා. කොහොමත් මුදල් අය කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එක රෝගියෙක් චැනල් කරහම රුපියල් හයසීයක මුදලක් අය කරනවා රෝහලට වෙනම, වෛද්‍යවරුන්ට අමතරව. අපිට අඩු ගාණේ එක රුපියල් දහයක්වත් ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට සමූපාකාර රෝහලත් අයිති වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒක තමයි කිවුවේ. උදාහරණයකට කිවුවේ ලොකු එකක්. මේ රෝහලට තට්ටු හයක විතර ගොඩනැගිල්ලක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම හොඳයි ඒ යෝජනාව.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** මහජනතාවගෙන් ගන්නවා වැඩියි. අපි ඒ තැන් වලින් ලබාගන්නවා නම් මහජනතාවට සේවයක් කරන්න පුළුවන්. මම වාචිකව ඔබතුමාට ඒක ඉදිරිපත් කෙරුවේ. මම හිතන්නේ ලොකු මුදලක් අය වෙන්නේ නැහැ රුහුණු රෝහලෙන්. එක චැනල් එකකින් රෝහල් ගාස්තු විදියට රුපියල් හයසීයක් ගන්නවා. රෝහල් ගාස්තු විතරක් රුපියල් හයසීයක් ගන්නවා එක රෝගියෙකුගෙන්. දවසකට කී දෙනෙක් එනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ලොකු ආදායමක් ගන්න පුළුවන් තැනක් ඒක.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** දැන් ඒක තියෙනවා, සමූපාකාර රෝහලත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි වැඩි කරත්, රෝගීන්ගෙන් ගන්න ප්‍රමාණය වැඩි කරාවි. ඒ ගොල්ලෝ ඒ පැත්තෙන් අය කරාවි. නමුත් ඉතිං අපිත් ආදායමක් ගන්න එපැයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අපිට ආදායමක් ගන්න තියෙන ලොකුම එක මේක. ඒක ගන්නේ නැතුව අපි මහජනතාවගේ බදු වලින් කරන්න නෙමෙයි බලන්න ඕන. ඒවායෙන් අපි කරන්න බලන්න ඕන ඇහැක්දුරට.

ගරු සභාපතිතුමනි, ඔබතුමා කිවුවා වගේ ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ලෙස ළමයින් සමත් වීම පිළිබඳව අපිටත් සන්තෝෂයි. ඇත්ත වශයෙන්ම ඒකට ප්‍රධාන හේතුව වුණේ අපේ පහුගිය රජයේ ඉඳපු අධ්‍යාපන ඇමතිතුමා කරපු ලොකුම දේ. අපිටත් ඒක ලොකු පාඩුවක් වුණා. හේතුව ප්‍රධාන පාසල් වල ඉඳපු ගුරුවරු, අවුරුදු විසි ගණන් ඉඳපු ගුරුවරු ප්‍රාථමික පාසල් වලට දැම්මා. ඒක තමයි මේ සැරේ ප්‍රාථමික පාසල් වලින් ළමයි වැඩිපුර සමත් වුණේ. ඒ සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා හිටපු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමාට. එතුමා කරපු ඒ දෙයින් අපිටත් ප්‍රශ්න ඇති වුණා. විශ්‍රාම යන්න අවුරුදු දෙකක් තිබුණ ගුරුවරුත් මාරු කෙරුවා. මාරු කරලා පොඩි ඉස්කෝල වලට දැම්මා. ඒකෙන් තමයි මේක බිහිවුණේ. ඒ නිසා අපි එතුමාට ඒ ස්තුතිය පුද කරනවා. ඒ වගේම අපේ උප සභාපතිතුමාගේ දුවටත් සුභ පතනවා මේ අවස්ථාවේදී.

ගරු සභාපතිතුමනි, අපි ඇත්ත වශයෙන්ම අයවැයට සහාය දෙන්නේ කොහොමද, මම ගිය සභා වාරයේදී යෝජනා දෙකක් දැම්මා පාරවල් දෙකක් සුද්ධ කරන්න. සත පහක්වත් ඒකට වැය වන්නේ නැහැ. කම්කරුවෝ ටික දාන්න විතරයි තියෙන්නේ. අදටත් ඒක කරේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඇත්තටම යෝජනා දාන්න දෙයක් නැහැ. ඔබතුමා මට කතා කරලා කිවුවානම් මෙන්න මේ පාර කියලා. මම ඒක කරලා දෙනවා. හැබැයි කතා කරපුවා කරලා ඇති. යෝජනා දාන්න දෙයක් නැහැ පාරවල් සුද්ධ කරන එක සම්බන්ධව.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ලොකු දෙයක් නෙමෙයි ඒක. මිනිස්සුන්ගේ ඉල්ලීම නිසා ඒක දැම්මේ. මහජන නියෝජිතයෝ වශයෙන් අපිට එහෙම දෙයක්වත් කරන්න බැරිනම් අපි මොකටද, ඇත්ත වශයෙන්ම මේවායේ ඉන්නේ. මම මේ ඇවිත් ගන්න දීමනාවක් ණයක්. අපි මහජන නියෝජිතයෝ වශයෙන් ගන්න දීමනාවත් ණයක්. අපිත් ආවේ සේවයක් කරන්න. ඇත්ත වශයෙන්ම ලේකම්තුමා දන්නවා මම ලයිට් ටික අතේ සල්ලි වලින් ගෙනත් දුන්නේ. අපිට ආශාව තිබුණේ ඒක. ඒ කාරණය මෙතෙක් අපිට ඉෂ්ඨ කර ගන්න බැරි වුණා. මේ අවුරුදු තුනක් ගියා. යම්තම් විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාගෙන් ලයිට් වලට ලක්ෂ දෙකක, දෙකහමාරක ප්‍රතිපාදන අරගෙන ලයිට් ටික ගෙනල්ලා දැම්මා. ඒක තමයි ලොකුවට කෙරුනේ දේකට. ඉතිං එහෙම දෙයක්වත් කරන්න බැරිනම් කොහොමද අපි අයවැයට සහාය දෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට ඒකවත් නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අයවැයට අපේ විරෝධතාවයක් නැහැ. ඒ කිවුවේ මේකට විරෝධතාවයක් නැහැ. අපි විපක්ෂය වශවෙන් පූර්ණ සහය දෙන්න බලාපොරොත්තු වෙනවා කියමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ඒ වගේම සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ඇතුළු ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගෙන්ද මේ වෙලාවේ මේ සභාවට සම්බන්ධ වෙලා ඉන්න මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ගෙනුත් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි මැතිවරණයකින් පස්සේ මේ සභාව නියෝජනය කරලා ඉදිරිපත් කරන අයවැය මේක. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් ඉදිරිපත් කරනු ලබන තුන්වෙනි අයවැය සාකච්ඡාව මේක. එතකොට අපිට මතකයි ඊට කලින් 2018 වර්ෂයේදී අපි එන වෙලාවේ අයවැයක් ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය විසින් සකස් කරලා තිබුණා. ඒ අනුව තමයි අපි ක්‍රියාත්මක වුණේ මුල් අවස්ථාවේදී. ඊට පස්සේ අපි සාකච්ඡා කරන කොට මුලින්ම මතු කරලා ගත්තා ඔබතුමන්ලාට මතකත් නැතුව ඇති. ඒවා මෙහි පහුගිය වාර්තා සියල්ලේම සාකච්ඡා වෙලා තියෙනවා. අපි නිතරම අයවැය කෙටුම්පත සම්මත කරන්නේ. මූලිකවම ප්‍රතිපත්තිමය කාරණය වන්නේ පනතේ කොහෙවත් නැහැ අයවැය කෙටුම්පතක් ඉදිරිපත් කරන්න කියලා. අයවැය ලේඛනය සහා සම්මත කරන්න කියලා තියෙන්නේ. මම ඒක හැම අයවැය සභාවකදීම මතු කරා. ඔබතුමා එකඟ වුණා. හැබැයි දැන් ගියවාරයේදී ඔබතුමා අයවැය වාර්තාවක් පසුව ඉදිරිපත් කරා. ඊට පස්සේ අයවැය ලේඛනයක් ඉදිරිපත් කරා. නමුත් පනතේ පැහැදිළිවම තියෙනවා 114 පිටුවේ 168 වගන්තිය යටතේ අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කරලා සභා සම්මත කරන්න කියලා. මම හිතනවා පනතේ තියෙන වගන්තිය ප්‍රකාරව නෙමෙයි මේක ඉදිරිපත් වන්නේ. මෙතන පොඩි පරස්පරතාවයක් තියෙනවා. එහෙමනම් අයවැය ලේඛනය කියලා සම්මත කරන්න ඕන. අයවැය කෙටුම්පත සාකච්ඡාවට ගන්න පුළුවන්. මම හිතන්නේ අපි මෙවර තමයි විශේෂ සභාවක් කැඳවන්නේ නැතුව මහා සභා වාරයේදීම මේ අයවැය සාකච්ඡා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයවැය ලේඛනය වෙන්නේ සම්මත කරාට පස්සේ අයවැය කෙටුම්පතක් තමයි ඉදිරිපත් කරන්නේ. සම්මත වුණාට පස්සේ තමයි අයවැය ලේඛනය වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාගේ අදහස ඒක වෙන්න පුළුවන්. පනතේ මෙහෙම සඳහන් වෙනවා.

" සෑම ප්‍රාදේශීය සභාවකම සභාපතිවරයා විසින් එක් එක් වර්ෂයකදී රීති වලින් නියම කරනු ලැබ ඇති දිනයකදී හෝ ඊට පෙර සභා රීති වල දක්වා ඇති ආකෘතිය අනුව, ඊළඟ වර්ෂය සඳහා අයවැය ලේඛනයක් ඒ ඉදිරි වර්ෂයේදී ලබා ගත හැකි ආදායම සහ යෝජිත වියදම පිළිබඳ විස්තර ඇතුලත්ව පිළියෙල කොට ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. "

එතකොට සභා පනතේ බොහොම පැහැදිළිව 168 වගන්තියේ පළවෙනි පරිච්ඡේදයේ තියෙනවා සභාවට අයවැය ලේඛනයයි ඉදිරිපත් කරන්න ඕන කියලා. දැන් මේ හැම වතාවකම කෙටුම්පත සභා සම්මත කරන්න ඔබතුමා ඉදිරිපත් කරා. ඒක නීතිමය වශයෙන් පනත අනුව නිවැරදි නැහැ. ඔබතුමා ලේඛනයක් ඉදිරිපත් කරා අවසාන එකේදී. ඒක තර්ක කරලා බොහොම ගැටුම් සහගත තත්ත්වයක් ඇති වෙලා අපිට පස්සේ ඉදිරිපත් කරනවා කියලා ඒක ඉදිරිපත් කරා. අයවැය ලේඛනයයි අපි සභා සම්මත කර ගන්න ඕන. මෙතන යම් තාක්ෂණික ප්‍රශ්නයක් තියෙනවා. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඔබතුමාව දැනුවත් කරලා ඇති. ලිපියක් එවලා තියෙනවා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන්. ලේකම්තුමාගෙන් ඒක ගැන විමසලා දැන ගන්න. මම ඕන නම් ඒකෙ පිටපතක් ඔබතුමාට ඉදිරිපත් කරන්නම් ඊට පස්සේ. ඒ නිසා මේ වගන්තිය ප්‍රකාරවම මේ අයවැය ලේඛනයේ තාක්ෂණික ගැටළුවක් තියෙනවා. මේක සම්මත කිරීමේදී අපිට එහෙම ගැටළුවක් තියෙනවා. ඒක තමයි අපි දිගටම කතා කරෙත් ඔබතුමාට. පළවෙනි කාරණය ඒක. ඒ අදහස ඔබතුමා සැලකිල්ලට ගනීවි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, රටේ පවතින මේ අර්බුධකාරි තත්ත්වය තුළ මේ අවස්ථාවේ ඉදිරි වර්ෂයට ආදායම් සහ වියදම් ඉලක්ක සම්බන්ධයෙන් අපිට සෑහෙන සංකීර්ණ තත්ත්වයක් තියෙන්න පුළුවන්. මොකද මේ තියෙන තත්ත්වය අපි කාටවත් සුභදායි නොවන, ඉදිරිය ගැන පැහැදිළි නැති තත්ත්වයක් තියෙන්නේ. මේක ජාත්‍යන්තරයටත් බලපානවා. විශේෂයෙන්ම අපේ රටටත් බලපානවා. ඒ නිසා මේ උත්සාහය සම්බන්ධව අපි සාකච්ඡා කරලා මේ සභාවේ ගෞරවය රැකෙන පරිදි සභාවේ ඉදිරි පියවරයන් නිවැරදිව ගන්න පුළුවන් විදියට අයවැයට අපි ප්‍රවේශ වෙන්න ඕන කියන අදහස අපේ හිතේ විශේෂයෙන්ම තියෙනවා. ඒ හින්දා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද මේ පවතින කොරෝනා වසංගත තත්ත්වයෙන් මේ රට මුදවා ගන්න එක අපි කාගේත් පොදු වගකීමක්. ඒක පක්ෂ විපක්ෂ දේශපාලනය මත හෝ මොනයම් හේතුවක් මත හෝ අදහන ආගම මත හෝ කිසිම එකක් ඇතුලේ තීරණය වෙන එකක් නෙමෙයි. ඒ නිසා විශේෂයෙන්ම අපි අපේ බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධව පනතෙන් සභාවට පැවරිච්ච බලතල ප්‍රකාරව අපිට දැඩි වගකීමක් තියෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසාම මම හිතනවා ඔබතුමා මෙවර අයවැය ලේඛනයෙන් ප්‍රමුඛස්ථානය දෙන්න තිබුණා සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉතාමත් දැඩි අවධානයක් යොමු කරලා. ඒක මම හිතන්නේ මූලික කාරණයක්. අපි අයවැය සාකච්ඡාවේදී මේක මතු කර ගන්න ඕන. ඇත්තටම අපි ඒකට අවශ්‍ය ප්‍රමාණයෙන්, සැලකිය යුතු ප්‍රමාණයෙන් ඒ අවධානය යොමු කරලා තියෙනවාද කියලා බලන්න ඕන.

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය යටතේ ඉස්සරහදී කොරෝනා වෛරසය සමාජගත වෙන්න තියෙන ඉඩ කඩ වැඩියි. බලප්‍රදේශය තුල ඒ හැකියාව අවම කරන විදියට මේ ප්‍රදේශයේ සෞඛ්‍ය කළමනාකරණය කරන්න පුළුවන් ආයතනය හැටියට, පනතින් බලය පැවරිච්ච ආයතනය හැටියට, ඔබතුමාට තියෙන වගකීම සම්බන්ධව දැඩිව අවධානය යොමු කරමින් මේ අයවැය ඉස්සරහට සාකච්ඡා කරලා ඕකට යම් ප්‍රමාණයකින් තීන්දු තීරණ ගන්න පෙළඹෙමු කියන යෝජනාව මම මුලින්ම මේ අයවැයේදී කරනවා. මම මතුකරේ ප්‍රතිපත්තිමය කාරණා. නමුත් මම මේ අයවැය සම්බන්ධව ප්‍රතිවිරෝධයක් හදන්නේ නැහැ. මේක ඉදිරිපත් කරලා සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් ඔබතුමා අරක සැලකිල්ලට ලක් කරන්න. පනතේ තියෙන්නේ බොහොම පැහැදිළිව අයවැය ලේඛනයක් කියලා. ඒ නිසා අපි මේක සම්මත කිරීම නීත්‍යානුකූලද, නැද්ද කියලා බලන්න.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ඊළඟට මේ කොරෝනා තත්ත්වයෙන් රට මුදවා ගත හැකි සෑම අයුරින්ම, විශේෂයෙන්ම රජය විසින් ගෙනියන වැඩපිළිවෙල සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යෙදවුණු නිලධාරීන් සහ සේවකයන් ඇතුළු සියලුම දෙනා කරන මැදිහත්වීමට අපි අපේ ගෞරවය ප්‍රකාශ කරනවා. ඒ වගේම අපිත් පක්ෂයක් හැටියට කලින් කොරෝනා වසංගතය ආපු වෙලාවේදී, පළමු රැල්ල ආපු වෙලාවේදී සහ ඊට පස්සේ දිගින් දිගටම මේ තත්ත්වයන් තුළ අපේ මැදිහත්වීම උපරිම ආකාරයෙන් කරනවා. ඒ වගේම තමයි සභාව තුළ මේ කරනු ලබන පොදු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් එවැනි කාර්යයකදී අපි අපේ දායකත්වය, අනුග්‍රහය ඒ සියල්ල නොඅඩුව ඔබතුමාට ලබා දෙන්න කටයුතු කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම කියනවා රටට මේ වසන්ගතයෙන් ඉක්මනින් මිදෙන්න ඉඩකඩ ලැබෙන ක්‍රමවේදය ක්‍රියාවට නගන්න හැකියාව ලැබේවා කියලා. ඊළඟට ගරු සභාපතිතුමනි, මුලින්ම මේ අයවැය සාකච්ඡාවට කලින් අපි අර කතා කරා රටේ මේ වෙලාවේදී ආපු ශිෂ්‍යත්ව ප්‍රතිඵල වල තත්ත්වය ගැන. පොදුවේ අපි සියළු දෙනාගේම ස්තුතිය, ගෞරවය වගේම ඒ සුභ පැතුම් ඒකට එක්කරනවා ගරු උප සභාපතිතුමාගේ දියණිය ඇතුළු ඒ සියලුම දරුවන්ට. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 169 ක් කඩඉම් ලකුණු වීම බරපතල කාරණයක්. මේක සමස්ථ සමාජය ඇතුළෙම තමන් අසමත් කියන මානසිකත්වය හදන එකක් බවට මේක පත් වෙනවා ඒ මට්ටමට ළඟා වෙන්න බැරි එක. ඒක බරපතල බේදවාචකයක්. අවුරුදු 10 ක වගේ කුඩා දරුවෙකුට මේ මානසිකත්වය ඉතාමත් බරපතලයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මගේ මතය නම් ජාතික පාසල් වලට ශිෂ්‍යත්ව විභාගය තියන්න නරකයි. මොකටද තියන්නේ. ඒ තිබීම තුල තමයි පහළ තරඟයක් නිර්මාණය කරලා තියෙන්නේ. දැන් ජාතික පාසල්වල ඉන්න ළමයි බලන්නේ කොළඹ විශාඛා, රාජකීය වැනි විද්‍යාල වලට යන්න. ඒක නිසා තමයි ලකුණු මට්ටම ඉහළ ගිහිල්ලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව සාකච්ඡාවක් මේ සමාජය ඇතුලේ, රට ඇතුළේ සාකච්ඡා වුණා. එක කාලයකදී යෝජනා වුණා ජාතික පාසල් වල තියෙන මේ තරඟය අවම කරන්න සියළු ජාතික පාසල් හයේ පන්තියෙන් ඉහළට තියන්න. එතකොට පහළ ඉඩකඩ ඇහිරෙනවා. පහළ තරඟයක් ඇති වන්නේ නැහැ එක වසරට ඇතුළත් කරන්න. ඊට පස්සේ ආශ්‍රිත පාසල්, පොකුරු පාසල් කිහිපයක් හදලා ඒ සියලු දරුවන් එතනට යොමු කරවන්න ඕන. ඒකට එහෙම ක්‍රමවේදයක් තියෙන්න ඕන. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒකට ප්‍රධාන පාසල් එකඟ වුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒක තමයි ප්‍රධාන හේතුව වුණේ. එවැනි සාධනීය ක්‍රියාමාර්ග තියෙන්න පුළුවන්. මේවා තවදුරටත් සාකච්ඡා කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් අපි සභාවක් හැටියට සාකච්ඡා කරන්න ඕන. මේක අපේ මට්ටමේ ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. ප්‍රතිපත්තිමය තීරණයක් නොවෙන්න පුළුවන්. නමුත් අපේ මට්ටමේ සාකච්ඡා වලදී ඒ යෝජනා හා අදහස් අපි ඉහළට යවනවා නම් ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ සමහර වෙලාවට වෙනස් වෙන්න පුළුවන්කම තියෙනවා. මට මතකයි ඔබතුමාට මම අධ්‍යාපනය සම්බන්ධයෙන් යෝජනාවක් කරා. ඔබතුමා ඒකට ලිපියක් යොමු කරා අධ්‍යාපන අමාත්‍යාංශයට. මටත් ඒකෙ පිටපතක් දුන්නා. ඒක සභාවේ යෝජනාවක් විදියට ඇතුළත් කරේ නැහැ ඔබතුමා. නමුත් අද වෙන කොට විද්‍යුත් නාලිකා මඟින් ඒක කරනවා. මම යෝජනා කරේ විද්‍යුත් නාලිකා කිහිපයක් පාවිච්චි කරන්න. මොකද මේ අර්බුධය හමුවේ ඉස්සරහට එන අධ්‍යාපන ප්‍රශ්නයට උත්තරයක් හැටියට ගන්න පුළුවන් එක ක්‍රියාමාර්ගයක් මේක. ඔබතුමා අඩුම තරමේ මේක යොමු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා ඒක යොමු කරලා මට පිටපත එවලා තිබුණා. එවැනි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන එක හොඳයි. අපි සභාවක් හැටියට වුණත් සාකච්ඡා කරන එක හොඳයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඊළඟට මේ ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධයෙන් ගත්තම ඇත්තටම ලකුණු 100 හෝ 70 ක් හෝ ගනිපු සියලු දෙනාම සමත් කියන ආකල්පයෙන් ප්‍රතිඵල සටහනේ දකින්න ලැබෙනවා නම් සතුටුයි. ඊළඟට පාසලක් ලබා දීමේ ක්‍රමවේදයට වෙනම පියවරක් සකස් කළ හැකියි. ඊළඟට පාසල් කඩඉම් ලකුණු වෙනම දෙන්න ඕන. දැන් පාසල් කඩඉම් ලකුණු තමයි මූලික කරගෙන තියෙන්නේ. ඒ නිසා ළමයින්ව ලොකු අසහනයකට පත් වෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ සභාව හැටියට හෝ සාකච්ඡා කරලා යෝජනා කරනවා නම් ඒක වැදගත් වේවි. ඒ අනුව ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වෙලා සමත් අසමත් සියලු දෙනාටම ඉදිරියේදී තමන්ගේ අනාගතය සර්වප්‍රකාරයෙන් සාර්ථක වෙන්න ශක්තිය, ධෛර්ය හා අධිෂ්ඨානය ලැබෙන්න කියලා අපි සභාවක් හැටියට සහ අපේ දේශපාලන ව්‍යාපාරය හැටියට අපේ සුභපැතුම් එකතු කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව පහුගිය අයවැයට, අපි ආපු අලුත මට මතකයි මේ සභාව ආපු මුල්ම සභා වාරයේදී ආදාහනාගාරය සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරා. ඒ ඉදිරිපත් කළ යෝජනාවේ ස්ථානය සම්බන්ධව සමස්ථ සභාවේම එකඟතාවය නැති වුණත් අපි ඒ යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවයක් තිබුණා සියළු දෙනාටම. ඒ නිසා ඒකමතිකව තමයි ඒ යෝජනාව සභා සම්මත වුණේ. එතකොට දැන් මේ අවස්ථාවට අපි යම් පියවරවල් අරගෙන තියෙනවා. අපෙත් යෝජනාව වුණේ ඒකට පැහැදිළිව ගන්න පුළුවන් විශාල ඉඩක් තියෙන භූමියක් ඇති ප්‍රදේශයකින් වෙනත් කාරණාවලටත් එක්ක ඉඩමක් අරගන්න ඉලක්කයක් තමයි තිබුණේ. ඒ යෝජනාව දැන් ක්‍රියාවට නැගෙමින් තියෙනවා ඒ බිම් ප්‍රමාණයම නැති වුණත්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී අයවැය ඉලක්කයන් හැටියට අරගෙන යෝජනා කරනවා ඒ ඉලක්කය අපි අතහරින්න ඕන නැහැ කියලා. අක්කර පහක් ලබා ගැනීමට කරපු උත්සාහය තවදුරටත් ක්‍රියාවට නගා ගෙන කසළ ප්‍රතිචක්‍රීකරණය කරන්න වැඩපිළිවෙලකටත් එතන ලබා ගැනීම සුදුසුයි කියලා මට හිතෙනවා. මොකද ඒකට විශාල භූමියක් ලබා ගත්තම පෞද්ගලික

මිනිස්සුන්ගේ පදිංචියෙන් බැහැරව, මිනිස්සු ජීවත් වෙන ප්‍රදේශයක් ආශ්‍රිතව නැතුව බාහිරව ගන්න පුලුවන් නිසා ප්‍රතිවිරෝධතා අඩු වේවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව තොගයක් යන්න තියෙනවා අයවැය සම්බන්ධයෙන් කතා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකෙ තියෙනවා ගරු සභාපතිතුමනි, මම ඒ අයට ඉඩ දීලා අවස්ථාව ගත්තේ. නැත්නම් ඔබතුමා හැමදාම මාත් එක්ක ගැටෙනවා අනිත් අයට අවස්ථාව දෙන්නේ නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. වෙනත් තැන් වලට යද්දිත් මම නිශ්ශබ්ද වෙලා හිටියෙත් ඒකයි. මුකුත් කතා නොකර හිටියේ ඒකයි. නැත්නම් අනිවාර්යයෙන්ම ඔය චෝදනාව එල්ල කරන බව දන්නවා. මම කියන්නේ කතාව කෙටි කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** චෝදනාවක් නෙමෙයි ගරු සභාපතිතුමා, මේක සාකච්ඡාවට ලක් කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි ඉස්කෝල ගැන, ශිෂ්‍යත්ව විභාගය ගැන දිගට කතා කරන කොටත් මම අහගෙන හිටියේ. මම නැත්නම් කියනවා මේ සම්බන්ධව විතරක් කතා කරන්න කියලා. මම කතාව කෙටි කරන්න කියලා කිවුවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කෙටි කරන්නම් සභාපතිතුමනි, මම ඒ කාරණාව මතු කරේ මගේ යෝජනාව ඉදිරිපත් කරපු වෙලාවේ ස්තුති කරන එක විතරක් නෙමෙයි එතනින් එහාට අපි මේක සාකච්ඡා කරන එක හොඳයි කියන ආකල්පයෙන්. මේවා සමාජ ප්‍රශ්න. ඒ නිසා අපේ ජනතාවටත්, ප්‍රදේශයේ ජනතාවටත් බලපාන ප්‍රශ්න මේවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, ආදාහනාගාරය ඒ යෝජිත ස්ථානයේ දැනට තියෙන තත්ත්වයෙන් කළමනාකරණය කරමින් ඉහළ මට්ටමේ තැනක් හැටියට ඉදිකිරීමට කටයුතු කරන අතර, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමටත් මුල්ම සභාවේදී යෝජනා වුණා. මේ සභාවේ නෙමෙයි මීට කලින් සභාවකදීත් මේ යෝජනාව කරා. මේක අපිට ඉතාමත් බැරෑරුම් සහ ප්‍රධානව වගකීමක් එන ප්‍රශ්නයක්. අපි හැම අයවැයකදීම මේ යෝජනාව කරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඒවාට ව්‍යාපෘති සාකච්ඡා කරා අපි. නමුත් මේවා ක්‍රියාත්මක වුණේ නැහැ. මට මතකයි එක අවස්ථාවක ඔබතුමා යෝජනා කරා කසළ දාහකයක් මිලදී ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමා අපි බැලුවා. ඒක හදපු තැන අසාර්ථකයි. අසමත් ව්‍යාපෘතියක් ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කොහොද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනුරාධපුර නගර සභාවේ ඒක කරලා තියෙනවා. සාර්ථක එකක් කියන්න අපි ඒක බලන්න යමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මහායාන එකෙන් සාර්ථක එකක් කරලා තියෙනවා හොරණ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහායාන නිසා උදුල මන්ත්‍රීතුමා කැමති වේවිද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මහායාන නෙමෙයි හීනයාන වුණත් කමක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම ඒක ලියාපදිංචි කරපු සංවිධානයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලමු එහෙමනම් ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම කියන්නේ මේ සභාවට, මේ සාකච්ඡාවට අදාළ විෂය සම්බන්ධ දේවල් කතා කරමු. ගරු සභාපතිතුමනි, කසළ ගැටලුව ඔබතුමාට මේ පනතෙන් එන මූලිකම කාරණයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඊළඟ එකේදී අපි ඕවා සාකච්ඡා කරමු. අයවැය සම්බන්ධව සාකච්ඡාව ඉවර කරලා ඉමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙතන කතා කරපු කරුණුත් එක්ක මම කතා කරන්නේ ඒවා බැහැර වෙලා යන හින්දා. නැත්නම් මේවා සභාවේ සාකච්ඡා නොකලොත් එහෙම හොඳ නැහැ.

ගරු සභාපතිතුමනි, ඊළඟට අපි දැන් මේ අයවැය තුළ වැඩි ප්‍රමාණයක් අපේ සංවර්ධන කටයුතු සඳහා වෙන් කරලා කරන ඒවා තියෙන්නේ. කරන කටයුතු වලදී ඉදිරිපත් වෙන්නෙම එදිනෙදා නඩත්තු කටයුතු වෙනුවෙන් කරන ඒවා. මාර්ග ගත්තම මාර්ග පිළිසකර කිරීම, මාර්ග සුද්ධ පවිත්‍ර කිරීම සහ නඩත්තු කිරීමේ කටයුතු ආශ්‍රිතව තමයි තියෙන්නේ. එතකොට ඒ කරන එකේ දැන් මෙතන සාකච්ඡා වුණ පරිදිම පාරවල් කාපට් කරත්, පාරවල් තාර දැම්මත්, කොන්ක්‍රීට් කරත් මේ පහතරට තෙත් කලාපයේ ප්‍රදේශයක් හැටියට අපිට වර්ෂාවෙන් එන බලපෑම ඉතා බරපතලයි. ඒ නිසා දෙපස කාණු පද්ධති සම්බන්ධව ප්‍රශ්නයක් එනවා. විශේෂයෙන්ම පාරවල් තාර දාලා හරි, කොන්ක්‍රීට් කරලා හරි, කාපට් දැම්මම හරි වෙන්නේ අර දෙපස කාණු වලින් එන වැලි පාරවල් හරහා යනවා. ඒක ඉතාම අනතුරුදායකයි. වාහන වල රෝද ලිස්සීම නිසා වෙන අනතුරු වැඩියි. ඒ නිසා මම කියන්නේ එවැනි තැන්වල අඩුම තරමේ වංගු සහිත පාරවල් වල ගොඩදාන තැන් වලට හරි මොකක් හරි මේකට නඩත්තු කටයුත්තක් යාවත්කාලීන කරන්න දිගින් දිගට. එහෙම කටයුත්තකට යොමු කරන්න.

ගරු සභාපතිතුමනි, ඊළඟ කාරණාව පොදුවේ අයවැය ගත්තොත් එහෙම අපිට ඔබතුමා ගියවර ඉදිරිපත් කරපු අයවැයට ඉතාම ආසන්න අගයන් සහිතව තමයි මෙවර අයවැය ඉදිරිපත් කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නැතුව ඊට වැඩිය දෙයක් කොහෙත්ම කරන්න බැහැ. ගියසැරෙත් අපිට නිශ්චිත ඉලක්ක සපුරා ගන්න බැරි වුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අපිට අයවැයේ ආදායම් ඉලක්ක මේ වන විට කොතරම් ප්‍රමාණයකින් ඉටු කර ගෙන අපේක්ෂිත අරමුණු කරා ළඟා වෙලා තියෙනවද කියලා දන්නේ නැහැ. ඔබතුමාගෙන් මම ප්‍රගතිය කියලා හැමදාම ඉල්ලන එකක් තියෙනවා. මාසික වාර්තාවක් නම් අපිට ලැබෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකෙදි අපි නොහිතපු දෙයක් වුණා. ඔබතුමා දන්නවා අර ලක්ෂ 40 ක සහනාධාර බෙදුවා. ඒක අපිට පවුල් 8000 කට දෙන්න වුණා. අනිත් පැත්තෙන් ගත්තම අපිට එන ආදායම සම්පූර්ණයෙන්ම අඩු වුණා. ගිය සැරේ එක්කෝටි හැත්තෑ ලක්ෂයක් අපිට වරිපනම් බදු විදියට ඇවිල්ලා තිබුණා. මම හිතන්නේ මේ වර්ෂයේදී 70% ක් වත් නැති තරම් බොහොම අවම මට්ටමක තියෙන්නේ. ඒකෙදි අපිට සමස්ථයක් වශයෙන් ගත්තම අපි ගියපු විදිය ගත්තම සතුටු වෙන්න ඕන. අපි කරන්න පුළුවන් වෙලාවේදී කරන්න පුළුවන් දේවල් කරා. වර්තමානයේදීත් අපි කොරෝනා වසංගතය වෙනුවෙන් සෑහෙන්න මුදලක් වර්තමාන සභාවෙනුත් වියදම් කර ගෙන යන්නේ. මොකද අපේ බලප්‍රදේශයේ තියෙන සෑම රජයේ ස්ථානයකටම අඩුම තරමේ සති දෙකකට සැරයක් විෂබීජහරණය කරනවා. ඒ වගේම ගත්තම පාසල් සහ නිරෝධායනය කරන ස්ථානත් විෂබීජහරණය කරනවා. අපි වියළි ආහාර බෙදා දීම ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සිදු කරා. ඒ ආකාරයෙන් ගත්තම නොසිතපු වැයක් අපි දැරුවා. ගිය වසරේදී ඉලක්ක නොකරපු වැඩපිළිවෙලකටත් ඔය අතරේදී යන්න වුණා. අපිට සාර්ථකත්වය වශයෙන් මම දකින්නේ අයවැය පිළිබඳව විතරක් ගත්තම 60% ක විතර ප්‍රගතියක් තමයි. මම හිතන්නේ ඒ 60% න් අපේ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගේ මැදිහත්වීම මත ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන්ගේ දැඩි කැපවීම මත තමයි මේ මට්ටමට හරි අපිට ළඟා වෙන්න පුළුවන් වුණේ. මොකද දැනට වුණත් නිලධාරීන්ගෙන් 50% ක් ගෙදර තියන්න කියලා තියෙන්නේ. ලේකම්තුමයි, මමයි උපරිම විදියට නිලධාරීන්ව ගෙන්වා ගෙන අවශ්‍ය දේවල් කරනවා. ජනතාව එළියේ ඉඳලා නිලධාරියා එතනට සම්බන්ධ කරලා පරිපාලන කටයුතු අඩාල කරන්නේ නැතුව ඒ කටයුතු අපි අද වෙනකම් සාර්ථකව කර ගෙන ගිහිල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා දැන් මතුකරපු කාරණාව බැලුවම මේ රටේ පවතින, සමාජයේ පවතින අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වයත් එක්ක අපි ඉතාමත්ම දැඩිව අවධානයෙන් කටයුතු කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මන්ත්‍රීතුමා අපි ඒක මේකෙන් පස්සේ කතා කරමු. අයවැයට සම්බන්ධ කාරණා විතරක් තියෙනවා නම් කතා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අයවැය තමයි සාකච්ඡා කරන්නේ සභාපතිතුමනි, අයවැය ලේඛනය දිහා බලාගෙන වෙනත් කාරණයක් සාකච්ඡා කරන්නේ නැහැනේ. සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව ඔබතුමාගේ යෝජනා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් විනාඩි 20 ක් විතර මම හිතන්නේ ඔබතුමාට ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** විනාඩි 20 ක් නෙමෙයි ගරු සභාපතිතුමනි, සභාව පටන් අරගෙන අනිත් ඔක්කොම අය කතා කරා. ඔබතුමාට දැන් මම නැගිටපු වෙලාවේ ඉඳලම ප්‍රශ්නයක් තියෙනවා. ප්‍රශ්නය තියෙන්නේ ඔබතුමාට අහන් ඉන්න බැරි එක නම් කියන්න මේක මෙහෙමයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අහන් ඉන්න බැරිකම නෙමෙයි තියෙන්නේ. මේක අහන්නකෝ. අයවැය සම්බන්ධ කාරණා නෙමෙයිනේ බහුතරයක් කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කාරණය මතු කරලා තියෙනවා. හැම සභාවකදිම මේ ප්‍රශ්නය තියෙනවා තමයි මන්ත්‍රීවරයෙක් කතා කරන කොට. දැන් ඒක මෙතුමත් මතු කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ඔබතුමාගේ තේරුම් ගැනීම පිළිබඳව අවුලක් තියෙනවා. ඉස්සෙල්ලා ඒක හදාගෙන ඉන්නකෝ. මම මෙච්චර වෙලා නිහඬව හිටියා. පැහැදිළිවම අනිත් මන්ත්‍රීවරුන්ට තේරුම් ගන්න පුළුවන් එක ඔබතුමාට තේරුම් ගැනීමේ නොහැකියාවක් තියෙනවා. මම කියන්නේ මේ අයවැය සම්බන්ධව විතරයි මේ සාකච්ඡාව යන්නේ. ඉස්සරහට වෙනත් යෝජනා ඕන දෙයක් සාකච්ඡා කරන්න පුළුවන්. එහෙම තේරුම් ගන්න බැරි මන්ත්‍රීවරයෙක් ඔබතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉතිං මෙච්චර වෙලා සාකච්ඡා කරපුවා අහන් ඉඳපු ඕනම කෙනෙකුට තේරෙනවා මේ සාකච්ඡා කරේ මොනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අයවැය සම්බන්ධව යෝජනා නෙමෙයිනේ සාකච්ඡා කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉතිං සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තම අයවැය සම්බන්ධව නෙමෙයිද කතා කරේ. මේ මම පෙරලගෙන ඉන්නේ අයවැය වාර්තාව. ඒක තමයි දැන් සාකච්ඡා කරන්නේ. දැන් ඔබතුමාට ඒක තේරෙන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං කියන්නකෝ. ඔබතුමා වටේ ගහලා ගහලා එන තැන මම දන්නවා. කමක් නැහැ. ඒක ඔළුවේ තියාගෙන ඔබතුමා කතා කරන්නේ. ඉතිං මේක කෙටි කරන්න කියලා මම කියන්නේ. අහගෙන හිටියනේ. මුලින් විනාඩි 15 ක් විතර නිශ්ශබ්දවම හිටියා වචනයක්වත් කතා නොකර. එතකොට මොනවද කතා කරේ ශිෂ්‍යත්ව විභාගය ගැනයි, රටේ ලෝකෙ අරවා මේවා ගැනයි.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ මේක දැන්වත් ඔබතුමාට තේරෙනවද කියලා. දැන් අයවැය ගැන සාකච්ඡාවක් මන්ත්‍රීතුමා යන්නේ. ඊට පස්සේ ඔබතුමාට කියන්න දේවල් තියෙනවා නම් මේකෙන් පස්සේ ඒවා ඉදිරිපත් කරන්න අවස්ථාව තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අයවැය සාකච්ඡාවට අයවැය වාර්තාවත් එක්කනේ සාකච්ඡා කරේ. අයවැය ගැන තමයි මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ හින්දා බාධා කිරීම් කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට කොච්චර වෙලාවක් ඕනද කියන්නකෝ. වෙලාව මට කියන්නකෝ. පැය භාගයද, පැයද, මම නිශ්ශබ්ද වෙලා ඉන්නම්. කියන්නකෝ මට වෙලාව.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා විහිළුවට ලක් කරන්න එපා මේ සභාව. ඔබතුමාට මේ කාරණය පොඩ්ඩක් ඉවසගෙන ඉන්න බැරිද, කාරණයක් මතු කරන කොට ඔබතුමා අතරමැදින් පනිනවා. ප්‍රියන්ත මන්ත්‍රීතුමත් කිවුවා කතා කරන කොට අතරමැදින් උත්තර දෙන්න එපා ඔබතුමා ලියා ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මීට වැඩිය කාලය දෙන්න බැහැ ඔබතුමාට. ඔබතුමා කතාව කෙටි කරන්න. ඔබතුමාට කොච්චර වෙලාව ඕනද අයවැය ගැන කතා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අහගෙන ඉන්නකෝ කෑ නොගහ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් මන්ත්‍රීවරුන්ගේ කාලයනේ මේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි කියන්නේ. අනවශ්‍ය කාලයක් මෙච්චර වෙලා නැති කරේ ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. මම නිහඬව ඉන්නම් ඔබතුමා කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අහගෙන ඉඳලා උත්තර දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ නිසා කරුණාකරලා අහගෙන ඉන්න. ගරු සභාපතිතුමනි, මේ අයවැය වාර්තාවේ දැන් අපි ගිය අවුරුද්දේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කරලා තියෙනවා වියදම් ඇස්තමේන්තුවේ උපකරණ වැය සඳහා රුපියල් ලක්ෂ 95 ක වැය බරක්. එතකොට අපි මේ වර්ෂය වෙන කොට දැන් සෞඛ්‍ය ප්‍රශ්නයක් මේ රටේ තියෙන අවස්ථාවේදී මේක ලක්ෂයක් දක්වා අඩු වෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා ඒ ලක්ෂ 95 ඉලක්ක කරගෙන කරපු ප්‍රාග්ධන වැය මේ අවුරුද්දේ ලක්ෂයක් දක්වා අඩු වීම කළමනාකරණය කරන්නේ කොහොමද කියලා අදහසක් පැහැදිළි කරලා නැහැ. ඒ නිසා කරුණාකරලා අපිට කියන්න මේ අයවැයේ ප්‍රාග්ධන වැය, උපකරණ වැය හැටියට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැය ලක්ෂයක් දක්වා අඩු කරන්න හේතුව මොකක්ද කියලා කියන්න.

ඊළඟ කාරණය තමයි බරපතල කාරණය විදියට මම මතු කරන්නේ මේ අයවැය වාර්තාවේ බරපතල කාරණයක් විදියට මට මතු වුණේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපි මේ තරම් අඩු අවධානයක් යොමු කර වන්නේ ඇයි කියලා මේ මොහොතේ කියන එක. ඉදිරිය කියලා කියන එකේදී කවුරුත් දන්නවා කොයි මොහොතක, කොයි කාලයක් තව ඉස්සරහට මේකට මුහුණ දෙන්න සිදු වෙනවද කියලා කියන්න බැහැ. ඒක අපි කවුරුත් දන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දැන් මේ අයවැය ගිය අයවැයට සාපේක්ෂව ගත්තොත් එහෙම පහුගිය අයවැයේදී අපි කරපු ප්‍රාග්ධන යෝජනා මේ වෙනකොට කෙරිලා නැහැ. ඔබතුමා හේතු මතු කරනවා අපිට ආදායම ලැබුණේ නැහැ සහ විශේෂ තත්ත්වයක් මතු වුණා කියලා. ඒ නිසා මේක කරගන්න බැරි වුණා කියලා හේතු ගොඩක් තියෙනවා. නමුත් අපි අයවැය යෝජනා හැටියට ගනිපු ඒවා කියන්න. අයවැයක් කියන්නේ ප්‍රතිපත්ති යෝජනා. ඒ කිසිවක් කරන්න අසමත් වෙච්ච ක්‍රියාවලියක් තියෙන්නේ. ඒ අසමත්භාවය සම්බන්ධයෙන් මගේ විවේචනයක් තියෙනවා. මොකද අපි අවුරුදු තුනක් සාකච්ඡා කරපු ප්‍රධාන කාරණා අදටත්, ඊළඟ අවුරුද්දටත් කරන්න තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කරුණාකරලා ඒවා ගැන පැහැදිළි කරන්න ඕන මේ අයවැයේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඊට කලින් කියන්න කැමතියි ඔබතුමා ඉන්න තැන ගැන මට ගැටළුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කතා කරන එක සම්බන්ධව ගැටළුවක් නැහැ නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඉන්නේ මොන පුටුවේද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මොකක්ද ප්‍රශ්නය වෙලා තියෙන්නේ ඔබතුමාට. ඔබතුමා දකින එක සම්බන්ධව ගැටළුවක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභාපතිතුමාට සභාව පේන විදියේ වරදක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද වෙනස් කරලද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන්වත් හරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි. දැන්වත් හරියි කියන එක පිළිගන්නවා නම්. ගරු සභාපතිතුමනි, ඔබතුමා දකින විදිය, දකින කෝණය අනුව තමයි අනිත් මිනිස්සුන්ව පේන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමා එතකොට කොතනද ඉන්නේ. ඔබතුමා පාවිච්චි කරන මයික්‍රෆෝනය මොන එකද කියලා මට කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක මාර ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා පාවිච්චි කරන මයික්‍රෆෝනය මොකක්ද කියලා කියන්නකෝ. ඔබතුමාගේ තැනට එන්න කරුණාකරලා. ඔබතුමාගේ මයික්‍රෆෝනය පාවිච්චි කරන්න කරුණාකරලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ප්‍රශ්නයට මට උත්තර දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉතිං අහගෙන ඉන්න. ඔය ඉවසීමක් නැතිකමනේ තියෙන්නේ. එහෙම ප්‍රශ්නයක් ඔබතුමාට මතු වෙන්න හේතුවක් නැහැනේ.

ගරු සභාපතිතුමනි, මම පැහැදිළි කරන්නේ එතකොට මේ සෞඛ්‍ය අර්බුධයක් තියෙන කොට ඉදිරි ඉලක්ක අයවැයේදී සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කරපු මුදල් මේ තරම් ප්‍රමාණයක් කප්පාදු වෙන්නේ කොහොමද කියලා. විශේෂයෙන්ම ප්‍රාග්ධන වැය. 2021 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තුවේ වැඩ සටහන් අංක 02 වන සෞඛ්‍ය සේවා යටතේ ප්‍රාග්ධන වැය, උපකරණ වැය සඳහා වෙන් කරලා තියෙන්නේ රුපියල් ලක්ෂයයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උත්තරයක් දෙන්නද ඔබතුමාට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔක්කොටම එකට උත්තර දෙන්න සභාපතිතුමා. එතකොට ලේසියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොච්චර වෙලා යනවද කියලා මම ආයෙමත් අහනවා. පැයක්වත් යනවාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙහෙමයි. ගන්න කාලය වැඩි කරන්නේ ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට සමාවෙන්න ඕන. මම සමාවෙන්න කියලා ඉල්ලනවා. මට ඔබතුමාගෙන් සමාව ගන්නත් වෙලා තියෙනවා. මොකද ඔබතුමාට කියන එක තේරෙන්නේ නැහැ ඇත්තටම. ඒක හින්දා ඔබතුමාට කොච්චර වෙලාවක් ඕනද කියලා නිකං දළ වශයෙන් කියන්න පුළුවන්ද, නැත්නම් මේක තේ බොන්නවත් නවත්වන්න විදියක් නැහැ. මේක විකාරයක් බවට පත් කරමින් ඉන්න බව මට පේනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කාටත් පැහැදිළියි දැන් මෙතන විකාරයක් බවට පත් කර ගන්නේ කවුද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් හරි. ඔබතුමාගේ අදහස් නවත්වන්න. අපි තේ බොන්න නවත්වමු. විකාරයක් කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මෙතුමට විනාඩි 05 ක් දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි විනාඩි 05 යි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මතුකරපු එකක් තමයි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වියදම්වල කප්පාදුවක් සිදු කරලා තියෙන්නේ ඇයි කියන කාරණය. ඊට පස්සේ ඔබතුමා ඒක කළමනාකරණය කරන්නේ කොහොමද කියන කාරණය තියෙන්නේ.

ඊළඟට ගරු සභාපතිතුමනි, මම දැන් හැම අයවැයකම දැකපු පොදු කාරණය, අඩුපාඩුව වන්නේ මේ යෝජනා සැහෙන්න ප්‍රමාණයක් ඇතුළත් අයවැයක් ඉලක්ක කරනවා කියන්නේ සභාවකට යෝජනා දානවා වගේ නෙමෙයි. අයවැයක් කියන්නේ නිශ්චිත ආදායම් සහ වියදම් සීමාවක් ඇතුළේ අපි කරනු ලබන සාකච්ඡාවක්. එතකොට මේ වියදම් ප්‍රමාණය බැලුවම ප්‍රාග්ධන වියදම් වලට අපි වෙන් කරලා තියෙනවා මේ වර්ෂයේදී ආදායම් වලින් එක්කෝටි තිස් ලක්ෂයක්. ඒ කියන්නේ මිලියන 13 ක්. ඔබතුමා ඒ මුදල ගැන කියන්නේ, මේ මිලියන 13 ගැන කියන්නේ රජයෙන් අපිට ලැබෙන ආධාර සහ ප්‍රතිපාදන කියලා. පළාත් සභාවෙන්, මධ්‍යම ආණ්ඩුවෙන් සහ වෙනත් ඒවායින් ලැබෙන ප්‍රතිපාදන ඒ. එතකොට එක කාරණයක් තියෙනවා ගරු සභාපතිතුමනි, දැන් මේ අයවැයෙන් මිලියන 13 ක ඉලක්කයක් තියෙනවා. ඔබතුමා ගිය අවුරුද්දේ මිලියන 25 ක ඉලක්කයක් තියලා කටයුතු කරා. එතකොට ගිය අවුරුද්දේදී කිව්වේ ඔබතුමා විවේචනය කරපු, ඔබතුමන්ලාට ආණ්ඩු බලය තිබුණේ නැති, ජනාධිපතිවරයෙක් හිටපු නැති කලින් අවුරුද්දේ ඒ තත්ත්වයන් යටතේ ඔබතුමා මිලියන 25 ක ඉලක්කයක් තියාගෙන කටයුතු කරා. නමුත් මේ අවුරුද්දේ ඔබතුමා මේක මිලියන 13ට අඩු කරලා තියෙනවා. ඒක එක කාරණයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් සිංහලෙන් කිව්වා දැන් මේ රටේ තියෙන තත්ත්වය. ඒක තේරුම් ගන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පළාත් සභා අහෝසි කරලා තියෙනවා. පළාත් සභාවල වියදම් නැහැ. ඇත්තටම හොඳයි මේවා ප්‍රාදේශීය සභාව හරහා තමයි කරන්න ඕන. රජයෙන් දෙන ආධාර ප්‍රාදේශීය සභාවට යොමු කරනවා නම් හොඳයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒක එක කාරණයක්. ඊළඟ කාරණය තමයි දැන් අපි මේ අයවැයෙන් ඇත්තටම ප්‍රාග්ධන වියදම් වලට රාජ්‍ය ආදායමෙන් යොමු කරලා තියෙන්නේ, ඒ යොමු කරන සල්ලි වලින් 8% යි ගාණක්. එතකොට 90% යි ගාණක් තියෙන්නේ වෙනත් ආදායම්. ඒවා පුනරාවර්තන ආදායම්. එතකොට ගරු සභාපතිතුමනි ගැටළුවක් තියෙනවා. ඒ වරිපනම් ආදායම් වලින්, රටේ මිනිස්සුන්ගෙන් අය කරන බදු මුදල් වලින් 22% ක වගේ ප්‍රමාණයක් තියෙන්නේ. මේ සමස්ථ ආදායමෙන් පහෙන් එකක පංගුවක් ජනතාවගෙන් ගන්න ඒවා. අපි මෙතෙක් කවදාවත් සභාව විසින්

ආදායම් ජනනය කරන කටයුතු වලට යොමු වෙලා නැහැ. ඒවා බොහොම සීමිත කොටසක් තියෙන්නේ. නොසලකා හැරිය හැකි තරම් ඒවා සීමිතයි. එතකොට ගරු සභාපතිතුමනි, අපි මීට වැඩිය අපේ ආදායම් ඉලක්ක සඳහා, වෙනත් ව්‍යාපෘති වලින් ඒ ක්‍රියාවලියට යන එක ඔබතුමන්ලා මෙතෙක් කල් ගනිපු ක්‍රියාමාර්ග වලින් ඉෂ්ඨ වෙලා නැහැ. ඒක එක කාරණයක්. ඊළඟට ගරු සභාපතිතුමනි, මේ වියදම් ඇතුලෙන් සමස්ථ වියදම් වලින් 38% ක් තමයි ප්‍රාග්ධන වියදම් විදියට යොමු කරන්නේ. එතකොට රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයන් අඩු වෙලා තියෙද්දි ඔබතුමන්ලාට අපි අවශ්‍ය සියළුම සහයෝගය ලබා දෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් විනාඩි 02 ක් ඉවරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම දන්නවා ඔබතුමා බලන් ඉන්නේ ඕක කියලා. ඔබතුමා උත්තර දෙන්නකෝ මට. කිසි ගැටළුවක් නැහැ. ඕක දිහා බලන් ඉන්න එක කවදත් කරපු වැඩේනේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, කරුණාකරලා මේ අයවැයේ තියෙන පරස්පරතාවයන් සහ මේ වියදම් ශීර්ෂවල තියෙන ගැටළු බලන්න. ඊළඟ කාරණය තමයි අයවැයේ යෝජනා වලින් අපි ඉලක්කගත වැඩ සහ ආදායම් වලට සාපේක්ෂව යෝජනා සහ වියදම් අතර, නොගැලපීම් තියෙනවා. ඒ කරුණු සම්බන්ධව ඔබතුමා පිළිතුරු ලබා දේවි කියලා මම අපේක්ෂා කරනවා. මේ අයවැය සම්බන්ධයෙන් අපි විශේෂ වශයෙන් මතු කරා විපක්ෂය වශයෙන් නෙමෙයි ඔබතුමාට සහයෝගය ලබා දීපු කෙනෙකුටවත් මේ සභාවෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලබා දීලා හෝ යෝජනාවක් හෝ ක්‍රියාත්මක වෙලා නැහැ කියලා. අපි මේවට යෝජනා කරා කියලා වැඩක් නැහැ. කිසිදු යෝජනාවක් මේ සභාව විසින් සැලකිල්ලට ලක් කරලා නැහැ. ඒ නිසා ඔබතුමා ඒක මන්ත්‍රීවරුන්ගේ පිට පටවනවා මේක පොදු තීන්දුවක් කියලා, මන්ත්‍රීවරු එහෙම කිවුවා කියලා. ඊට පස්සේ මන්ත්‍රීවරු කියන්නේ එහෙම ගැටළුවක් නැහැ කියලා. ඒක ඔබතුමාගේ පැත්තෙන් ගන්න ඕන තීරණයක් කියලා කියනවා. ඒ නිසා කරුණාකරලා මෙවැනි තත්ත්වයන් ඇතුළේ මේ සභාවේ විපක්ෂයක් හැටියට අපිට කරන්න තියෙන කාර්යභාරය වන්නේ වසමේ අඩුපාඩුවක් පෙන්වන එක විතරයි. ඉන් එහාට වෙනත් වගකීමක් ඔබතුමා අපිට පවරලා නැහැ. ඒ නිසා කරුණාකරලා මේ අයවැයේ තියෙන පරස්පරතාවයන් සම්බන්ධව ඔබතුමා පැහැදිළි උත්තරයක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම ස්තූතියි. ප්‍රථමයෙන්ම කියන්න ඕන ඔබතුමාට මම කියපු සිංහල තේරුණේ නැති එක ගැන කණගාටු වෙනවා කියලා. මොකද, මිලියන 20 ක් තිබුණ එක මිලියන 13 කට අඩු කරලා තියෙන්නේ වෙන කාරණයක් හින්දා නෙමෙයි. අපිට ගිය සැරේදී සාක්ෂාත් කර ගන්න පුළුවන් වුණේ 60% ක් විතර. ඉතිං ඒක හින්දා අපි නැවත බලාපොරොත්තු වන්නේ මේ වෙලාවේදී අද ආණ්ඩු බලය තියෙන පක්ෂය විදියට ප්‍රාදේශීය සභාව මෙහෙයවන්න. එතනදී අපිට විශාල මුදලක් මධ්‍යම රජයෙන් එනවා. ඒ වගේම පළාත් සභාවෙන් එනවා. ඒක හින්දා අපි ඒවා සීමා කර ගෙන තමයි යන්නේ. ඔබතුමා දැක්කද 2019 වර්ෂයේදී අපිට ප්‍රාග්ධන වැය විදියට ගියේ රු.19,263,980.68 ක්. නමුත් අපි මේ අය වැයේදී ප්‍රාග්ධන වැය විදියට රු.57,650,000.00ක්. වෙන් කරනවා. ඒ ප්‍රාග්ධන වැය කියන්නේ අපිට ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන. ඔබතුමා පෙන්නුවා ඉස්සෙල්ලා අපි 2020 වර්ෂයේදී ප්‍රාග්ධන වැය විදියට ලක්ෂ 95 ක් වෙන් කරලා තියෙනවා කියලා. ඒක අපි පිළිගන්නවා. නමුත් අපි මේ වෙලාවේදී පෙන්වලා තියෙන්නේ රුපියල් ලක්ෂයයි. ඒකට හේතුව තමයි අපි මේ අවුරුද්දේදී කසළ දාහක යන්ත්‍රයක් මිලදී ගන්න ලක්ෂ 95 ක් වෙන් කරලා තිබුණා. අපි බොහොම පැහැදිළිව ඒක සඳහා තමයි ලක්ෂ 95 ක් වෙන් කරේ. නමුත් ඒ ව්‍යාපෘතිය අසාර්ථකයි. අපි මේ අවුරුද්දේදී ලක්ෂයක් වෙන් කරේ ඒ සම්බන්ධව අදාළ වෙන අනෙකුත් පොඩි පොඩි කාරණා වලට. ඒ ලක්ෂය වෙන් කරලා තියෙන්නේ. අනිත් එක අපි පුනරාවර්තන වියදම් යටතේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සැහෙන්න මුදලක් වෙන් කරනවා. අපි ලක්ෂ 40 ක ගියපාර සහනාධාර බෙදුවේ ඒ පුනරාවර්තන වියදම් යටතේනේ. ඉතිං ඒක ඔබතුමා අහපු එක හොඳයි. ඒ ගැන මට කිසි ගැටලුවක් නැහැ. මේ සියළුම ප්‍රාග්ධන වියදම් හරහා අනෙක් ක්ෂේත්‍රවල තියෙන ඒවත් ආවරණය වෙනවා. පුනරාවර්තන වියදම් හරහා අනෙක් කාරණා වලටත් ප්‍රතිපාදන ඇතුළත්ව තියෙනවා. ඒ යටතේ වෙන් කරාට පොදුවේ ගත්තම සියළුම කාරණා පුනරාවර්තන වියදම් සම්බන්ධව ඇතුළත් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පුනරාවර්තන වියදම් යටතේ තියෙන්නේ එදිනෙදා දෛනිකව යන ඒවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි විෂබීජනාශක ගෙනාවොත් ඒවා එදිනෙදා වියදම් යටතේ ගේනවා. එතකොට ඒවා අයිති වෙන්නේ පුනරාවර්තන වියදම් යටතට. සෞඛ්‍ය කියලා වෙනම යන්නේ නැහැනේ. ඒවා පුනරාවර්තන වියදම් යටතේ යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ වෙනුවෙන් පුනරාවර්තන වියදම් වෙන්කරපු තැනක් කියන්න. විෂබීජනාශක මිලදී ගන්න සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දේවල් වලට වෙන් කරපු තැනක් කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්බන්ධතා හා සේවා යටතේ ලක්ෂ පහක් තියෙනවා. කොහොම හරි අපි වර්තමාන රජයෙන් පාලනය වෙන්නේ ප්‍රාදේශීය සභාවක් විදියට. එතනදී අපි

බලාපොරොත්තු වෙනවා ප්‍රතිපාදන ලැබෙයි කියලා. දැනටමත් පළාත් සභාව හරහා අපිට මාර්ග වලට, යම් යම් දේවල් වලට මුදල් ලැබෙනවා. ඉතිං අපි ඒවා මෙතනට ඇතුළත් කරන්න අවශ්‍ය නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒවත් මේකට ඇතුළත් වෙනවානේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ප්‍රාග්ධන ආදායම හැටියටනේ. ඒක හරි. ප්‍රාග්ධන ආදායම විදියට ලැබෙනවා. අපිට නොහිතන දේවල් වලට ලැබෙනවා. දැන් මේ මාසයට මාර්ග සඳහා ලැබිලා තියෙනවා ලක්ෂ 40 කට ආසන්න මුදල් ප්‍රමාණයක් පළාත් සභාවෙන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මුද්දර ගාස්තු ආදායම විදියටද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. මුද්දර ගාස්තු ආදායමෙන් නෙමෙයි. උපමාන පාදක යටතේ ලක්ෂ 40 කට ආසන්න මුදලක් ආවා. ඒක මම අනුමත කරන්නේ නැහැ. ඒකත් මම මේ වෙලාවේදී කියන්න ඕන. නොයෙකුත් සම්බන්ධතා මත ඒවා එන්නේ අපේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ඔබතුමාට හොඳයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොඳයි. නමුත් ඒ එන විදිය පිළිබඳව මගේ එකඟතාවයක් නැහැ. හරිනම් එන්න ඕන අපිට මෙන්න මෙච්චර මුදලක් වෙන් වෙනවා එතනදී මොකක්ද ඔබතුමාට ප්‍රධාන වශයෙන් තියෙන යෝජනා ටික කියලා. එහෙම එනවා නම් වඩාත් හොඳයි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඉතිං ඒකට ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් එක්ක කතා කරානම් ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අවංකව සද්භාවයෙන් දේවල් කිවුවම කුප්ප කතා කියන්න එන්න එපා. කුණුහරුප කියන්නේ. ඔය දෙපලම එක ජාතියේ මනුස්සයොනේ. අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මම තවත් කියන්න ගියොත් තව දේවල් කියවේවි. අපි ප්‍රධාන කාරණාවට යමු.

මීළඟට තියෙන්නේ අයවැය සම්මත කර ගැනීම. මම ඊට ප්‍රථමව සියළු දෙනාගෙන්ම සහයෝගය ඉල්ලා සිටිනවා. පහුගිය වර්ෂ 03 වගේ නෙමෙයි ඊළඟ වර්ෂය. මොකද ඊළඟ වර්ෂයේදී දැන් අපිට ආණ්ඩුවක් තියෙන ප්‍රාදේශීය සභාවක් තියෙන නිසා ඉස්සරහට තියෙන වර්ෂයේදී මම ඉතාමත්ම විශ්වාසයෙන් බලාපොරොත්තු වෙනවා උප සභාපතිතුමා ප්‍රධාන අපේ පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම ගැන. ඒ වගේම සියළු දෙනා ගැනම බොහොම විශ්වාසයක් තියෙනවා. මම සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා මේ අයවැයට පක්ෂව සහයෝගය ලබා දෙන්න කියලා. ඒ වගේම මම අනිවාර්යයෙන්ම කියනවා මට සහයෝගය ලබා දෙන මන්ත්‍රීවරුන්ට යම් දෙයක් කරන්න කොට්ඨාශයේ අනිත් මන්ත්‍රීවරුත් එක්ක සාකච්ඡා කරන්න. මොකද එහෙම ගැටළුවක් තිබුණනේ. කොට්ඨාශවල මන්ත්‍රීවරු ඉන්නවා. ඒ කොට්ඨාශවල ඉන්න මන්ත්‍රීවරුත් සමඟ සාකච්ඡා කරලා ඉදිරි වර්ෂයේදී දෙන්න පුළුවන් සහයෝගයක් දෙනවා. ඉතිං මම එසේ ප්‍රකාශ කරනවා. අයවැය සම්බන්ධව විරෝධතා තියෙනවාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි විරුද්ධයි. විරෝධතාවය මතු කරානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, විරෝධාකල්පයක් නෙමෙයි කරන්න යන්නේ. ඔබතුමා ඉක්මන් වෙන්න එපා. මම මේ අයවැයේදී ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. මම සංවර්ධන යෝජනා මැත යුගයක ඉදිරිපත් කරලත් නැහැ. පාරවල් හදන්න, ලයිට් දාන්න කියලා නැහැ මට ඒක ලැබෙන්නේ නැති හින්දම. හැබැයි ඉතිං එකක් තියෙනවා මගේ කොට්ඨාශයේ ඉන්න, මම ඉන්න ප්‍රදේශයේ ඉන්න සහෝදර මන්ත්‍රීතුමියව අපහසුතාවයට පත් කරන්නේ නැහැ. කෑම ටිකක් තියෙන කොට ඒක බෙදාගන්න ගියාම, ඒකෙන් මටත් දෙනකොට එතුමිය තරහා වේවිනේ. පාරවල් හරි, ලයිට් හරි, දැම්මෙත් නැහැ. නමුත් මම ඔබතුමාගෙන් දෙයක් බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ ඔබතුමා ඒකට පියවරක් අරගෙන තියෙනවා. ඒක වැදගත් කියලා හිතෙනවා. සුගත් මන්ත්‍රීතුමා මුලින්ම මතු කරපු දේ ඒක. අපි ඒ වැඩපිළිවෙලේ යමු. මම මේ අයවැයත් එක්ක ඇත්තටම සම්බන්ධ වෙන්නේ මේකට පක්ෂව නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි ඉස්සරහට බලමු. බෙදීමකට යන්න වෙනවා. මේ අයවැය ඡන්දය නෙමෙයි. මොකද විරෝධතා තියෙනවා අයවැය සම්බන්ධව. මේක අයවැය ඡන්ද විමසීම නෙමෙයි. මේක නීත්‍යානුකූලද, නැද්ද කියන මතය තුළ ඡන්ද විමසීමකට යනවා. විරුද්ධයි කිවුවම බෙදීමකට යන්න වෙනවානේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පැහැදිළි නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් බෙදීමකට ගිහිල්ලානේ තියෙන්නේ. අයවැයට විරුද්ධයිනේ. අයවැය ගෙනාපු විදියට විරුද්ධයිනේ. ඒකට බෙදීමක් ගිහින් තියෙන්නේ. ඒකට ඉස්සෙල්ලා ඡන්දය විමසනවා. අයවැය ගේන එක හරිද, නැද්ද කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගෙනාපු විදියටත් විරුද්ධයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** කෙටුම්පතක් කියන එකටද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** කෙටුම්පතක් ගෙනාපු එකට විරුද්ධයි කියලද අහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතෙක් ඉතිහාසයේ හැමදාම ගෙනල්ලා තියෙන්නේ මේ විදියට. කෙටුම්පත තමයි ගේන්නේ. සම්මත වුණාට පස්සේ තමයි අයවැය ලේඛනය බවට පත් වෙන්නේ. ඒකට බේදීමක් ඉල්ලලා තියෙනවා. එම නිසා ඒකට ඡන්දය විමසනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 15

විපක්ෂව - 04

ඡන්දය දීමෙන් වැළකී සිටි - 01

**2021 අයවැය කෙටුම්පත සම්මත කිරීමට ඉදිරිපත් කිරීම නිවරදිභාවය සම්බන්ධව ඡන්ද විමසීමට පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
14. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
15. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**2021 අයවැය කෙටුම්පත සම්මත කිරීමට ඉදිරිපත් කිරීම නිවරදිභාවය සම්බන්ධව ඡන්ද විමසීමට විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
04. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2021 අයවැය කෙටුම්පත සම්මත කිරීමට ඉදිරිපත් කිරීම නිවරදිභාවය සම්බන්ධව ඡන්ද විමසීමේදී ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 අයවැය කෙටුම්පත සම්මත කිරීමට ඉදිරිපත් කිරීම නිවරදි යැයි වැඩි ඡන්ද 11 කින් සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අය වැය යෝජනාව නෙමෙයිනේ සම්මත වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අය වැය කෙටුම්පත සම්මත කිරීමට යෝජනාව ඉදිරිපත් කිරීම සම්මත වුණේ. අයවැය නීත්‍යානුකූලද, නැද්ද, කියන එකට ඡන්දය විමසුවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** අපි මතු කරේ තාක්ෂණික ගැටළුවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ගෙන ඒම පිළිබඳව විරෝධතාවයට ඡන්ද විමසීම පැවැත්වූවේ. හරියට ඔබතුමාගේ අදහස කියන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** මෙතුමා ප්‍රශ්නයක් මතු කරේ මේ ගෙනාපු අයවැය ලේඛනය ගෙනාව ක්‍රමය වැරදියි කියලා. සාමාන්‍යයෙන් මුලදී අයවැය සම්බන්ධව සාකච්ඡාවන් යනවා. ගියාට පස්සේ මේක ගේනවා. ඒක හරි. නමුත් අපි මෙතනදී කුහක වෙන්න හොඳ නැහැ. කොරෝනා ප්‍රශ්නය හින්දා සභාව රැස්වෙවී ඉන්න බැහැ. අපිට නිතරම රැස්වෙවී ඉන්න බැහැ. අපි මෙතනට රැස්වුණත් වැඩි වෙලාවක් ඉන්නේ නැතුව යන එක තමයි හොඳ. කාටවත් කියන්න බැහැනේ තත්ත්වය. මෙතන ඉන්න කාටද කොරෝනා තියෙන්නේ කියලා අපිට කියන්න බැහැනේ. අපි නිතරම රැස්වෙන එක අඩු කරන්න ඕන. ඒක නිසා රටේ තියෙන වාතාවරණය අනුව මේක ගෙනාපු එක අපිට කිසි ගැටළුවක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** දැන් ඡන්දය විමසුවා ඒක ඉවරයි දැන්. දැන් තවත් අදහස් දක්වන්න ඕන නැහැ. ඡන්ද විමසීම පැවැත්වූවා. ඔබතුමා විරුද්ධයි කිව්වා. ඒකට ඡන්දය විමසුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** මම මතු කරේ ඒ තාක්ෂණික කාරණය. ඔබතුමා අයවැයට ඡන්දය විමසුවේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** හරි දැන් අයවැයට ඡන්දය විමසනවා. දැන් හරිනේ එතකොට. වචනයේ වැරැද්දනේ තිබුණේ. දැන් අයවැයට ඡන්දය විමසනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 15

විපක්ෂව - 04

ඡන්දය දීමෙන් වැළකී සිටි - 01

**2021 අයවැය කෙටුම්පත සහා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමට පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
14. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
15. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2021 අයවැය කෙටුම්පත සහා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමට විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
04. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2021 අයවැය කෙටුම්පත සහා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමේදී ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 අයවැය කෙටුම්පත වැඩි ඡන්ද 11 කින් සභා සම්මත විය.

බොහොම ස්තුතිවන්ත වෙනවා. උප සභාපතිතුමා ප්‍රධාන පක්ෂව ඡන්දය ලබා දීපු අපේ පක්ෂයේ සියළුම මන්ත්‍රීවරුන්ටත්, ඒ වගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. පක්ෂව ඡන්දය පාවිච්චි කරපු සියළු දෙනාටම ස්තුති වෙනවා. මොකද අපි දැක්කා පහුගිය කාලයේ බහුතරය තිබුණ ප්‍රාදේශීය සභාවල් වල පවා අයවැය පරාද වෙච්ච වෙලාවල්. ප්‍රාදේශීය සභා කිහිපයකම අයවැය පැරදුනා. නමුත් මම ගැන විශ්වාසය තියලා අපේ පක්ෂය ලෙස විශේෂයෙන්ම පොහොට්ටුවට සම්බන්ධ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සම්බන්ධ සියළුම මන්ත්‍රිවරුන් එකා වගේ සිටිමින් මා වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙපලත් ඇත්තටම සහය දුන්නා පක්ෂයක් හැටියට. ඇත්තටම අපි ඉදිරියට ඔවුන් සමගත් සුහදතාවයෙන් වැඩ කරනවා. සමගි ජන බලවේගය නියෝජනය කරමින් කියාස් මන්ත්‍රීතුමා සහ ඩඩ්ලි මන්ත්‍රීතුමා දක්වපු සහයෝගය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඉදිරි වර්ෂය තුළ අනිවාර්යයෙන්ම අදාළ සංවර්ධන වැඩ කටයුතු කරගෙන යාමේදී ඔවුන්ගේ යෝජනාවනුත් අපි අරගෙන අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරු සමගත් සාකච්ඡා කරලා ඔවුන්ගේ යෝජනාවන් සහ අදහස් අරගෙන අපි ඉදිරියට වැඩ කටයුතු කර ගෙන යන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම සඳහන් කරන්න ඕන විශේෂයෙන්ම සියළුම දෙනා දක්වපු සහයෝගය පිළිබඳව. ඒකට නැවත වරක් ස්තුතිවන්ත වෙනවා. එසේ ප්‍රකාශ කරමින් අයවැය සම්මත කිරීම පිළිබඳව නැවත වාරයක් ස්තුතිවන්ත වෙනවා.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, 2021 වර්ෂයේ අයවැය කෙටුම්පත ගරු සභාවට ඉදිරිපත් කරලා එය සම්මත වූ අවස්ථාවේ ගරු සභාපතිතුමාට 2021 වර්ෂයේදී ජනතාව බලාපොරොත්තු වෙන කාරණයන් ඉටු කර ගැනීමට ශක්තිය හා ධෛර්ය මන්ත්‍රීවරු හැටියට ලබා දීම පිළිබඳව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා හැටියට ඔබතුමාටත්, ප්‍රාදේශීය සභාවේ අපගේ සහෝදර මන්ත්‍රීවරුන්ටත්, මම සුභපැතුම් එක්කරනවා. ඒ වගේම අපේ පක්ෂයේ සියළු දෙනාම සහයෝගය ලබා දෙන අතරතුර අපිට ශක්තිය එක්කරපු සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු, ඒ වගේම අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුන්ටත්, ඒ වගේම විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරපු අනෙකුත් අයටත් ස්තුතිය පළ කරනවා. අපේ ජනතාවට සේවය සැලසීමයි ප්‍රාදේශීය සභාව විදියට අපේ යුතුකම හා වගකීම වන්නේ. ජනතා විමුක්ති පෙරමුණ මේවාට සදාකල් විරුද්ධයි. මම දන්නේ නැහැ එක අයවැයකටවත් සහයෝගය ලබා දුන්නද කියලා. හැමදාම ප්‍රාදේශීය සභාවේ කාලය වැඩි වශයෙන් වැය කරලා කතා කරත්, අවසානයේ ප්‍රතිඵලයක් නැහැ. හැමදාම යෝජනා ක්‍රියාත්මක කරන්න සහයෝගයක් ලබා දෙන්නේ නැහැ. ඒ වගේ පහත් දේශපාලන ක්‍රියාවලියක නියැලෙන මේ පක්ෂය ගැන අපිට තියෙන්නේ කණගාටුවක් විතරයි.

ඊළඟට විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, පහුගිය දින පැවති ශිෂ්‍යත්ව විභාගයට මගේ දියණියත් පෙනී සිටියා. එම විභාගයෙන් මගේ දියණිය සමත් වුවා. ඒ වගේම අතිවිශිෂ්ඨ ලකුණු ලබා ගනිපු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි දියණියට සුභ පතනවා. ඒ වගේම මගේ දියණියගේ එම ජයග්‍රහණයට ගරු සභාවේ සභාපතිතුමා, සහෝදර මන්ත්‍රීවරුන් ලබා දීපු සුභ පැතුම් වලටත්, විශේෂයෙන්ම ලේකම්තුමා ඇතුළු නිලධාරීන් ඒ ලබා දීපු සුභපැතුම් වලටත්, මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඔබතුමාට 2021 වර්ෂයේදී ශක්තිය, ධෛර්ය සපිරි සංවර්ධිත ප්‍රාදේශීය සභාවක් බවට අපේ ප්‍රාදේශීය සභාව ගෙන යාමට හැකි වේවායි සුභ පතනවා. අපේ දේශපාලන නායක රමේෂ් පතිරණ මැතිතුමාගේ සහයෝගයෙන් අපේ පොහොට්ටුවේ කණ්ඩායම සමඟ මෙම අයවැයට, සහායෝගය ලබා දීපු සියළු දෙනා සමඟ මේ ගමන ශක්තිමත්ව, ඉතා විශ්වාසයෙන් ගමන් කරමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැවත වරක් උප සභාපතිතුමා ප්‍රධාන සියළුම අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ඒ වගේම අනෙකුත් විරුද්ධ පක්ෂයෙන් සහයෝගය ලබා දුන්නු සියළු දෙනාටමත් ස්තුතිය පළ කරනවා. අපි එකතු වෙලා වැඩ කරමු. ඡන්දය දුන්නා හෝ නොදුන්නා ඒක මෙතනින් ඉවරයි. අපි ඉදිරියේදී කණ්ඩායමක් විදියට සහයෝගයෙන් යමු. අපිට තව තියෙන්නේ අවුරුදු එක හමාරක කාලයක් ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු කරන්න. එහිදී ඒ සහයෝගය ලබා දෙන්න කියන එකත් ඉල්ලා සිටිනවා.

**02.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2020-10-13 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| අතිරික්ත වූ වැය විෂයන් | | | ඌනතා වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම | වැය සංකේතය | වැය විෂය | වටිනාකම |
| 509-01 | ප්‍රාග්ධන වැය - උපකරණ වැය | රු. 12,000.00 | 609-01 | ප්‍රාග්ධන වැය - උපකරණ වැය (පුස්තකාල පොත්) | රු. 12,000.00 |

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2020-11-02 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| අතිරික්ත වූ වැය විෂයන් | | | ඌනතා වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම | වැය සංකේතය | වැය විෂය | වටිනාකම |
| 101-01 | වැටුප් හා දීමනා | රු. 1,300,000.00 | 301-01 | වැටුප් හා දීමනා | රු. 1,300,000.00 |

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** අප ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යයන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නා වූ ලේකම්වරයාට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (XXXII) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 132 (ච) වගන්තිය ප්‍රකාරව සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXIII) පරිදි කාර්යාලය හා නිවස ආසන්න ස්ථාන අතර ගමන් කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ලේකම්තුමාට පනතෙන් පැවරී ඇති දෙයක්. නිතරම ඒක ගන්නේ නැහැ එතුමා. නමුත් එතුමාට ඒක නීත්‍යානුකූලව ලබා ගන්න අපි මේක සභා සම්මත කරලා තියෙන එක හොඳ හින්දා තමයි මේක යෝජනාවක් විදියට ඉදිරිපත් කරේ. මොකද එතකොට ගැටළුවක් ආවත් ඒ යෝජනාව සභා සම්මත කරලා තියෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** පෝද්දල, නරාවල, සිට්ට්‍රස් වතුයායෙන් පර්චස් 80ක බිම් කඩක් මැන වෙන්කර අප ප්‍රාදේශීය සභාවට ලබාගෙන එහි සභා අරමුදලින් ද්විත්ව අදාහනාගාරයක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව විධිමත්ව එන්න ඕන හින්දා තමයි මේ විදියට ගෙනාවේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ වගේම මේක මගේ කොට්ඨාශයේ හදන නිසා මේ පිළිබඳව යම් අදහසක් දක්වන්න ඕන. මේ ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව ඇත්තටම අපි සතුටු වෙනවා. මොකද මේක අපිට අවශ්‍යව තිබුණ දෙයක්. චමින්ද මන්ත්‍රීතුමත් මේක යෝජනා කරා. ලොකු වුවමනාවක් තිබුණා අපිට මේක කොහේ හරි ඉදිකරන්න. පෝද්දල හරි, කොහේ හරි මේක ඉදිකරන්න ඕන කියන මතයේ එතුමා මේ යෝජනාව මුලින් ඉදිරිපත් කරලා තිබුණා. නරාවල

කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට මගේ වගකීමක් තියෙනවා කොට්ඨාශයේ ජනතාවට තියෙන ප්‍රශ්නයන් හඳුනාගන්න සහ ඒවා ඉදිරිපත් කරන්න. සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව ගැටළු නැතුවම නෙමෙයි. අපි ඒ තියෙන ගැටළු නිරාකරණය කරමින් කටයුතු කරනවා. මේ වෙන විටත් ආදාහනාගාරයක් අපේ සභාවට අවශ්‍යව තියෙනවා. හැබැයි පාරිසරික ගැටළු සහ සෞඛ්‍ය ගැටළු කොයිතරම් දුරට තියෙනවද කියන එක ඒ ජනතාව හරියට අවබෝධ කරගෙන නැහැ. ඒක නිසා තමයි අනවබෝධයෙන් හරි යම් කිසි තැන්වල සාකච්ඡා කරන්නේ. මේ වන විට පෙත්සමක් පවා අත්සන් කරලා තියෙනවා වලවත්ත ප්‍රදේශයේ ජනතාව. ඒක දැනට නැවතිලා තියෙනවා. මම ඒක ලබා දීම නවත්වලා තියෙනවා. මොකද මේකෙ අවශ්‍යතාවයක් තියෙන නිසා. හැබැයි මට ඒ අහන ප්‍රශ්න වලට උත්තර දෙන්න හරියට අවබෝධයක් මා සතුව නැහැ. මොකද මම මේ විෂය පිළිබඳව ලොකු අධ්‍යයනයක් කරපු නැති නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක සිට්ට්‍රස් වත්තේ කරන්න පුළුවන්. කිසි ගැටළුවක් නැහැ. හැබැයි අපි තෝරා ගනිපු බිම් කොටස සිට්ට්‍රස් වත්ත ගම්මානයේ ඉඳලා මීටර් 100 ක්, 125 ක් වගේ දුරකින් පිහිටලා තියෙන්නේ. ඒ වගේම අනෙක් පැත්තේ වලවත්ත ගම්මානයට ඉතාම කිට්ටුවෙන් තමයි මේ බිම් කොටස තියෙන්නේ. ඉතිං මේ නිසා මම ගරු සභාවෙන් ඉල්ලීමක් කරනවා. මොකද මේ ආදාහනාගාරය හදන කොට මම දන්න අවබෝධය අනුව ක්‍රමදෙකක් තියෙනවා. ලංකාවේ හදන ක්‍රම දෙකක් තියෙනවා. එකක් තමයි "අප්ග්‍රාෆ්ට් ක්‍රමය", අනික "ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමය", දුම කෙලින්ම උඩට යන එක සහ දුම පහළට අරගෙන ඒ විදියට දුම යවන එක තියෙන්නේ. හැබැයි මේකට නර්ඩ් ආයතනය සභාවට ඇස්තමේන්තුවක් එවලා තියෙනවා මිලියන 35 ක. ඒකෙදි ගරු සභාපතිතුමනි, මෙන්න මේ ක්‍රමවේද දෙකෙන් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදය මොකක්ද කියලා අපි අවබෝධයක් ලබා ගන්න ඕන. මට විතරක් නෙමෙයි මේ සභාවේ ඉන්න අනෙක් මන්ත්‍රීවරුන්ටත් ඒ අවබෝධය ගත්තොත් හොඳයි. ඒ සඳහා මම දන්න විදියට නර්ඩ් ආයතනය එවලා තියෙන ඇස්තමේන්තුවේ නම් තියෙන්නේ "අප්ග්‍රාෆ්ට් ක්‍රමය" යටතේ මේක හදන්න ඕන කියලා. ඉතිං රජය පිළිගනිපු ආයතනයක් තමයි නර්ඩ් ආයතනය. නර්ඩ් ආයතනය කියනවා පරිසර අනුකූලතාවය තිබෙන්නේ මේකට කියලා. පරිසර අධිකාරිය කියන්නේ මේ ක්‍රමයට සහතිකයක් දෙන්න පුළුවන් කියන කාරණාව. ඒ නිසා ගරු සභාවෙන් මම ඉල්ලීමක් කරනවා මේ ටෙන්ඩරය දෙන්න කලින් පරිසර අධිකාරියෙයි, නර්ඩ් ආයතනයෙයි නිලධාරීන්ව ගෙන්වලා ගමේ අයට සාකච්ඡාවක් ලබා දෙන්න. අපිට මේ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න ඕන. අපිට ඒ අහන ප්‍රශ්න වලට උත්තර දෙන්න අවබෝධයක් තියෙන්න ඕන. ඒ නිසා මේකට අපේ විරෝධතාවයක් නැහැ. ගමේ ජනතාවගෙන් සුළු පිරිසකගේ විරෝධතාවය තියෙන්නේ. ඒවා පාලනය කර ගන්න පුළුවන්. අපිට ඒක තේරුම් කරලා දෙන්න පුළුවන්කමක් තියෙනවානම් වටිනවා. ඒක නිසා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා නුදුරු දිනයක පරිසර අධිකාරියෙන්, නර්ඩ් ආයතනයෙන් නිලධාරීන් ගෙන්වලා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් එක්කත් සාකච්ඡාවක් දෙන්න. එතකොට අපිට ඒ අයගෙන් ප්‍රශ්න අහලා අපිට මේකෙ ඇත්ත නැත්ත අවබෝධ කරගෙන ඒ ජනතාවට ඒක පැහැදිළි කරන්න ඕන. මේකට අපි අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න සූදානම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඉතාමත්ම හොඳ අදහසක්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒ එක්කම පොඩ්ඩක් මේක මතක් කරන්න ඕන. අපි සියළු දෙනාගේම අවශ්‍යතාවය මත මේ කරන දේට චනක චමල් මන්ත්‍රීතුමා අදහස් දැක්වූවා. යම් සුළු පිරිසක් තමයි හැමදාම මේකට විරෝධතාවය දක්වන්නේ. පහුගිය වෙච්ච සිදුවීම් එක්ක බලනකොට මම ඉතාම ගෞරවයෙන් සහ නිහතමානීව ඉල්ලීමක් කරනවා බුද්ධිමත් මන්ත්‍රීවරුන්ගෙන්, කොට්ඨාශයේ සුළු පිරිසක් ඒ ගමේ ඉන්න සුළු පිරිසක් සමග එකතු වෙලා නැවත විරෝධතා වලට යන්න හදනවා. ඒ අයට ඇත්ත නැත්ත පහදලා දීලා ගමේ හැම දෙනාටම මේක ඉදිකිරීම වැදගත් කියලා අවබෝධ කර ගෙන පටු අදහස් වලින් අයින් වෙලා දැන්වත් බුද්ධිමත්ව මන්ත්‍රීවරු කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුරුහරි එහෙම කරන කෙනෙක් ඉන්නවාද.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ. ඔබතුමා කියලා කිවුවේ නැහැනේ මම. මම කාගේවත් නම කිවුවේ නැහැ. ඔබතුමාගේ නම කිවුවේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දහස්වාරයක් සතුටු වෙනවා, මේ යෝජනාව අවුරුදු ගාණකට උඩදී මම ගෙනාවේ. අපි කාගෙන් හරි ඒක කෙරෙනවා නම් ඉතාම හොඳයි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක තමයි කිවුවේ විරුද්ධ වෙන්න එපා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම කවුරු හරි විරුද්ධ වෙනවා නම් ඒක වැරදියි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක තමයි. අදාළ පුද්ගලයා දා ගන්න ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාවට මම තව එකතු කිරීමක් කරන්න තියෙනවා. මොකද දැන් ආදාහනාගාරයේ ඉදිකිරීමේ මූලික බිම් සැකසීම දැන් කරන්න අවශ්‍ය වෙලා තියෙනවා. එතනදී අපේ තාක්ෂණ නිලධාරිතුමා ඉල්ලීමක් කරලා තියෙනවා.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු මහතා ස්ථානීය පරීක්ෂණයෙන් පසුව ගෙපල කැපීමට සහ එහි ඇති ගල් බෝර දමා ඉවත් කරන ලෙස දැනුම් දීලා තියෙනවා. මෙය ප්‍රාදේශීය සභාව මඟින් ඉටු කිරීම සඳහා මහා සභාවේ අනුමැතිය ගන්න ඕන. මොකද ඔබතුමන්ලා දන්නවා අපි ගෙපල කපලා සකස් කරලා ඒ ටික කරලා දුන්නට පස්සේ තමයි මේක ටෙන්ඩර් කරන්න බලාපොරොත්තු වන්නේ. ඒකත් ටෙන්ඩරයට ඇතුළත් කිරීම මම හිතන්නේ නැහැ අවශ්‍යයයි කියලා. ඒ අනුව නරාවල සිට්ටුස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීමට යෝජිත භූමියේ ගස් කපා ගෙපල සකස් කිරීමට සහ ගල් බෝර දමා ඉවත් කිරීම ප්‍රාදේශීය සභා අරමුදල් මඟින් සිදු කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක මම ස්ථිර කරනවා.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනෙක් ඒවා නම් ගැටළුවක් නැහැ. ගල් බෝර දැමීම සඳහා මිල ගණන් කැඳවන්න අවශ්‍ය වෙනවා. ඒක තමයි මේක ඉදිරිපත් කරේ. අනෙක් ඒවා නම් ප්‍රශ්නයක් නැහැ. අපේ ජේ.සී.බී. යන්ත්‍රය යොදවලා කපන්න පුළුවන්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** කැබලිකර විකුණන ඉඩම් සඳහා (වෙන්දේසි ඉඩම්) ඇතුළත මාර්ග, කාණු සහ පැතිබැම් ඉදිකිරීමට එම ආයතනවලින් ඉදිරිපත්කරන සැලසුම අනුව අප ප්‍රාදේශීය සභාව විසින් ඇස්තමේන්තු සකස් කිරීමෙන් අනතුරුව එම ඇස්තමේන්තුවට අදාළ මුදල් අප ප්‍රාදේශීය සභාවට ගෙවීමෙන් පසු එම සංවර්ධන කටයුතු අප ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කමිටුවෙන් ඉදිරිපත් කරපු යෝජනාවක්. මොකද ඔබතුමන්ලා දන්නවා දැන් අර අවුරුදු පහේ ගිවිසුමක් කියලා එකක් ගහනවා. මමත් ඒකට ඒ තරම් එකඟතාවයක් පල කරන්නේ නැහැ. ඊට වැඩිය හොඳයි අපේ සභාවේ සම්පූර්ණ අධීක්ෂණය යටතේ මේක නිලධාරීන් යටතේ සිද්ධ කිරීම.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** මීපාවල, දෙල්ගහවත්ත මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම අත්හැර දැමීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව කරන්නේ වෙන මුකුත් කාරණයක් හින්දා නෙමෙයි. එක පාර්ශවයක් අගතියට පත් වෙන විදියට මේක වෙලා තියෙනවා. අපි දැන් බොහෝ දුරට නිවැරදි කරලා තියෙන්නේ මාර්ගය මැද වතුර පිරෙන එක. ඒක දැන් බොහෝ දුරට නිවැරදි කරලා තියෙනවා. එහෙම නම් මාර්ගය අයිනේ තාප්පය ඉදිකිරීමත් නීත්‍යානුකූල වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන්නේ ගරු සභාපතිතුමා, නීත්‍යානුකූල නැති හැම දේකටම පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් අරගෙන, ඒකෙ ඉංජිනේරු මහත්තයාව ගෙන්වලා මොකක්ද මේකට කරන්න ඕන කියලා උපදෙස් අරගෙන එහෙම කරන්න. මොකද අපේ කට්ටිය ගියාමනේ ප්‍රශ්න තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන තියෙන්නේ අත්පත් කර ගැනීම නවත්වන එක. ඒකට අපේ එකඟතාවයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ අත්පත් කර ගැනීමක් කරන්න ගේන්න මොකක් හරි හේතුවක් තියෙන්න ඇතිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගේන්න හේතුව කාණු පද්ධතියක් සකස් කරන්න කියලානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක තියෙන්න ඕනනේ කොහොමත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ පැත්තේ මිනිස්සු බැමි ගහලා, තාප්ප ගහලා අවහිර කරලා එහා පැත්තේ අයගෙන් අත්පත් කර ගන්න හදනවා. ඒක අසාධාරණ වැඩක්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමාගේ යෝජනාව ස්ථිර කරලා තියෙනවා. ඒකෙන් අනිවාර්යයෙන්ම ඒක පාර්ශවිකව, එක පුද්ගලයෙකුට කරන අසාධාරණයක් ඒ වෙන්නේ. කාණුවක් සකස් කිරීම නෙමෙයි අවශ්‍යතාවය වෙලා තියෙන්නේ. ඒක බොහොම පැහැදිළියි. ඒ නිසා ඔබතුමාගේ යෝජනාව ස්ථිර කරලා තියෙනවා. ඒ කටයුත්ත සිදු කිරීම සභාවෙන් විය යුතු නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ගැටළුව සම්බන්ධව තාක්ෂණ නිලධාරිට සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී,

- කාණුව ඉදිකිරීම සඳහා අඩි එකහමාරක බිම් තීරුවක් අත්පත් කර ගැනීමට සාකච්ඡාවන් සිදු කොට මැනුම් කටයුතු සඳහා යොමු කළ බවත්, මැනුම් කටයුතු සිදු කිරීමේදී අනුරේඛනය අඩි 04 ක් දක්වා මිනින්දෝරු මහතා විසින් සකස් කර ඇති බව.
- අඩි 04 ක බිම් තීරුවක් අත්පත් කර ගැනීම වෙනුවට අඩි එකහමාරක බිම් තීරුවක් අත්පත් කර ගැනීම මඟින් මෙම ගැටළුව නිවැරදි කළ හැකි බව.
- දැනට පාර පුරවා ඇති ස්ථානයෙන් වතුර කාන්දු වී අසළ ඉඩමක ළිඳක් අපිරිසිදු වන බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පැමිණිලි ලැබී ඇති බවට දැනුවත් කර ඇති බව, පාරේ එක් පසක ජලනල පද්ධතියක් එළා ඇති බවත්, අනෙක් පස ළිඳක් ඇති බවත්, මෙම ස්ථානය සඳහා කාණුවක අවශ්‍යතාවය පවතින බවත්.
- මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කරන ලද්දේ අප ප්‍රාදේශීය සභාවෙන් නොවන බවත්, මාර්ගයේ ජලය රඳා පැවතීමේ ගැටළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ පොලීසිය හරහා අප ප්‍රාදේශීය සභාව වෙත යොමු කළ බව.
- මෙම මාර්ගයේ පළල අඩි 08 ක් බවත්, මාර්ගයේ නම කනත්ත පාර ලෙස සඳහන්ව ඇති බවත්, මාර්ගයේ පළල නියමිත පරිදි ඇති බවත්.
- පාරේ මැදින් හෝ අයිනෙන් කාණුවක් දැමීම සම්බන්ධව ප්‍රදේශවාසීන් සමඟ සාකච්ඡාවක් පැවැත්වුවද, ඒ සඳහා එකඟතාවයක් හිමි නොවූ බව.
- මීට අමතරව මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ට ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අඩි එකහමාරක් අරගෙන ඒකෙ කාණුව දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාගෙන්ද ගන්නේ එතකොට. දැන් ක්‍රමවේදය ගිහිල්ලා තියෙන්නේ අඩි හතරකටනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම ඒකට දැඩි සේ විරුද්ධයි. එක ඉඩමකින්වත් අඟලක්වත් ගන්න බැහැ සභාපතිතුමා. එහෙමනම් පාර දෙපැත්තෙන්ම පුළුල් කරන්න ඕන. දෙපැත්තෙන්ම කාණු යන්න ඕන. දැනට තියෙන ක්‍රමවේදය අනුව මම මුදල් වියදම් කරලා වතුර වල නැති කරලා තියෙනවා. මන්ත්‍රීතුමන්ලා කියනවා නම් තව වතුර වළක් තියෙනවා කියලා ඒකටත් කොන්ක්‍රීට් දාලා හදන්න සූදානම් මගේ මුදලින්. එහෙම නැතුව පුද්ගලිකව පාර පළල් කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වතුර නම් පාරේ පිරෙන්නේ නැහැ. වතුර පිරෙන එක අපි නවත්වලා තියෙන්නේ. දැන් අපි මේක ඉවර කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැබැයි අපේ මතයත් මේකට සඳහන් කරලා තියන්න. අඩි එකහමාර අරගෙන කාණුව හදන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** බටුවන්තුඩාව මාර්ගයේ සිට මවුන්ට්ප්ලසන්ට් වත්තේ ජන උදාන ගම්මානය දක්වා ඇති මාර්ගයේ ඉතුරු කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** සැලසුම් කමිටු සහ තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු (පරිසර කමිටුව) සඳහා නිලධාරි දීමනාව රු.1000.00ක් දක්වාත්, කා.කා.ස දීමනාව රු.450.00ක් දක්වාත් වැඩි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** දැනට රුපියල් හත්සිය පනහක් ගෙවනවා. මම මේකත් කියන්න ඕන. 2007 ඉඳන් රුපියල් හත්සිය පනහක් තමයි ගෙවන්නේ. කමිටු විසින් ඉල්ලීමක් කරලා තියෙනවා ඒ මුදල වැඩි කරන්න කියලා. ඒ අනුව තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරේ. රුපියල් දෙසීය පනහකින් තමයි වැඩි වෙන්නේ. නමුත් මෙහෙම දේකුත් තියෙනවා ඇත්තටම. බොහෝ නිලධාරීන් මේ සඳහා මහන්සි වෙනවා. ලිපිගොනුවක් ආවම ඒක ගිහිල්ලා බලලා එනවා. නමුත් අපිට අඩුපාඩුවක් තියෙනවා. දැන්නම් ඒක ටිකක් දුරට නිරාකරණය වෙලා තියෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියා මෙතනට එන්න ඕන අනිවාර්යයෙන්ම අපි කමිටුව පවත්වන්න නම්. නමුත් නිලධාරියා එනවා කියලා කිවුවට, සතියකට පාරක්වත් එන්නේ නැහැ. සති එකහමාරකින් කමිටුව තියලා නැහැ. මේ දීමනාව වැඩි වෙනවා වගේම අනිත් පැත්තෙන් ඒ ප්‍රතිලාභය නැවත එන්න ඕන. ඒකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. දැන් නම් ඉතිං කලින් වගේ හිඟ ලිපිගොනු ගොඩක් අඩුයි. සති දෙකක් ඇතුළත කෙනෙක්ගේ ගොඩනැගිලි අයදුම්පත්‍රය හරි, ඉඩම් අනුබෙදුමක් හරි අනුමත කරලා සති දෙකක් ඇතුළත ලබා දෙන්න පුළුවන් මට්ටමේ දැන් තියෙනවා. අරක තමයි ප්‍රධාන කාරණය. අපිට නිශ්චිතව සතියකට දවසක් කමිටුව පවත්වන්න ඕන. ඒකෙ පහුගිය කාලයේදී නම් අඩුපාඩු තිබුණා. දැන් ඒක නිරාකරණය වෙලා තියෙනවා. මේ වෙලාවේදී කමිටුව ගැන ඒකත් සඳහන් කරන්න ඕන.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** මොල්ලිගොඩවත්ත, ගම්සභා පාරේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔබතුමන්ලා දන්නවා මේකෙ පොඩි කොටසක් අන්තිමට ඉතුරු වෙලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒක කරේ. බටුවන්තුඩාව මාර්ගයේ සිට මවුන්ට්ප්ලසන්ට් වත්තේ ජනඋදාන ගම්මානයට යන මාර්ගයෙත් එහෙමමයි තියෙන්නේ. ඒකත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලක්ෂ 15 ක වැඩ කරලා පොඩි කොටසක් ඉතුරු වෙලා තියෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** මොල්ලිගොඩවත්ත, ටී.ඒ. අනෝමා මහත්මියගේ ඉඩම හරහා ගලා බසින කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක ප්‍රියන්ත මන්ත්‍රීතුමා ගිය සභාවකදීත් ඉදිරිපත් කළා. නමුත් අපි ඒක යැව්වා පළාත් පාලන දෙපාර්තමේන්තුවට. අපිට එහෙන් මුදල් ලබා ගන්න තමයි ඒ වෙලාවේදී ඒක යැව්වේ. නමුත් පස්සේ බලන කොට කාණු පද්ධතියෙන් තුනෙන් දෙකක වගේ කොටසක් ඒ අයම කර ගන්නම් කිවුවා. ඉතුරු මීටර් 26 ක වගේ සුළු කොටසක් තමයි කාණු පද්ධතිය විදියට අපිට සකස් කරන්න වෙන්නේ. ඒකට තමයි මම මේ යෝජනාව කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** පහත දක්වා ඇති විශ්‍රාම ගොස් සිටින සේවකයන්ගේ සය මාසික කොන්ත්‍රාත් පත්වීම, ඔවුන්ගේ ස්ථිර පත්වීම ලබා ගන්නා දිනය දක්වා පසුදාතම් කොට කොන්ත්‍රාත් පත්වීමේ කාලය දීර්ඝ කිරීමට යෝජනා කරමි.

| අනු අංකය | සේවකයාගේ නම | තනතුර | කොන්ත්‍රාත් පත්වීමේ දිනය | කොන්ත්‍රාත් පත්වීම අවසන් වූ දිනය | ස්ථිර පත්වීම ලැබූ දිනය | විශ්‍රාම ගැන්වූ දිනය | පසුදාතම් කරන ලදකොන්ත්‍රාත් පත්වීම් ලිපිය නිකුත් විය යුතු කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | යූ.පී. අමරදාස | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 1997-10-01 | 1998-03-31 | 2003-07-01 | 2016-08-21 | 1997-10-01 සිට 2003-06-30 |
| 02 | එම්.කේ.ජයන්ත | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 1997-10-01 | 1998-03-31 | 2003-07-01 | 2020-08-17 | 1997-10-01 සිට 2003-06-30 |

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ගැන සඳහනක් කරන්න ඕන. මේකෙදී ඒ අය විශ්‍රාම යනකම් තිබුණේ මාස හයකට බඳවා ගැනීමේ පත්වීමක්. වෙන මුකුත්ම තිබුණේ නැහැ. ඒක දැන් පසුදාතම් කරලා නිවැරදි කරන්න ඕන. තාම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කරලා නැහැ. මේ අයගේ තියෙන අඩුපාඩුකම් ටික සම්පූර්ණ කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ජයන්ත මහතාට විශ්‍රාම වැටුප දැන් ලැබෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාට ලැබුණා. ඒ වෙන කොට මේ දෙන්නාගේම ප්‍රශ්නය තිබුණා. එක්කෙනෙකුට ලැබුණා. අනිත් කෙනාට ලැබෙන්නේ නැහැ මේක නිවැරදි කරලා එනකම්. මම දන්නේ නැහැ මේක මොන ක්‍රමයෙන් වුණාද කියන්න. අනිත් කෙනාට ඒක හරි ගියා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අමරදාස මහතාගේ එකත් හැකි ඉක්මනින් කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මේ කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අඩුපාඩුවක් තියෙනවා මේකෙ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 13.** ගල්කැටිය, ගොන්නගහවත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 14.** අඹගහවත්ත, පළමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 15.** බටුවන්තුඩාව පීල්ලේ ජලය දැඩි අපිරිසිදු තත්ත්වයට පත්ව ඇත. පීල්ලේ ජලය පරීක්ෂා කිරීමටත්, අපජලය පීල්ලට එක්වන ස්ථාන හඳුනාගෙන එම මූලාශ්‍ර ඉවත්කොට පිරිසිදු ජලය පමණක් ගලා ඒමට අවශ්‍ය ජල මූලාශ්‍රයන් ආරක්ෂා කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා මීට කලින්නුත් මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් කිහිපදෙනෙක්ම මේ යෝජනාව ගෙනාවා. දැන් මම එතනට යන එක අවස්ථාවකදී දැක්කා සම්පූර්ණයෙන්ම ජරා වතුරක් එන්නේ. මිනිස්සුත් එතන නානවා. ඒක හින්දා අපි පොදු වැඩපිළිවෙලක් හදමු. මේක පොදු සම්පතක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදි මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙන්නේ. එතන අර බුබුලේ ඉඳන් එන වතුර ටික එනවා හරියට. ඒ වතුර ටික එනවා. අර පැත්තේ කන්දේ ඉඳන් එන වතුර පාර මඩ එක්ක තමයි ඔතනට එන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ෆිනෑන්ස් ආයතනය ලවා කරවන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ කොටසක් වෙනම කාණුවකින් යනවා. නමුත් වැස්ස වැඩි වුණාම ඉතිරි කොටස මේකට එනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් අවුරුදු පහ සම්පූර්ණ වෙලා නැහැ තාම ඒකට. ඒ අය ලවා මේක කරවන්න ඕන. නැත්නම් අපිට හැමදාම පස් අයින් කරන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම යෝජනාව සමඟම ඉදිරිපත් කරනවා මොකක් හරි වැඩපිළිවෙලක් මේකට කතා කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට සභා යෝජනාවක් මම ගත්තා පතුල V ෂේප් එකට කොන්ක්‍රීට් කරන්න කියලා. එහෙම කොන්ක්‍රීට් කරහම හරි. ඒ ජල මූලාශ්‍ර ටැංකිය පතුලේ නැහැ. දැන් එතන ටැංකියේ පතුල කොන්ක්‍රීට් කරොතින් පුළුවන් ඉක්මනට ඒක සුද්ධ කරන්න. මඩ ටික රැඳෙන්නේ නැති වෙන්න සුද්ධ කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මඩ අස්කරන එක නෙමෙයි කරන්න ඕන. අපිරිසිදු ජලය එකතු වෙනවා. පාරෙන් ගලා ගෙන එන වතුර ටිකත් මේකට එනවානේ. අන්න ඒකට වැඩපිළිවෙලක් මේකට හදන්න. අපි දිනයක් කතා කර ගෙන තාක්ෂණ නිලධාරීන් සමඟ සම්බන්ධ වෙලා වැඩපිළිවෙලක් හදා ගමු ඒකට. අපේ නිර්දේශය අපි ලබා දෙමු මේ ටික ක්‍රියාත්මක කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ අයට දන්වා යවන්න මේක කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාවේ මන්ත්‍රීවරු ටික දිනයක් දා ගෙන තාක්ෂණ නිලධාරීන් එක්ක මැදිහත් වෙලා අපි යමු මේක බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 16.** කරාපිටිය සන්සයිඩ් වෙන්දේසි ඉඩමේ අප ප්‍රාදේශීය සභාවට පොදු පහසුකම් සඳහා වෙන් කරන ලද කොටස අතුරුදහන් වී ඇත. ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමටත්, අදාළ බිම් කොටස සභාවට පවරා ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා, එතන ප්‍රශ්නයක් තියෙනවා මම හිතන්නේ. සන්සයිඩ් ඉඩමෙන් සභාවට කොටසක් වෙන් කරලා තිබුණේ නැහැ ඒ කාලෙදී. අක්කර දෙක හමාරට වැඩිනම්නේ වෙන් කරන්නේ සභාවට. කාරක සභාවක් යෝජනා කරලා දිනූෂ මහත්තයට මේ ගැන සභාව දැනුවත් කරන්න අවස්ථාව ලබා දුන්නා නම් හොඳයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක අනූ ගණන් වල එකක්. මාපලගම විමලරත්න මහත්තයාලගේ විශාල ඉඩමක් මේක. දැනටමත් මේකෙ කොටසක් තියෙනවා. මම සැක කරනවා ඒ කොටසට අයිතිකාරයෙක් නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට පරීක්ෂණයක් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැනට කොටසක් තියෙනවා. ඒක අනවසරයෙන් කෙනෙක් භුක්ති විඳිනවා. ඒකයි ඒ ගැන පරීක්ෂණයක් ඉල්ලුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලලා ලබන සභාව වෙනකොට දෙන්නම් විස්තර.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාවට වෙන් කරපු කොටස අතුරුදහන් වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක කොයි කාලෙද දන්නේ නැහැ කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අනූ ගණන් වල කරලා තියෙන්නේ. කැබලි හැත්තෑ ගාණක් තියෙනවා මම හිතන්නේ. ඒ තරම් විශාල ඉඩමක්. අනෙක් කොටසත් එක්ක කැබලි එකසිය අටක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 17.** වෙන්දේසි කරන ලද ඉඩම්වල අප ප්‍රාදේශීය සභාව සතු පොදු පහසුකම් සඳහා වෙන් කරන ලද බිම් කොටස් නැවත පරීක්ෂා කොට, සභාව මැදිහත්වී ස්ථිර හෝ තාවකාලික බෝග වගාකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ කියන්නේ සභාපතිතුමනි, දැන් ගොඩක් තැන්වල සභාවට ඉඩම් කැබලි තියෙනවා. එක්කෝ සභාවෙන් හරි ස්ථිර වගාවක් දාන්න ඕන. පොල් හරි කමක් නැහැ. ජේ.සී.බී. එක තියෙනවා. අපි ගිහිල්ලා ඒක කරන්න ඕන එහෙම කරන්න බැරිකමක් තියෙනවා නම්. ඒ වෙන්දේසි ඉඩමේ ඉන්න ඉඩම් හිමියන් හරහා වගා කරන්න සමිතියකට දෙන්න ඕන. පුද්ගලිකව නෙමෙයි අපි සමිතියකට හරි ඒක ලබා දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 18.** මාකන්වත්ත පන්සල මාර්ගයේ, මාකන්වත්ත පළමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 19.** ජස්ටින් කන්දේ පිහිටි අනතුරුදායක නුග ගස සහා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ වගේම ගරු සභාපතිතුමනි, මට පොඩි අදහස් දැක්වීමක් කරන්න අවශ්‍යයි. දැන් අපි 2021 වර්ෂය සඳහා අයවැය ගෙනල්ලා ඒ කටයුතු කරා. 2021 වර්ෂයේදී විශාල සංවර්ධන කටයුතු කිහිපයක් අපි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒවා වන්නේ ආදාහනාගාරය ඉදිකිරීම, සභා ගොඩනැගිල්ල ඉදිකිරීම, පොළ භූමියේ ගොඩනැගිල්ල ඉදිකිරීම. ඉතිං අපි ඒ කටයුතු සිදු කරන ගමන්ම, අපි මහා පරිමාණ ව්‍යාපෘති සිදු කරන කොට ගම් මට්ටමින් පීඩිත කොටසක් ඉන්නවා දීර්ඝ කාලීනව. අවුරුදු 26 ක්, අයවැය 26 ක් ගේනකම් පීඩාවට පත්වෙච්ච ජනකොටස් ඉන්නවා. වර්තමානයේ ඒවගේම පොදු ප්‍රශ්න කිහිපයක් මේ කොට්ඨාශය පුරා එකතු වෙනවා. උදාහරණයක් විදියට කලේගානෙ කෙනෙක් කතා කරනවා නිතරම වතුර පාරක ප්‍රශ්නයක් ගැන. ඒ මනුස්සයා අත්තිවාරමක් දාලා තියෙනවා. ඒක දවසෙන් ගලවාගෙන ගියාලු. දැන් ඒ වගේ මහා පරිමාණ ප්‍රශ්න නෙමෙයි තියෙන්නේ. ජල පාරවල් වගේ ප්‍රශ්න තියෙන්නේ. කරාපිටිය, පන්විල දූව වත්තේ තියෙනවා වතුර පාරක් සම්බන්ධ ප්‍රශ්නයක්. අඩි 08 ක් විතර ඒ නිවස යටවෙනවා. ඊගාවට කරාපිටියෙ තියෙන මොඩර්න් හාඩ්වෙයාර් එක ගාව තියෙනවා ප්‍රශ්නයක්. ඒ වගේ පොඩි ප්‍රශ්න තියෙන්නේ. ඒ මිනිස්සුන්ට වර්ෂාව දිනයට පමණක් එහෙම වුණාම මහා පීඩාවකට පත් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මෙහෙම කරමු මන්ත්‍රීතුමා. දැන් අඩුම තරමේ කොට්ඨාශයේ ප්‍රශ්න තුනක්වත් ගමු. ඔක්කොම නෙමෙයි මන්ත්‍රීවරයෙකුට පොදුවේ තියෙන ප්‍රශ්න තුනකට සීමා වෙලා කොට්ඨාශ 12 න් ප්‍රශ්න 36 ක් හඳුනාගමුකෝ. ඔක්කොම කරන්න අමාරුයි. අපි අද කියනවා. ඔබතුමත් කියනවා. හෙට වෙන කොට අපිට ඒක අමතකයි. ඒක හින්දා මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා තමන්ගේ කොට්ඨාශයේ ඔහොම තියෙන ප්‍රශ්න තුනක් ගාණේ අපි සාකච්ඡා කරමුකෝ ගිහිල්ලා බලලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මගේ කොට්ඨාශයේ එකක් දැන් කතා කරනවා කරාපිටියේ පන්විලදූව වත්තේ ප්‍රශ්නය කියලා. ඒක මම නිරන්තරයෙන්ම කතා කරනවා. එතන ඇත්ත ගැටළුව වෙලා තියෙන්නේ පීඩාවට පත් වෙන කෙනා එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතියේ සභාපති. ඒ මනුස්සයා අඩි 08 ක් විතර වතුරෙන් යට වෙනවා. පෝලිම්බූත් එකෙත් ඉන්නේ ඒ මනුස්සයා. ඒ පීඩනය අපිත් දකිනවා. ඒක ගැලපෙන්නේ නැහැනේ. ඒ නිසා දේශපාලන භේදයෙන් තොරව ඒක කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙනවානේ. දැන් මම මේ ඒක නොකියත් හිටියා. දැන් මමත් බබෙක් නෙමෙයිනේ. දැන් ඔබතුමන්ලා කමිටුවක් විදියට

ගිහිල්ලා ගෙනාව ඔක්කොම අනවසර ඉදිකිරීම් කියලා හපුගල ටික. මම කියන්නේ ගෙනාපුවගෙන් 90% ක් තියෙන්නේ හපුගල. එතකොට මම මේ දැන් කරන්නේ ඔබතුමාව විවේචනය කරන එක නෙමෙයි. මමත් බබෙක් නෙමෙයි මේකෙ. එතකොට මම කියන්නේ මේ අනවසර ඉදිකිරීම් 13 ට ඇතුළත් වුණේ නැති ඒවා ඇති. ගොඩකන්ද, හිරිඹුර පැත්තේ අනවසර ඉදිකිරීම් නැද්ද. ඒ අදාළ අය අහනවා මගෙන්, දැන් නඩු දාන්න ලේස්ති කරපුවාට මගෙන් අහනවා ඔබතුමා අරක දැක්කේ නැද්ද, ඔබතුමා මේක දැක්කේ නැද්ද කියලා. සමහර වෙලාවට මට කටඋත්තර නැහැ මන්ත්‍රීතුමා. මේක අනිත් එක මගේ කාලයේ හදන්න පටන්ගනිපු ඒවත් නෙමෙයි. මම කියන්නේ මේ කුප්ප වැඩේ කරන්න එපා මේක අස්සේ. විධිමත්ව අපි මේක සද්භාවයෙන් කරන කොට මේ බලු වැඩේ කරන්න එපා. මම ඒක විවෘතව කියනවා සභාපතිවරයා විදියට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම කියන්නේ මගේ කොට්ඨාශයේ තියෙන ඒවත් එකතු කර ගන්න කියලා. දේශපාලන භේදය බලන්න එපා. කෙලින්ම පොදුවේ පීඩාවට පත් වෙන ඒවා බලන්න. මම කතා කරේ මගේ කොට්ඨාශයේ ඒවා ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ. දැන් මෙච්චර ඉදිකිරීම් තියෙනවා. අපි එහෙම නම් පොදුවේ පටන් ගමුකෝ වැඩපිළිවෙලක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක තමයි කතා කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං අපිට දවස් දෙකයි යන්න හම්බ වුණේ. ඒකත් යන්තම් අමාරුවෙන් ගියේ. ඊළඟට ඉන්ද්‍රජිත් මහත්තයාව මෙතනින් නිදහස් කරන්නේ නැහැ. යන්න වාහනයක් නැහැ. තුන් හතර දෙනෙක්ට යන්න වාහනයක් නැහැ. ඕන තැනක එකක් කියන්න අපි එන්නම්. ඔබතුමාටත්, අපි එන්න කිවුවේ ඒකනේ. එහෙම නැතුව ඔබතුමාගේ ප්‍රදේශයේ ඒවා දාන්න ඕන කියලා කතාවක් නැහැ කොහොමවත්. ඇත්තටම එහෙම වුවමනාවක් නැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිබඳව මම පොඩි අදහස් දැක්වීමක් කරනවා. ඔය පන්විලදූව වත්ත මාර්ගයේ පිටවාන සකස් කිරීම ගැන මම එදත් කතා කරා ඇළ දක්වා සුද්ධ කරන්න කියලා. මම හිතන්නේ ඒක සුද්ධ කරොත් හොඳයි. එතන කලින් කාණු පද්ධතියක් තිබුණා කුඹුරු යාය මැදින්. දැන් කුඹුරු යායේ පාත්ති ඒවා දාලා තියෙනවා. ඒකෙන් වතුර බැසීම නැවතිලා තියෙනවා. කාණු පද්ධතිය ගොඩ වෙලා තියෙනවා. ඒ නිසා නැවත පිටවාන ඇළ දක්වා සකස් කරානම් ඒක යථා තත්ත්වයට පත් වෙනවා. ඒක කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේකෙදී සම්පූර්ණයෙන්ම යට වෙන්නේ අඩි 30 ක 40 ක කන්ද උඩ තියෙන ගෙවල් වගයක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම වෙන්නේ තාප්ප හින්දා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අනවසර ඉදිකිරීම් සහ තාප්ප හින්දා ඒක වෙන්නේ. මම මේ ගැටළු ගැන කමිටු පටන් ගන්න කලින් ඉඳලම කතා කරා. ඒක හින්දා මම කියන්නේ එක තැනක නෙමෙයි බෝපෙ පෝද්දල බලප්‍රදේශයේම පීඩාවට ලක් වෙච්ච කොටසක් ඉන්නවා. එක්කෝ ඒ අයට මෙතනට එන්න හැකියාවක් නැහැ. දේශපාලන වශයෙන් හෝ ආර්ථික වශයෙන් මොනවා හරි ප්‍රශ්න තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. නමුත් මම වඩාත් කැමති මේ 13 හරි බලප්‍රදේශය ආවරණය වෙන්න වුණානම්. අපි විවෘතව ගත්තම මෙතන තියෙන ඒවායින් මුල් එක හපුගල. ඊට පස්සේ දහනායක එක හපුගල. නන්දන විජේවික්‍රමගේ එක හපුගල. ඊට පස්සේ ලීඩ්ස් එක හපුගල. ඒක තමයි මම කියන්නේ මේකෙදී අනවසර ඉදිකිරීම් විදියට තියෙන්නේ මේ ටික විතරද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම කීපයකට එක්ක ගෙන ගියා. ඉතිං මට මේ ටික අරගෙන ගිහිල්ලා කරන්න බැහැනේ. ඒක තමයි මම නිරන්තරයෙන්ම සභාවේදී මේ ගැන අදහස් දැක්වුවේ. ඒ මිනිස්සු පීඩාවට පත් වෙන එකට අපි විසඳුමක් ලබා දෙමු. මහා ගැටළු නෙමෙයි මේවායේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දකින්නෙත්, මම කියන්න හැදුවෙත් වෙන දෙයක් නෙමෙයි. මේ කමිටු කතා හරියන්නේ නැහැ. මම ඒ කමිටු ටිකෙන් ගනිපු ටික කරනවා. අනිවාර්යයෙන්ම මේ 13 ටයි, ලීඩ්ස් එකටයි, ඒ 14 ට කරනවා. අනිත් එක කොට්ඨාශයේ මන්ත්‍රීවරයා දෙන්නකෝ මගේ කොට්ඨාශයේ මෙන්න මේ ටික තියෙනවා කියලා. මගේ කොට්ඨාශයේ මේ ටික තියෙනවා කියලා කෙලින් කියන්න බැරිනම් මේකට හරි කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කොට්ඨාශයේ මන්ත්‍රීවරයා කියලා කියන කොට මගේ හිතවත් කෙනෙක් නම් මම දෙන්නේ නැහැනේ. ඒක හින්දා පොදුවේ බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මම දැන් පොදුවේ බලන්නේ. මගේ හිතවත්කම් ඔක්කොම අතහැරලා දාලා කමිටුව ගන්න තීරණ ක්‍රියාත්මක කරන්නේ ඒකයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම මේ සාධාරණව කියන්නේ. මගේ මිනිහෙක් වුණොත් මම දෙන්නේ නැහැනේ ඇත්ත කතාව. මම තරහා මිනිහෙක්ගේ නම් මේකට දාන්න ඕන. එහෙම තමයි තියෙන්නේ. එහෙම නැතුව අපි මේකෙ තියෙන ප්‍රශ්නය හඳුනා ගන්න කියලා මම යෝජනා කරන්නේ. මුළු බෝපෙ පෝද්දල තියෙන ප්‍රශ්න ටික හඳුනා ගෙන ටිකකට හරි අපි විසඳුමක් දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීපාවල ගියාද, එකක් හරි තියෙනවද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, එදා ඇත්තටම ඔබතුමා ඒ හිතන පැත්තෙන් අපි කටයුතු කරේ නැහැ. සමාවෙන්න ඕන. අපි එහෙම හිතලා කරේ නැහැ. එදා ලැබිච්ච වාහනයෙන් සුගත් මන්ත්‍රීතුමා සමඟ දැන් වෙන්දේසි වෙන ඉඩම් බලන්න ගියේ. ඒ යන ගමන් රවුම ගියා මීපාවලට වෙනකම්. එනකොට රෑ වෙලා. මෙතුමන්ලාගේ පෞද්ගලික යතුරු පැදියෙන් ආවේ. තිස්ස මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ ගල් බැමි පවා බැලුවා. වරදවා තේරුම් ගන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. එහෙම වුණේ මොකද දන්නවාද, ඔය නඩු දාන්න ලේස්ති කරපු ඒවගේ ලියුම් යැව්වානේ. ඒ ලියුම් අරන් ඇවිල්ලා මගෙන් අහනවා අහවල් අහවල් තැන තියෙනවා ඔබතුමා සභාපති වෙලා තමන්ගේ කොට්ඨාශයේ තියෙන එකට විතරද නඩු දාන්නේ කියලා. අහවල් තැන තියෙන එකට ගනිපු ක්‍රියාමාර්ගය මොකක්ද කියලා අහනවා. එතකොට මගේ පැත්තෙනුත් අපහසුතාවයට ලක් වෙනවා. මම ඒක කරන එක කරනවා. මම ආපු අයටත් කියලා යැව්වේ මම මේකෙදී පටන් ගනිපු වැඩේ කරනවා කියලා.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අනිත් එක තමයි ගරු සභාපතිතුමා, ඔය කියන ටික හැමදාම මේ සභාවේදී කතා වුණා. ලීඩ්ස් එක, දහනායක හාඩ්වෙයාර් එක ගැන හැමදාම කතා වෙච්ච ටිකක් මේ සභාවේදී. ඒ නිසා ඔබතුමාව ඉලක්ක කරලා අපි එහෙම කරේ නැහැ. එතනට අපි තල්ලු වෙන්නෙත් නැහැ. ඒ නිසා දැන් ඉදිරියේදී අනෙක් ඒවාටත් ගිහිල්ලා වාර්තාව ලබා ගනිමු කියලා මම කමිටුවේ සාමාජිකයෙක් විදියට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඊළඟට මම ගිය සභාවාරයේදී ප්‍රශ්නයක් ඇහුවා. අපිට ලියුමක් ඇවිල්ලා තියෙනවා අනවසර ඉදිකිරීමක් සම්බන්ධව ඔබතුමාගේ කොට්ඨාශයේ. මෙන්න ලියුමක් එවලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර වැඩේ කියන්නේ ඒකත් අපේ සභාවේ කැබ් එකේ ගිහින් ගනිපු ඡායාරූප ටිකක් කියලා ඒ අය ඇවිල්ලා මට කියනවා. ඔබතුමා එවපු වාහනයකින් ඇවිල්ලා මේ ඡායාරූප ටික ගත්තා කියලා කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි ඒක පැත්ත පළාතේ ගියේ නෑ සභාපතිතුමා. වගකීමෙන් කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක අපි දන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කවුද කියන්න දන්නේ නැහැ. ලියුමක් මෙතනට ආවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට එයා ඇවිල්ලා එහෙම කිව්වේ. මම කිව්වා ඒක අදාළ නැහැ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපිත් යන එන තැන එතන. අපි කැබ් එකේ ගියේ නැහැ. මීපාවල ගිහිල්ලා රෑ වෙලා ආවේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කොහේද මේ තැන. මම තැන දන්නෙත් නැහැ හැබැයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අවංකවම සභාපතිතුමා කවුරු කිවුවත් ඒක පිළිගන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට ගියේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේ ලියුමක් ඇවිල්ලා තියෙනවා. ඒක මටත් දීලා තියෙනවා. මම ඒ පාර දුරකථන ඇමතුමක් දීලා මොකක්ද කියලා ඇහුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා ඔය 13 ඉවර කර ගෙන ඉමුකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කවුරුහරි යෝජනා එවනවා නම් ඒවත් එකතු කර ගන්න.

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේක දිගින් දිගට කතා කරලා තියෙනවා. ඔබතුමන්ලා එක්කත් කතා කරලා තියෙනවා. කවුරුත් මේක විශ්වාස කරනවා ඇති.

**20.** ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) - මධ්‍යම පරිසර අධිකාරිය - පහත් බිම් ගොඩ කිරීමේ ආයතන ස්ථානීය පරීක්ෂණයකින් තොරව ව්‍යාපෘති සහ ඉදිකිරීම් සඳහා අවසර දෙන බවක් පෙනීයන බැවින් ස්ථානීය පරීක්ෂණයකින් තොරව එවැනි අවසරදීමක් නොකරන ලෙස අදාල ආයතන වලට දන්වා යැවිය යුතු යැයි යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකද ඒකට පැහැදිළි උදාහරණයක් විදියට කිවුවොත් ඔබතුමාට අපි කාටත් නිකං බැලූ බැල්මට පේන එකක් තමයි අර සඳර්න් කන්ස්ට්‍රක්ෂන්ස් එක. එතනට ගියාට පස්සේ අඩි 100 ක විතර උස මේවා එකක් තියෙනවා. මොකක්ද දීලා තියෙන විදික්‍රමය. ඒ කන්ද කඩා ගෙන යනවා. ගල් ටිකක් ගෙනිහිල්ලා කුට්ටි පිටින් තියලා තියෙන්නේ සම්පූර්ණයෙන්ම. ඒක නිසයි ගරු සභාපතිතුමාට මම ඒ යෝජනාව ගෙනාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 21.** අවදානම් කලාප වල ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අවසරය (NBRO) යම් ව්‍යාපෘතියක් හෝ ඉදිකිරීමක් සඳහා 2011 මාර්තු මස සිට අනිවාර්ය කර ඇත. ඒ අනුව එම ව්‍යාපෘති හෝ ඉදිකිරීම් අධීක්ෂණය කිරීමේ වගකීම පළාත් පාලන ආයතන වෙත පවරා ඇත. එවැනි අධීක්ෂණයක් තාක්ෂණ නිලධාරීන්ගෙන් සිදු නොවන බවට පෙනී යන බැවින් ලිඛිතව ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කොට සම්පූර්ණ වගකීම් ඔවුන් වෙත පවරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙදි ගරු සභාපතිතුමනි, දැන් පාරවල් ගන්න බලන්න. අවුරුදු පහ පැනලා යන කොට මොකද වෙන්නේ. එහෙම පැනලා ගිහිල්ලා තියෙනවා නිකම්ම කිසිම දෙයක් ක්‍රියාත්මක නොවී. උදාහරණයකට ගත්තොත් ඇක්සස් එකේ මුල් කොටස කරලා අවුරුදු පහ පැනලා දැන් මාස ගණනයි වෙන්නේ. නමුත් ඒ කිසිම දේකට අවශ්‍ය දේවල් වෙලා නැහැ ගරු සභාපතිතුමනි. ඒක ඔබතුමාට බලන්න බැහැ. දැන් උදාහරණයකට කිවුවම දැන් බලන්න වටරැක නගරිගෙවත්ත. මේකෙ පාර සෑදීමේදි ඇත්තටම බොහොම පැහැදිළිව තියෙනවා අධීක්ෂණය සම්පූර්ණයෙන්ම සභාවෙන් කරන්න ඕන කියලා. දැන් එන්.බී.ආර්.ඕ. එක දුන්නා නම් ඩිසයින් එකක්, ඒකෙ ගේ හදන කොට අනිවාර්යයෙන්ම අපේ තාක්ෂණ නිලධාරීන් විසින් අධීක්ෂණය කළ යුතුයි. එහෙම කරලා තියෙනවද කියලා බලන්න. එහෙම කරපු බවක් අපිට පේන්නේ නැහැ. ඒ නිසා මම මේ යෝජනාව කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මේකෙන් අදහස් කරන්නේ මොකක්ද, අපි ඒ ගොල්ලන්ව යවන්න ඕනද වගකීම ඒ අයට තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැහැ. ඒ ගොල්ලන්ට නෙමෙයි. අපේ නිලධාරීන්ට එන්.බී.ආර්.ඕ. එකෙන් ඩිසයින් එකක් දෙනවා. ඒ අය බොහෝ තැන් වලට ඇවිල්ලා බලලා නෙමෙයි දෙන්නේ. මම බොහොම පැහැදිළිව කියලා තියෙනවා. ඔප්පු කරලා තියෙනවා. ඒවා ලිඛිතව තියෙනවා. අඩු තරමින් පහත් බිමක්ද කියන එක දන්නේ නැතුව තමයි තරංගා ලෑන්ඩ් සේල් එකට දෙන්නේ. ඔබතුමන්ලා අපි දිගටම විරුද්ධ වුණේ ඒකට. දිගටම අවසර දුන්නේ ස්ථානීය පරීක්ෂණයක් නොකර. ඒක ඒ අය දීපු උත්තරයේම තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි අබේසේකර මන්ත්‍රීතුමා ඒකට තමයි අපිට ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය ලැබෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මම කියන්නම්. මේක කාටවත් විරෝධාකල්පයක් නෙමෙයිනේ. මේක නිවැරදි වෙන්න ඕන එකක්නේ. ඔබතුමන්ලා කියන්නකෝ. අද යන්න ගල් ගොඩක් විතරයි තියෙන්නේ වටරැක, නගරිගෙවත්තේ, කොඩිතුවක්කු ඉඩමේ. ගල් ගොඩක් විතරයි තියෙන්නේ. අවුරුදු කීයක්ද ගිහින් තියෙන්නේ ඒකෙ. එතකොට කවුද මේක අධීක්ෂණය කරන්නේ. බොහොම පැහැදිළිව පනතෙන් පවරලා තියෙන්නේ අදාළ ප්‍රදේශයේ තාක්ෂණ නිලධාරීන් මේක බලන්න ඕන කියලා. ඒ අය දෙන නිර්දේශයන් එක්ක තමයි මේක කරන්නේ. මේකට වෙනස් විදියකින් යෝජනාවක් ගෙනාවා. ඒක තමයි ඉස්සෙල්ලා ආවේ සභාවට මුදල් අරගෙන කරන්න කියලා. මම අවුරුදු ගාණකට උඩදීත් ඒ යෝජනාව කරා. එතකොට අඩුම ගාණේ ඒක කරා නම් අපි දන්නවානේ. අපේ කවුරු හරි කරනවානේ. වෙන ප්‍රතිලාභත් තියෙනවානේ අපේ මන්ත්‍රීවරුන්ට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මොකක්ද දන්නේ නැහැ ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තමන්ගේ ප්‍රදේශයේ කර්මාන්ත ටික හරියට කරන්න පුළුවන් නේ. එතකොට ඒ පැත්තේ අවට දෙන්නට ගහ ගන්න ඕන නැහැ. මම ඒ යෝජනාව කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 22.** 2018.06.12 මහා සභාව වෙතද මෙම යෝජනාව අංක 12 සහ 13 යටතේ ඉදිරිපත් කොට ඒකමතිකව සහ සම්මත වී ඇත. එහි ජායාපිටපතක් ඉදිරිපත් කරන අතර එම යෝජනා ක්‍රියාත්මක කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ යෝජනා දෙක තමයි ගරු සභාපතිතුමා දාලා තියෙන්නේ 12, 13 කියලා.

12 වෙනි යෝජනාව වන්නේ "වෙන්දේසි ඉඩම්වල මාර්ග, කාණු පද්ධති, පැති බැම් තැනීමට යන වියදම් ඇස්තමේන්තු කොට එම මුදල් සභාවට ලබා ගනිමින් එම කාර්මාන්ත සභාව මඟින් කිරීමට යෝජනා කරමි. මොනම හේතුවක් නිසාවත් වෙන්දේසිකරුවන්ට මාර්ග, කාණු, පැති බැම් තැනීමට අවසර නොදිය යුතුය." ඒ යෝජනාව ගෙනල්ලා තියෙනවා. එතකොට ඒක හරි.

13 වෙනි යෝජනාව වන්නේ "වෙන්දේසිකරුවන්ට ඉඩම් කැබලි කර විකිණීම සඳහා අවසර ලබා දීමේදී නලජලය අත්‍යාවශ්‍ය කරුණක් වන අතර, මොනම හේතුවක් නිසාවත් නල ළිං වලින් ජලය ලබා දීමට එකඟව වෙන්දේසිය සඳහා අවසර නොදිය යුතු බව යෝජනා කරමි.(මෙම යෝජනාව පහුගිය සභාවක ඒකමතිකව සම්මත වී ඇත.)" ඒ යෝජනාව මම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 23.** වෙන්දේසි ඉඩම් වලින් සභාවට පොදු පහසුකම් සඳහා යම් කොටසක් හිමි වේ නම් එම කොටස වැට මායිම් ගසා භාර දෙන ලෙස එකඟතා ගිවිසුමට ඇතුලත් කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හොඳයි හැබැයි. ඒක හොඳ යෝජනාවක්. හැබැයි ඔක්කොම වෙන්දේසි ඉඩම් ඒකයි මට ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ මම කිවුවනේ. දැන් අපි මොනවද යෝජනා කරන්නේ. ලයිට් දාලා දෙන්නේ නැත්නම් එතනින් ගියාම අපිට පාරවල් කරන්න දෙන්නේ නැත්නම් මොකද කරන්නේ. මම දිගටම ඉදිරිපත් කරලා ඇති. වැඩක් වෙන්නේ නැති හින්දා දාන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 24.** වෙන්දේසි ඉඩම් වල අවුරුදු 05 ක් යනතුරු නඩත්තු කිරීම සම්බන්ධව සම්පූර්ණ වගකීම තාක්ෂණ නිලධාරීන් වෙත පැවරීමටත්, අබලන් වූ මාර්ග සහ කාණු නැවත පිළිසකර කිරීම සම්බන්ධව වෙන්දේසි සමාගම් දැනුවත් කර, ප්‍රතිචාර නොදක්වන සමාගම් සහ

පුද්ගලයන්ට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් එම සමාගම් අසාධු ලේඛනයට ඇතුලත් කොට සියලුම පළාත් පාලන ආයතන දැනුවත් කිරීම සඳහා කටයුතු කරන ලෙසත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කියන්නේ දැනුවත් කරලා මේ අය ප්‍රතිචාර නොදක්වපු ඒවාට ලෙටර් ඩිමාන්ඩ් එකක් යවන්න නීතිඥයෙක් මාර්ගයෙන්. යවලා ඉවර වෙලා ඒ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්න. මේ අයට ඒක දන්වලා විතරක් නෙමෙයි අනෙක් සියළු සභාවල් වලට මේ ආයතනය වැඩ කරන්නේ මෙහෙමයි කියන එක දැනුවත් කරන්න ඕන. මම ඒ යෝජනාව කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 25.** වෙන්දේසි සමාගම් වෙන්දේසි සඳහා අවසර ලබා ගැනීමේදී සමාගම සම්බන්ධ නොවී ඉඩම්හිමියා ඉදිරිපත් කොට ඉඩම් වෙන්දේසි කිරීමේ අලුත් ප්‍රවණතාවක් පවතී. එම ක්‍රියාවේ ඇති අනතුරුදායක තත්වය පිළිබඳව ඉඩම් හිමියන් දැනුවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් සභාව සාකච්ජා කොට ගන්නා මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කියන්නේ දැන් කරන්නේ ඇත්තටම සභාපතිතුමා ඉඩම් හිමියාගේ නමින්. පහුගිය කාලයේදී ඔබතුමන්ලා දීපු ලේඛනවල ඒක තියෙනවා. දැන් ඇත්තටම කොම්පැනිය නෙමෙයි කරන්නේ. එතකොට කරන්නේ පුද්ගලයෙක්ගේ නමින්. දැන් උදාහරණයකට උළුවිටිකේ එකක් තියෙනවා. ඒක අපි දන්න ඉතාම අහිංසක මිනිස්සුන්ගේ වුවමනාවට දීපු එකක්. මදනායක කියන අය ඒක දුන්නේ. දැනටමත් ඒ පාරවල් ඉවර වෙලා ගිහිල්ලා තියෙනවා. අර තාප්පය කඩා ගෙන ගියා. ඒ වෙලාවේ කඩා ගෙන ගියපු එක හොඳයි. නැත්නම් මේ අය ගියාට පස්සේ වුණානම් කාගෙන් ගන්නද, ගන්න කෙනෙක් නැහැ. එතකොට ඊළඟට මේ අය දන්නේ නැහැ කවදා හරි දවසක බදු ගෙවන්න වෙනවා ඉඩම් හිමියට. ඉතිං ඒ නිසා මේකට මම යෝජනා කරන දේ තමයි මේ විදියේ වෙන්දේසි ඉඩමක් ආවට පස්සේ ඒ ගැන දැනුවත් කරන්න ඕන. මම හිතන්නේ ඒකට ලිපියක් හදලා ඒක දෙනකොටම දෙන්න ඕන එයාට මෙන්න මේ තත්ත්වය ආවොත් ඔය ගොල්ලෝ මේකෙ වගකීම ගන්න ඕන කියලා අවුරුදු පහක් යනකම්. ඔබතුමාට තමයි නැත්නම් මේකෙ වගකීම දරන්න වෙන්නේ කියලා ඒ අයට කියන්න ඕන. ඊළඟට ආදායම් බදු ගෙවන ප්‍රශ්නය කොයි වෙලාවක හරි ඒවි කියලා ඒ අයව දැනුවත් කරන්න ඕන. ඉතිං මම ඒ යෝජනාව කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 26.** බටුවන්තුඩාව වතුර ටැංකිය පාර තරංගා ලෑන්ඩ්සේල් වෙන්දේසි ඉඩමේ සහ බටුවන්තුඩාව ග්‍රෑන්ඩ් පැනරෝමා අක්කර 4 ඉඩමේ (බටුවන්තුඩාව - හපුගල මාර්ගයට මුහුණලා) අක්‍රමවත්ව සිදු කර ඇති ඉදිකිරීම් නිරීක්ෂණය සඳහා සැලසුම් කමිටුව - ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිලධාරියෙකු සමඟ දිනයක් අප අධීක්ෂණ කමිටුවට ලබා දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් එක්ක පුළුවන් ඕන නම් කතා කරන්න අපි දැනුවත් වීම සඳහා ලබා දීලා තියෙනවා ඔතන මෙහා පැත්තේ ඉඩමක් වෙන්දේසි කරන්න දීලා තියෙන එක. ඔතනම ඔය කියන වතුර ටැංකිය පහළ ඒක කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කිවුවේ ඒ සියළු දේවල් වලට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව දැනුවත් වෙන්න දාලා තියෙනවා. ඒක දැක්කද ඔබතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මේ බලාගෙන යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුළුණකුත් හදන්න අවසර ඉල්ලලා තියෙනවා මේකත් දාලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං මේ සියල්ල දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි සංවර්ධන බලපත්‍රය දීලා තියෙනවා. ඔබතුමන්ලත් බලලා අඩුපාඩු තියෙනවානම් අපිට ඉදිරිපත් කරන්න. සංවර්ධන බලපත්‍රය දීලා තියෙනවා මේ ඉඩමට. ඔය කියන තරංගා ලෑන්ඩ්ස් ඉඩම තියෙන්නේ, ඊට අල්ලපු ඉඩම මේක. දැන් ඒක සුද්ධ කරගෙන යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනිත් එක තමයි සභාපතිතුමා සුද්ධ කරන්න ඉස්සෙල්ලා සභාව දැනුවත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව දැනුවත් කරලා තියෙන්නේ. සංවර්ධන බලපත්‍රය දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හුඟක් ඒවා සුද්ධ කරලා, කපලා කොටලා ඉවර වෙලානේ ගෙනත් දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට දීලා තියෙනවා. ඔය ගොල්ලෝ බලලා අඩුපාඩු තියෙනවානම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ආයතනවල අයත් එක්ක ගිහිල්ලා බලන්න ඕන. මොකද හේතුව දැනට කපලා කොටලා කරලා තියෙන විනාශය පේනවා. බොහොම පැහැදිළිව පේනවා. දැන් බටුවන්තුඩාව පාරේ යන කොට පාරේ කට්ටත් ඉවරයි දැන්. හැමදාම පස් ටිකක් දානවා. පස් ටික හෝද ගෙන යනවා. දැන් අර තාප්පයක් හදලා තියෙනවා. දැන් ඒක දැක්කම තාක්ෂණ දැනුමක් නැති වුණාට අපිට හිතෙන්නේ කොහොමද අර තාප්පය හදලා තියෙන්නේ, කොච්චර යටකට කපලා හදලද, මොකක් හරි සැලසුමක් තියෙනවද, පැක්වෙලා තද වෙන කොට තාප්පය කඩා ගෙන යාවි මේකෙ. ඊළඟට වතුර බැහැලා යාමේ ක්‍රමවේදයක් හදලා තියෙනවද රබර් කැල්ලෙන් පහළ කැල්ලට එන්න. ඉතිං මේකට ගරු සභාපතිතුමා ඔබතුමා මැදිහත් වෙලා ඉක්මනින් වැඩපිළිවෙලක් හදන්න ඒ අයව කැඳවලා සම්බන්ධ කර ගෙන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 27.** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ භූමියෙන් කොටසක් කුඨ ලේඛන සාදා අවසතු කොට ඇත. ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වන මෙන් අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 28.** බෝපෙ වඩුගේවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 29.** වටරැක, යහතුගොඩ අතුරු මාර්ගයේ ඉතුරු කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 30.** ශ්‍රී පියරතන පටුමගේ අතුරු මාර්ගය වන වලව්ව පාරේ ඉතුරු කොටස පැති කාණු සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතන සභාපතිතුමා, ප්‍රාදේශීය ලේකම් එකෙන් කොටසක් කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 31.** පියදිගම, කිංග්ස්කොට් වෙන්දේසි ඉඩමේ අප ප්‍රාදේශීය සභාව සතු පොදු පහසුකම් සඳහා වෙන් කරන ලද බිම් කොටසේ ප්‍රජා ශාලාවක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක පියදිගම ග්‍රාම සේවා වසම සඳහා යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රතිපාදන අරමුදල් කොහෙන්ද ලබා ගන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ප්‍රතිපාදන කොහෙන් හරි හොයා ගන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ මුදල් නම් කරන්න පුළුවන්. පිටින් එන මුදලින් දෙන්නේ නැහැ. එහෙම එකක් තියෙනවා. සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිලි කියලා ඒ විදියට තමයි අනුමත කර ගන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ආණ්ඩුකාරතුමාගෙන් ප්‍රතිපාදන ගන්න බැලුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලන්නකෝ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 32.** තුංහිරිපාන, කාල්ටන් සිටි ප්‍රජාශාලාවේ වහල සෑදීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මොකක්ද මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** තුංහිරිපාන, කාල්ටන්සිටි එකේ ප්‍රජා ශාලාවේ ගොඩනැගිල්ල හදමින් පවතින්නේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගමේ අය එකතු වෙලා හදන එකද මේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගමේ අය එකතු වෙලා ගොඩනැගිල්ල හදමින් තියෙන්නේ. ඒ අනුව, වහළ සකස් කර ගැනීමේ අපහසුතාවයක් තියෙන්නේ. අපෙන් ඒකට ලක්ෂ දෙකක මුදලක් ඉල්ලුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** භූමිය සභාවේ නේද.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔව්. අපිට ඒ ලක්ෂ දෙකක මුදලින් වහළ සකස් කරලා දෙන්න කියලා තමයි යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ සැලසුම අනුමත කරලනේ කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 33.** සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි නව වරිපනම් තක්සේරුවක් සිදු කිරීමටත්, මෙතෙක් වරිපනම් අය නොකළ ප්‍රදේශ සඳහාද එම තක්සේරුව හරහා වරිපනම් බදු අයකිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ යෝජනාව මේ පාර වෙනත් විදියකට ඉදිරිපත් වෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව ගෙන එන්න හේතුව වුණේ කිතුලම්පිටිය එදිරිසිංහ මාවතේ මීටර් 100 ක් දුරට යනකම් විතරයි වරිපනම් තියෙන්නේ. ඒක කාපට් පාරවල්, විදුලිය, ජලය ඒ සියළු පහසුකම් ඇති ප්‍රදේශයක්. ඉතිං ඒ ප්‍රදේශයේ පදිංචිකරුවන් මට කිවුවා එයාලගේ වරිපනම් අය වෙන්නේ නැහැ ඒ නිසා එයාලගෙනුත් වරිපනම් අය කරන්න කියලා. තවත් එවැනි ප්‍රදේශ විශාල වශයෙන් ඇති. 40% ක් විතර බලප්‍රදේශයේ වරිපනම් අය වෙන්නේ නැහැ කියලා ඔබතුමා කිවුවා. ඒ සියළු දෙනාටම වරිපනම් අය කරන්න කටයුතු කරන්න කියලා යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මුළු බෝපෙ පෝද්දල බලප්‍රදේශය සඳහාම දැන් වරිපනම් බදු අය කිරීම සුදුසුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ වගේම තමයි පහුගිය කාලය තුල ගෙවිය යුතු හිඟ වරිපනම් තියෙනවා කොට්ඨාශවල. මම හිතන්නේ මේක නරාවල වගේ පැති වලට බලපෑවේ. එහෙට විශාල මුදල් අය කිරීමක් වුණා, අය කිරීමට හදලා දීලා තිබුණා. ඒකෙ අසාධාරණකමකුත් තියෙනවා. 2000 වසරේදී ඕපාත විදුහලට, නරාවල විදුහලට, ගොඩකන්ද විදුහලට කැඳවලා මේක ගැන සාකච්ඡා කරා. ඒක හින්දා සියළුම නිවාස වලට අය කිරීම් කරන්න. හැබැයි අර හිඟ වරිපනම් බදු කියලා පරණ අවුරුදු ගාණක ඒවා දුන්නම ගෙවන එකවත් ගෙවන්නේ නැහැ. ඒකට සාධාරණයක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාගෙන් අවසරයි. සභාපතිතුමනි, මම ඉස්සෙල්ලා අයවැය සම්බන්ධව යෝජනා කතා කරපු නිසා යසරත්න මන්ත්‍රීතුමා කියපු දේට උත්තරයක් දුන්නේ නැහැ. යසරත්න මන්ත්‍රීතුමා යෝජනා දෙක දැම්මට පස්සේ මට කම්කරුවන්ව හම්බවුණේ දවස් තුනයි. ඒ වෙන කොට හෝළුවාගොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරිතුමිය මට කතා කරලා ලේ දන් දීමේ කඳවුරක් තියෙනවා කියලා එතන සුද්ධ කරලා දෙන්න කියලා තිබුණා. ඒ නිසා පළවෙනි දවස එතන සුද්ධ කරන්න යෙදෙව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පී.සී.ආර්. පරීක්ෂණ සිදු කරෙත් එතන.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඒ නිසා එතනට කම්කරුවෝ යෙදෙව්වා. ඊළඟට දැන් අවුරුද්දක් තිස්සේ බෝක්කුවක් දා ගන්න බැරුව ඇල්හේන්ගොඩ ප්‍රශ්නයක් වෙලා තිබිලා දෙවැනි දිනයේදී එතනට කම්කරුවන්ව යෙදෙව්වා. තුන්වෙනි අවස්ථාව හම්බවුණාම උළුවිටිකේ ජයසුමනාරාම විහාරස්ථානයේ කඨින පිංකම තිබුණ නිසා ඒ පාර සුද්ධ කරා. නැතුව එතුමා දාපු යෝජනා නිසා මම නොකරනවා කියලා ගැටුමක් මට ඇත්තටම තිබුණේ නැහැ. ඇත්තටම උපකාර්යාලයෙන් කම්කරුවෝ තුන් දෙනයි ලැබුණේ 10 වෙනිදා. එදා උළුවිටිකේ කඨින පිංකම තිබුණ නිසා ඒ පාර සුද්ධ කරලා දෙන්න කියලා කිවුවා. තුන් දෙනෙක් ඉන්න නිසා මුළු පාරම සුද්ධ කරන්න බැහැ කියලා කිවුවත් මම කිවුවා පුළුවන් තරම් දුරට පාර සුද්ධ කරන්න කියලා. ඇත්තටම මට ඒ වෙලාවේ ඒක බලන්නවත් වුණේ නැහැ. මම හවස එනකොට මට පුදුමාකාර සතුටක් දැනුනේ. මුළු පාරම සුද්ධ කරලා ඉවර කරලා තිබුණා ඒ කම්කරුවෝ තුන් දෙනාගෙන්. මම ඉතිං ඇත්තටම ඒ සම්බන්ධයෙන් උප කාර්යාලයේ කම්කරුවන්ට ස්තුති කරනවා. ඔවුන් හරියාකාරව තමන්ගේ රාජකාරිය කරනවා. මම මේ වෙලාවේදී ඇත්තටම ස්තුතිවන්ත වෙනවා ඒ කම්කරුවන්ට. ඇත්තටම තව කියන්න තියෙන කාරණයක් තමයි යසරත්න මන්ත්‍රීතුමා ඇත්තටම ජනතාව වෙනුවෙන් පෙනී ඉන්න නායකයෙක් කියලා දැන් එතුමා කිවුවා. ඇත්තටම මම කණගාටුවෙනවා මේක ගැන. සපිරි ගමක් වැඩසටහන යටතේ බෝක්කුවක් දාලා සංවර්ධනය කරනවා ඇල්හේන්ගොඩ යටවෙන තැන. එතන පාර උස්සලා සංවර්ධනය කරන තැනක් තිබුණා. එතන ජනතාව කාලයක් තිස්සේ පීඩාවට ලක්වෙන ස්ථානයක්. ඇත්තටම මම ඒ ගැන කණගාටු වෙනවා. ලැජ්ජ හිතෙනවා. මේ මන්ත්‍රීවරු සියළු දෙනාම ඒක දැන ගන්න ඕන. මෙතුමා මගෙන්වත් මේක ගැන අහන්නේ නැතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා ලියුමක් දීලා තියෙනවා. මේ බෝක්කුවේ වතුර බහින්නේ නැහැ, මේ කුඹුරේ අයිතිකාරයොන්ගෙන් අහන්නේ නැතුව මේක කරන්නේ කියලා. ඇත්තටම එතුමා සතුටු වෙන්න ඕන මේ වගේ දෙයක් කරන එක ගැන. එහෙම සතුටු වෙන්නේ නැතුව අපි කරන වැඩපිළිවෙල නිසා අපේ කකුලෙන් ඇදීමක් කරන්න වගේ ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පෙත්සමක් ගිහින් දීලා තියෙනවා. එහෙම කරලා අපේ වැඩේ ඇත්තටම කඩාකප්පල් කරන්න බැලුවා. මම ඒත් වචනයක්වත් කතා කරලා එතුමාගෙන් ඇහුවේ නැත්තේ මම කරන දෙයක් හරියට කෙලින් කරන මනුස්සයෙක් නිසා. මම කවදාවත් වැරදි වැඩක් කරන්නේ නැහැ. ඒ කුඹුරු හිමියාගෙන් අවසර අරගෙන තමයි මම මේ දේට සම්බන්ධ වුණේ. නැත්නම් මම ඇත්තටම මේ දේ කරන්නේ නැහැ. ඒ ජනතාව අවුරුදු ගාණක් තිස්සේ පීඩාවට පත් වුණ ස්ථානයක් මේක. මම දන්නේ නැහැ මෙතුමාට ගොවිජන සේවා එකේ ඉන්න ඉංජිනේරුතුමාට වැඩිය තාක්ෂණික දැනුමක් තියෙනවා කියලා. මම ඒක දැනගෙන හිටියා නම් මම එතුමාගෙන් උපදෙස් අරගෙන තමයි ඒ බෝක්කුව දාන්නේ. බලාගෙන යද්දි ගොවිජන සේවා එකේ ඉංජිනේරුතුමාට වැඩිය මෙතුමාට තාක්ෂණික දැනුමක් තිබිලා තියෙනවා. ඒකටයි මට කණගාටු. මම එතුමා කරන කිසිම දේකට කවදාවත් වචනයක් කතා කරලා නැහැ. ජනතාව දන්නවා ගිය අවුරුද්දේ එතුමන්ලාගේ ආණ්ඩුව තිබුණ කාලයේදී එතුමන්ගේ ඉඩම් වලට යන පාරවල් ටික හදා ගනිපු හැටි. ඒ සංවර්ධන වැඩ කටයුතු කර ගත්තා. ඒ වුණාට මම කවදාවත් ඒ ගැන වචනයක්වත් අහලා නැහැ. ඒ සම්බන්ධව කතා කරලත් නැහැ. ඇත්තටම මම මේකයි කියන්නේ. මම කරන දේ හරියට නිවැරදිව කරනවා. බොහොම කණගාටුයි මන්ත්‍රීතුමා, ඔබතුමා මේ ජනතාව වෙනුවෙන් පෙනී ඉන්නවා කියලා කරන කඩාකප්පල්කාරි වැඩ කටයුතු සම්බන්ධයෙන්.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඉතාමත්ම සතුටු වෙනවා එතුමියගේ අදහස් දැක්වීම සම්බන්ධව. එහෙම තමයි ඉන්න ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමිය, චෝදනාවක් කෙරුවා බෝක්කුව මේවා වෙලා කියලා. මගේ අතින් බෝක්කුවට පෙත්සම් ලියලා නැහැ.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** සංවර්ධන නිලධාරිතුමිය තමයි කිවුවේ. ඒ.ඩී. මහත්තයාට කතා කරලා තිබුණා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මම කියන එක අහගෙන ඉන්න. සංවර්ධන නිලධාරිතුමියට කතා කරන්න දෙයක් නැහැ. මම ඒ.ඩී. මහත්තයාට කතා කරලා කිවුවා ගිහිල්ලා බලන්න බෝක්කුවෙන් වතුර බහින්නේ නැහැ කියලා. මුකුත් ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** බහින්න වතුරක් තියෙන්න එපැයි. වැස්සක් ආවද, බහින්න වතුර නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** දැන් වතුර තියෙනවා. බහින්නේ නැහැ. දැන් තියෙනවා වතුර. ඒක තමයි මම කිවුවේ. කියන එක අහන්න. ඒ කොන්ක්‍රීට් එකක් දාලා තියෙනවා. වතුරේ ඉඳලා අඩියක් විතර උඩින් කොන්ක්‍රීට් එක දාලා තියෙන්නේ. ඒට උඩින් සිලින්ඩර් දාලා තියෙනවා. දැන් ගිහින් බලන්න පුළුවන්. ඔබතුමිය දන්නේ නැහැ. මම ඔය කුඹුරේ බැහැලා වැඩ කරලා තියෙන නිසා දන්නේ. එක්කෝ එහා කොනෙන් දාන්න ඕන, නැත්නම් මෙහා කොනෙන් දාන්න ඕන. මැදින් දාලා තියෙන්නේ. තරහකට නෙමෙයි මම ඒක කිවුවේ. දැන් ඩයස් මහතා කතා කරලා කිවුවා කියලා කිවුවා. කොන්ක්‍රීට් එක දාලා තියෙන්නේ මෙහෙම. අඟල් හයක් යටින් වතුර තියෙන්නේ. වතුර බහින්නේ නැහැ. ඒ කොන්ක්‍රීට් එක අඟල් හයක් යටට ගියා නම් වතුර බෝක්කුව අස්සෙන් බහිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙනවා. දැන් ඇත්තටම ඕක වෙන ලොකු අඩුපාඩුවක්. අපිට තාක්ෂණික දැනුම නැහැනේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක තමයි ඉතින්. මම කිවුවෙත් ඒකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට තාක්ෂණික දැනුම නැහැ. අදාළ නිලධාරියා ඇස්තමේන්තු සකස් කරලා ඒක හරියට කරන්න ඕන. අඩුපාඩුව තියෙන්නේ එතන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමිය ගැන මම මුකුත්ම කතා කරලා නැහැ. ඒ.ඩී. මහත්තයට කතා කරලා කිවුවේ කවුද කියලා කරන්නේ බලන්න. ගොවිජන සේවා එකේ ඉංජිනේරු මහත්තයා කිවුවා බලන්නේ. මම කිවුවා ඉංජිනේරු මහත්තයාට දැන් ගිහිල්ලා බලන්න කියලා වතුර බහින්නේ නැති නිසා. ඔබතුමිය දැන් ගිහිල්ලා බලන්න. අද වතුර පිරිලා තියෙනවා ගඟ වගේ. වතුර බහින්නේ නැහැ. මාළු ටැංකියක් වගේ එතන.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඩයස් අයියා නම් මට එහෙම දෙයක් කිවුවේ නැහැ. එතන වතුර බහින විදියට කරලා දෙන්න ඕන නිසා හැදුවේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමිය ඒක ගිහිල්ලා බලන්න. කලින් දාලා තියෙනවා බෝක්කුවක් ඒකට සභාවෙන්.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි කෙනෙක් ඉන්නවානේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමියට කරන්න දෙයක් නැහැ ඒකට. ඒක ඔබතුමියගේ වරදක් නෙමෙයි. තාක්ෂණික වරද තියෙන්නේ. එතන කලින් බෝක්කුවක් දාලා තියෙනවා. සභාවෙන් බෝක්කුව දැම්මේ. පද්මසේන මාවැල්ල සභාපතිවරයා ඉන්න කොට බෝක්කු දෙක දැම්මේ. ඒ බෝක්කු දෙක තියෙද්දි ඒට ටිකක් එහායින් කොන්ක්‍රීට් ටිකක් දාලා කරන්නේ. එක්කෝ ඒ බෝක්කු දෙක ගලවලා යටට බස්සවලා මේක දැම්මා නම් වතුර බහිනවා. දැන් ගිහිල්ලා බලන්න වතුර බහින්නේ නැහැ. නැතුව මේ කඩාකප්පල් වැඩ කරනවා නෙමෙයි. ඒක පද්මසේන මහත්තයා සභාපති වෙලා ඉන්න කාලේ පාර කැපුවේ මගේ ඉඩමෙන් ඉඩ දීලා. මගේ ඉඩමෙන් පර්චස් 6 ක් දීලා පාර කැපුවේ. ඔය පියදාස මහත්තයාගේ මරණය ගේන්න පුළුවන් වුණේ පාර කපපු එකෙන්.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ප්‍රාදේශීය ලේකම් එකෙන් ඇවිල්ලා කිසි ප්‍රශ්නයක් නැහැ කියලා කිවුවා. ඒට පස්සේ අපි පාරත් සංවර්ධනය කරනවා. ඒක නවත්වන්න බැහැ කාටවත්ම.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මට නවත්වන්න වුවමනාවක් නැහැ. මම මොකටද නවත්වන්නේ. මට අවශ්‍යතාවයක් නැහැ නවත්වන්න. මගේ කුඹුරු ඇත්තෙත් නැහැ.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** දැන් අවසර අරගෙන නැතුව කරා කියලා කියන්න වුවමනාවක් නැහැනේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** දැනුවත් කරේ නැහැ කියලා කිවුවේ. අපි කිවුවේ දැනුවත් කරානම් අඩු ගානේ මෙන්න මෙතනින් බෝක්කුව දාන්න කියලා කියනවා.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ගොවිජන සේවා එකෙන් ඇවිත් බලලා දැම්මේ. ඔබතුමාට ඕන තැන දාන්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මට ඕන තැන නෙමෙයි මිනිස්සු කියන එක අහන්න ඕන.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** මිනිස්සුන්ගෙන් අහන්න දෙයක් නැහැනේ. ඉංජිනේරුවෙක් ඉන්නවානේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඉංජිනේරුවෝ වැඩ කරන විදියට කරන්න ගියොත් මේක කරන්න වෙන්නේ නැහැ. ඒ ඉංජිනේරුවට වැඩිය ගමේ මිනිස්සු දන්නවා.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** තාක්ෂණ නිලධාරිට වඩා දන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරිට වැඩිය දන්න දෙයක් තියෙනවා.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** තාක්ෂණ නිලධාරි ඉන්නේ ඒකටනේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරිට මගෙන් අහන්න කිවුවේ.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඔබතුමාගෙන් අහන්නේ මොකටද,

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමිය මොකටද මගෙන් අහන්නේ. ඔබතුමිය කොන්ත්‍රාත් කරන කොට මගෙන් අහන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** කතා කරලා වැඩක් නැහැ. මම මෙතෙක් කල් කතා නොකර ඉන්නේ මෝඩයොත් එක්ක කතා කරලා තේරුමක් නැති නිසා. ඒකයි මම නිශ්ශබ්දව හිටියේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මෝඩයොත් එක්ක කතා කරලා තේරුමක් නැති නිසා තමයි මමත් කතා නොකර හිටියේ.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඔබතුමා කියනවා අපි අහගෙන ඉන්නවා. හැමදාම කරේ ඒකනේ. අද ඒක නිසා තමයි උත්තරයක් දුන්නේ. අපිට හොර රහසේ ගිහිල්ලා අපේ වැඩ කටයුතු කඩාකප්පල් කරන නිසා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මම හොර රහසේ ගියේ නැහැ. කෙලින්ම කතා කරලා කිවුවේ. හැංගිලා කිවුවේ නැහැ. ඒ.ඩී. මහත්තයා ඔයාට කිවුවේ නැහැ. ඒ.ඩී. මහත්තයට කියන්න ඕන කියලා කිවුවේ. ඔන්න කරපු වැඩේ.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඒක තමයි දැන් මොකක්ද වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මයික් දෙකම ඔන් කරලා දුන්නා තව කතා කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමිය කොන්ත්‍රාත් කරන කොට මම අතගහන්න ආවේ නැහැ එකකටවත්. මම කිවුවේ කරපු වැඩේ හරියට කරලා නැති එක. ඒක තව අගල් හයක් යටින් කොන්ක්‍රීට් දාලා දැම්මා නම් වැඩේ හරි. සභාපතිතුමා ගිහින් ඒක බලන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කේන්ති ගන්න එපා. ඒක හරිගස්සවන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මෙහා කොනෙන් හරි, එහා කොනෙන් හරි සිලින්ඩර් දෙකක් දැම්මා නම් හරි. එක්කෝ පිටවානට දාන්න ඕන. මේක ඔබතුමියගේ වරදක් නෙමෙයි. මැදින් දාලා තියෙන්නේ. ඒ නිසා වතුර බහින්නේ නැහැ. පොඩ්ඩක් ඒ ගැන හොයලා බලන්න. ඔබතුමිය මට චෝදනා කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්ද කරේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඔව්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** සපිරි ගමක් වැඩ සටහනෙන් කරේ. ලක්ෂ 20 සංවර්ධන වැඩසටහනෙන් කරේ. ලක්ෂ පහක් එතනට වෙන් කරා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගිහිල්ලා ඒක පරීක්ෂා කරලා බලන්න. මම එතුමියට මුකුත් කිවුවේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමිය සමඟ සාකච්ඡා කරලා කිවුවා නම් වඩාත් හොඳයි. දෙන්නත් එක්ක සාකච්ඡා කරලා ඒක කිවුවා නම් හරි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමිය තරහා වෙන්න එපා. මම කිවුවේ ඒ.ඩී. මහත්තයාට මේක කවුරුත් එක්ක කතා කරලා කරා නම් කරන හැටි දැන ගන්න තිබුණා කියලා. ගොවියෝ දන්නවා වතුර බහින තැන.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ගොවිජන සේවා එකේ ඉංජිනේරුතුමා ඇවිල්ලා එතන බැලුවේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒ ගොල්ලෝ ආවට ඒ අය වෙලට බහින්නේ නැහැ. ඔබතුමිය කිවුවට වැඩක් නැහැනේ.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඉතිං අපිට ප්‍රශ්නයක් නැහැනේ. ඉංජිනේරුතුමා කියන විදියටනේ කරන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** වෙලට බැහැලා බලන්න ඕන වතුර බහින තැන. අපිට කුඹුරෙත් බැහැලා පුරුදුයි. අපිත් එක්ක සාකච්ඡා කරා නම් කියනවා කරන හැටි. වැස්සත් එකයි, නැතත් එකයි. වතුර බහින්නේ නැහැ. ඕකේ මට ඇති වැඩක් නැහැ.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ කතා කරන්න යන්නේ අර කාසල් වත්තේ ප්‍රශ්නය පිළිබඳව. මේක හරි නිහඬව කතා කරන්නේ. ආවේගශීලිව කතා කරන්නේ නැහැ. සභාපතිතුමාගෙන් පිළිතුරකුත් එපා මේකට. මේ අදහසක් විතරයි දක්වන්නේ අනෙක් මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීමට. මම ඒ අනවසර ඉදිකිරීම් පිළිබඳ ගැටළුව මතු කරා. මට ලියුමක් එවලා තිබුණා මේ සභාවෙන්. මම පීඩාවට සහ අපහසුතාවයට මේක නිසා පත් වුණා කියලා සඳහන් කරා විතරක් නෙමෙයි මම කිවුවා මුලින් අයිතිකාරයෙක් නැහැ කියලා නඩු දාන්න බැහැ කියපු ඉඩමට කොහොමද, ලියුමක් යැවුවේ මේ ආකාරයෙන් අනවසර ඉදිකිරීමක් කරා කියලා. නඩුවක් දාන්න බැහැ කියනවා. පදිංචියක් නැහැ කියනවා ඒ ඉඩමේ. එහෙම පදිංචියක් නැත්නම් ඒ නමට සභාවෙන් ලියුමක් ගියේ කොහොමද, එහෙම යවන්න බැහැ. මට එහෙම ලියුමක් ආවා. මම ඒක ගිය සභාවේදී මතු කරා. මෙන්න තියෙනවා ඒක.

ගරු සභාපතිතුමනි, මට පොඩි ගැටළුවක් තියෙනවා. අර ගිය සභාවේදී පොඩි ගැටළුවක් ඇති වුණා. මගේ කොට්ඨාශය තුළ අනවසර ඉදිකිරීමක් සම්බන්ධව. ඒකේදී මම කිවුවා සභාවට ඉදිරිපත් කරන්න කියලා ඔබතුමාට ලැබුණු වාර්තාව. ඔබතුමා කියලා තියෙනවා මේ සභාවට ගේන්න විදියක් නැහැ ඒක උපකාර්යාලයේ තියෙන්නේ. ඒක ඊළඟ සභාවට දෙන්නම් කියලා. ඔබතුමා අත්සන් කරපු ලියුමට අදාළ වාර්තාවේ මායිම් කොහොමද තියෙන්නේ. අයිතිකාරයා කවුරු කියලද තියෙන්නේ. වාර්තාවක් ඔබතුමාට ලැබෙන්න ඇතිනේ. මම ඒක ඉල්ලනවා කියලා තියෙනවා.

ඔබතුමා කිවුවා ඊළඟ සභාවේදී දෙන්නම් කියලා. නමුත් ඒක හම්බ වුණේ නැහැ. අද කතා කරහම කිවුවා ලිපිගොනුවේ තියෙනවා කියලා. ඒ ලියුම මෙන්න. උක්ත කරුණට අදාළව අප තාක්ෂණ නිලධාරි ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇත. පෝද්දල, නරාවල, කාසල් වත්ත, නො. 155 නැමැති ස්ථානයේ අනවසර පැති බැම්මක් ඉදිකරන බවත්, මායිම් ගල් පරීක්ෂා කිරීමේදී එම මාර්ගය අල්ලා ගෙන නොමැති බවත්, වාර්තා කර ඇත.

ඒ අනුව, ඒ අයට කියලා තිබුණා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය අරගෙන ඒ බැම්ම ඉදිකරන්න කියලා. එතකොටත් ඒ බැම්ම ඉදිකරලා. දැන් මම කිවුවානේ වාර්තාවක් දෙන්න කියලා. දැන් එතන ඒ ලියුම තියෙනවා. අද මට ඒ ලියුම හම්බ වුණේ. මගේ පිටපත ලිපිගොනුවේ තිබිලා. "ප්‍රාදේශීය ලේකම්ට යවලා තියෙනවා අනවසර පැති බැම්මක් ඉදිකිරීම සම්බන්ධව" කියලා, අර ටිකම තමයි තියෙන්නේ වෙනසක් නැහැ. අකුරක්වත්, ඇලපිල්ලක්වත් වෙනස් නැහැ. ඔන්න ඒකෙ දෙවැනි කොටසේ වෙනස් කරලා තියෙනවා. "ඒ අනුව ඔබ ආයතනය මගින්ද පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන අප ආයතනය දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි කියලා."

තීන්දුව දීලා ඉවරයි. මුලින්ම ඒකෙ දාලා තියෙනවා මායිම් ගල් අල්ලාගෙන නැහැ මේක අනවසර ඉදිකිරීමක් නෙමෙයි කියලා. හැබැයි මෙතනදී කාරණා දෙකක් මතුවෙනවා. එක කාරණාවක් තමයි මම සභාවට ඇවිත් මුල්ම යෝජනාව දැම්මා කාසල්වත්තේ කාණු පද්ධතිය හදන්න. එතකොට ඒ ගල් බැම්ම බැන්දේ ඒ කපපු කාණුවක. එතකොට තාක්ෂණ නිලධාරියා අධීක්ෂණය කරලා තියෙන්නේ වැරදි විදියකට. එහෙම නැත්නම් සභාවෙන් කපපු කාණුවේ කොටසකට බැම්ම දාන්න දුන්නම එතන වෙන මොකක් හරි හේතුවක් තියෙනවා. ඒක නෙමෙයි විහිළුවට ලක් වෙන කාරණාව. මට 2020.09.25 දින තමයි පළවෙනි ලියුම ලැබුණේ. සභාපතිතුමා මේක අහගන්න. මට උත්තර එපා. ඒ ලියුමට අනුව තමයි මම සභාවේ ඇවිල්ලා කතා කරේ. මට වාර්තාවක් දෙන්න කිවුවම මෙන්න ආපු වාර්තාව. වාර්තාව 2020.09.25 ඔබතුමා අත්සන් කරලා තියෙනවා. ඒකෙත් දිනය තියෙන්නේ එදාම තමයි. අද 2020.11.17 වෙනිදා. මෙන්න මට අද ඒකෙ පිටපත දෙනවා. 2020.09.25 අත්සන් කරපු ලියුම් දෙකෙන් පළවෙනි පිටපත මට මාස දෙකකට කලින් හම්බවෙලා ඒ ලියුමත් අරගෙන ඇවිල්ලා මම කතා කරාට පස්සේ ඒ දිනයේම ආපු අනිත් පිටපත මෙන්න අද මට සභාවේදී හම්බ වෙනවා. මොකක්ද මේකෙ තියෙන කතන්දරය. මේකෙ හරි වැරැද්ද මට කවුරු හරි කියලා දෙන්න. එතකොට මේක නිකං විහිළුවක් විතරයි. ඒක නිසා මේක ගැන මම තවදුරටත් කතා කරලා වැඩක් නැහැ. මම වැරැද්ද තේරුම් කරලා දුන්නේ මෙන්න මේකයි කාරණාව කියලා. අපි හැමදේම බලනවා. මේ ලියුමක් ආවට මේ වචන ටික විතරක් බලලා අපි රැවටෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා එක්කෝ ඒ නිලධාරියාව ආරක්ෂා කරන්න හැදුවා. නැත්නම් නිලධාරියා එයා කරපු වරදෙන් බේරෙන්න හැදුවා නම් මොනවා හරි මෙතන ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා මට මේකට කාරණා අවශ්‍ය නැහැ. දිනය වැරදුනේ කොහොමද කියලා ඕනත් නැහැ. මායිම් ගල් ප්‍රශ්නය ඕනත් නැහැ. මම කියන්නේ මේක සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග අර ගන්න. එච්චරයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, මට මේක මතක් වුණේ දැන්. මට ඒ පැමිණිල්ල ආවේ ලියනගේ මන්ත්‍රීතුමත් මගේ කඩය ළඟ ඉන්න කොට සෝමසිරි මහත්තයා කියන කෙනාගෙන්. ලියනගේ මන්ත්‍රීතුමා එතන හිටියා. ඇමතිතුමා ගෙදර ඉන්නවා ගිහිල්ලා කියන්න කිවුවා ඇමතිතුමාට. ඔය පැමිණිල්ල ආවේ සෝමසිරි මහත්තයාගෙන් ලියනගේ මන්ත්‍රීතුමා මගේ කඩය ළඟ ඉන්න කොට. මතකද ඒක.

(ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ៖-** මොකක්ද ඔය පැමිණිල්ල.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ៖-** අර උළුවිටිකේ, ටිකිරූෂ්ඡඩුව වත්තේ බෝක්කුව ගැන ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ៖-** අර මම කඩේට ආපු වෙලාවේ ආව එකද.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ៖-** ලියනගේ මන්ත්‍රීතුමා ඉද්දි එයා ආවේ. එවෙලේ මම ඒක ගිහින් බැලුවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ៖-** ඔය සම්බන්ධව මම කියන්නම්. මම පොහොර බෑග් වගයක් හොය හොය ගියා. මම ඉන්න වෙලාවේදී කවුද දන්නේ නැහැ ගෑණු කෙනෙක් ඇවිල්ලා බයිසිකලය නැවැත්තුවා. මම කවුද කියලා දන්නේ නැහැ. ඇවිල්ලා මොකක්ද කිවුවා. ඒ අතරේදී කවුද දන්නේ නැහැ තව වයසක මහත්තයෙක් ඇවිල්ලා පැමිණිල්ලක් කරා මෙහෙමයි මෙහෙමයි කියලා. ප්‍රාදේශීය ලේකම් එකෙන් කාණුවක් හැදුවා කිවුවා. ඊපාත කියලා කිවුවේ. යසරත්න මන්ත්‍රීතුමයි, එයයි කතා කර කර හිටියේ. කාණුවක් නෙමෙයි බෝක්කුවක්. අඩියක් යටින් කිවුවා දාලා තියෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරන වැඩ පිළිබඳව මගේ ගැටළුවක් තියෙනවා ඔය කාණු ඉදිකිරීම් සම්බන්ධව. මීට ඉහත අවස්ථා කිහිපයකදීම මම කතා කරලා කියලා තියෙනවා. ඒ කියන්නේ කිසිම කාණුවක් ප්‍රායෝගිකව ජලය බැස යන ආකාරයට මගේ කොට්ඨාශයේ හදලා නැහැ. ඒවගේ තමයි අද වෙනකම් මොඩර්න් හාඩ්වෙයාර් එක ගාව, පන්විල දූව වත්ත, ජස්ටින් කන්දේ කාණු හදන්න සල්ලි වෙන් කරලා අදටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලක්ෂ පහ ගාණේ තියෙනවා. හැබැයි ඒ එක තැනකවත් කාණුවක් හැදෙන්නේ නැහැ. මම දැන් ගැටළුව හඳුනාගෙන තියෙනවා. නියමිත කාණු පද්ධතිය හැදෙන්නේ නැත්තේ මොකද කියන එකත් මට ගැටළුවක්. ඉතිං ඒ වෙලාවේ තමයි ඇවිල්ලා කිවුවේ අඩියක් යටින් සිලින්ඩරයක් දාලා තියෙන නිසා වතුර ටික රැස්වෙලා තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ៖-** අඩියක් උඩින්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ៖-** උඩින් හරි, යටින් හරි දාලා වතුර බහින්නේ නැහැ කියලා කිවුවා. මම කිවුවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ ඔහොමමයි. ඔයගොල්ලන්ට අසාධාරණයක් වෙනවා නම් රමේෂ් පතිරණ ඇමතිතුමාට කියන්න එතුමා ඇවිල්ලා ඒක බලලා සාධාරණයක් කරාවි කියලා මම ඒ වෙලාවේදී කිවුවා. මම දන්නේ නැහැ වාසනා මන්ත්‍රීතුමියගේ වැඩක්ද, කාගේ වැඩක්ද කියලා. මට ඊපාත

කියලා කිවුවේ. මම කිවුවා ඇමතිතුමාට ගිහින් කිවුවම ඇවිල්ලා බලලා සාධාරණයක් කරාවි කියලා. මම ඒක එතනදී කිවුවා ඒ මහත්තයාට.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මම ලියුම් ගෙනිච්චේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෙච්ච කතාව. අසාධාරණයක් වෙනවා නම් ඇමතිතුමාට කියන්න කියලා කිවුවා.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** දැන් ඔබතුමා කිවුවානේ ඩයස් අයියා කෝල් කරලා කිවුවා කියලා. ඩයස් අයියත් කෝල් කරලා කියන්න කිවුවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඩයස් අයියා හම්බවෙලා කිවුවේ එයාට කෝල් දෙන්න බැහැ කියලා.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** දැන් ඩයස් අයියා කතා කරලා කියනවා ඒකෙ වැඩේ තාම ඉවරයක් වෙන්නේ නැතුව වතුර බහින්නේ කොහොමද කියලා. කොහොමද අහනවා ඒක තීරණය කරන්නේ. එයා මේ සභාවට ඇවිල්ලා ඕන නම් ඒ පිළිබඳව කියන්නම් කිවුවා.

(ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔබතුමිය ගිහින් ඒක බලන්න.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඉතිං මෙහෙමනේ මන්ත්‍රීතුමා. ඒකෙ වැඩේ ඉවර වෙන්න කලින් ඔබතුමා දැගලුවට වැඩක් නැහැනේ. වැඩේ ඉවර වෙලා බලන්න. ඉතිං ඔබතුමාලා තවම දන්නේ නැහැනේ එතන වතුර හරියට බහිනවද කියලා. ඒක දන්නේ නැහැනේ. ඉතිං ඉංජිනේරුතුමා ඇවිල්ලා බලලා කියනවා නම් මේ වැඩේ හරියි කියලා ඔබතුමන්ලා තව මොනවද කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. ඔබතුමිය ඒක ගැන සෑහීමකට පත් වෙනවාද, ඒක බැලුවද.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඔව්. මම බලලා තියෙන්නේ. කොන්ක්‍රීට් එකක් දාලා තියෙනවා. ඒක ශක්තිමත් වුණාම ඕන උඩ වැඩ ටික කරන්න. තව වැඩ ටිකක් තියෙනවා ඒකෙ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ තාක්ෂණ නිලධාරි ඒක බලලා මට කියන්න. හරි දැන් ඒක ඉවරයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඒ බෝක්කු දෙක දැම්මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දැම්මේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ බෝක්කු දෙක තියෙද්දී ඊට මෙහායින් කරන්නේ. ඒ වැඩේ හොඳයි. ඒක කරන්න ඕන තව අඩියක් යටින් කොන්ක්‍රීට් එක දාලා. තව පහත් කරා නම් හරි. ඒකයි කිවුවේ වෙන මුකුත් නෙමෙයි.

**ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒක ඉතිං හදන්න කලින් කර ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලන්න දිනූෂ මහත්තයා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක යටින් වතුර බහින්නේ නැහැ. කොන්ක්‍රීට් එක තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඒක ඉවරයි. අපේ තාක්ෂණ නිලධාරි ඒක අධීක්ෂණය කරාවි.

**ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ තුන්වෙනි සභා වාරයේදී තමයි මේ කාරණාව මතු කරන්නේ මහවත්ත පාරේ මාර්ගය අවහිර කරපු එක ගැන. කොන්ක්‍රීට් කැල්ලක් දාලා, ඊට පස්සේ අර කොටන් අරවා මේවා දාපු එක ගැන. දිගින් දිගටම මම මේ ප්‍රශ්නය මතු කරනවා. මම සුගත් කලංසූරිය මන්ත්‍රීතුමා එක්ක එකග වෙනවා. මේ ප්‍රාදේශීය සභාවෙන් ලබා දෙන නියෝග හැල්ලුවට ලක් කරන නිලධාරීන්ගේ රාජකාරිය පිළිබඳව ඔබතුමා තීරණයක් ගන්න. ඒ රාජකාරිය කරන නිලධාරියාට ඒ රාජකාරිය කර ගන්න බැරිනම් කරන්න පුළුවන් නිලධාරියෙකුට ඒ රාජකාරිය පවරන්න ඕන. මම රජයේ රැකියාව අවුරුදු 34 ක් කරපු මනුස්සයෙක්. මගේ රාජකාරිය මම අකුරට කරපු මනුස්සයෙක්. අදටත් විශ්‍රාම ගියාට පස්සේ ගහනවා කියපු මිනිස්සු ඉන්නවා හොරෙන් වතුර අරගෙන මම ගිහින් දඩුවම් කරපු, දඩ ගහපු මිනිස්සු. මම කවදාවත් ඒ රාජකාරිය පැහැර හැරලා නැහැ. වතුර කපපු මිනිස්සු මාත් එක්ක පහුගිය

මැතිවරණ වෙලාවේදී මට විරුද්ධව වැඩ කරා මම වතුර කැපුවා කියලා. ඒ රාජකාරිය හරියට කරපු නිසා එහෙම වුණේ. ඒක නිසා කරුණාකරලා ඒ රාජකාරිය කරන්න බැරිනම්, රාජකාරිය කරන්න පුළුවන් කෙනෙකුට ඒ වැඩේ භාර දීලා ඒක කරන්න. දැන් දින 14 ක් කල් දීලා ලියුමක් යැව්වා කිවුවා. දැන් අද වෙනකොට දින කීයක්ද, දින 80 ක් විතර ඇති. දැන් මේ වෙනකම් ඒ වැඩේ කෙරිලා නැහැනේ. ඒක බලන්න යන්නෙත් නැහැ. වැඩේ කෙරෙන්නෙත් නැහැ. එතන අනවසර තාප්පයක්ද, මොකක්ද එකක් ඉදිවෙනවා. ඒකනම් ප්‍රශ්නයක් නැහැ. මොකද ඒක ඉදිවුණාම ගස් වල තියෙන කෝටු වාහන වල වැදීම නතර වෙනවා. ඒක නිසා ඒකෙ ගැටළුවක් නැහැ. නමුත් අර මාර්ගය අවහිර කරන එක බරපතල ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ මම තාක්ෂණ නිලධාරීව යැව්වා. මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා තාක්ෂණ නිලධාරිතුමියට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරිණී අයි. ඩී. කමණී චන්ද්‍රලතා මිය පහත අදහස් දක්වා සිටින ලදී.

- අදාළ පුද්ගලයාව ප්‍රාදේශීය සභාව වෙත කැඳවා එම අබලි ද්‍රව්‍ය මෙම ස්ථානයෙන් ඉවත් නොකරන්නේ නම් සභාව මඟින් ඉවත් කරන බවට දැනුවත් කළ බව.
- මෙම ස්ථානයට ගෙනැවිත් දමා තිබූ ගල්, වැලි, අබලිද්‍රව්‍ය මෙම පුද්ගලයා විසින් ඉවත් කර තිබූ බව.
- පෙර දිනයේද, මෙම ස්ථානය නිරීක්ෂණය කළ බවත්, ඒ වන විට එම ස්ථානයේ ඇති බැම්ම උඩ තබා තිබූ කොටන් කැබලි කිහිපයද, ඉවත් කරන ලෙසට දැනුම් දුන් බව.
- විටින් විට ගෙනැවිත් දමන ගල්, වැලි සහ වෙනත් අබලි ද්‍රව්‍ය මෙම පුද්ගලයා විසින් ඉවත් කර ගන්නා බව.
- මාර්ගයේ වාහන ගමනාගමනයට අවහිර ඇති වන පරිදි අදාළ පුද්ගලයා කටයුතු කර නොමැති බව.
- අදාළ අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සිදු නොකළහොත් පොලීසිය සමඟ එකතු වී නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට, වැඩිදුරටත් අදාළ පුද්ගලයාට දැනුම් දුන් බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** දැන් එතන තියෙන ගැටළුව මේකයි. මම ඔය බැම්ම කෙලවරට වෙනකම් මුදල් පාස්කරගෙන හැදුවේ මේ පාර එතනින් පටු වෙලා ඇතුළට යන නිසා. ඇතුලෙන් වාහනයක් එනකොට මෙහෙන් යන වාහනය අයින් කර ගන්න තමයි ඒ ඉඩකඩ එතන හදා ගත්තේ. ප්‍රාදේශීය ලේකම්තුමත් ඇවිල්ලා ඕක බැලුවා හදන්න ඉඩ නොදීම නිසා. බොහොම අමාරුවෙන් ඔය ටික හදා ගත්තේ. දැන් වෙලා තියෙන්නේ මේ වාහනය මෙහෙන් යන කොට අර පැත්තෙනුත් වාහනයක් ආවම මේ වාහන දෙක හිර වෙනවා මේක ඇතුළේ. ඒක ගිහිල්ලා බලන්න. වාහනයක් එන කොට මිනිහෙකුට අයින් වෙන්න ඉඩක් නැහැ එතන. ඒකයි කියන්නේ. මෝටර් සයිකල් කිහිපයක්ම එතන වැටුණා. ප්‍රියන්ත මන්ත්‍රීතුමා ඒක දන්නවා. මම එදා රමේෂ් මහත්තයා ලිපිගොනුව භාර දෙන්න ගියපු වෙලාවේදිත් කිවුවා අතන යන ගමන් බලාගෙන යන්න කියලා. අර මොකක්ද කරලා තියෙන්නේ. ඇයි ඒවා ඒක අස්සේ දාන්නේ. එයා ගේන බඩු ටික අස්කර ගත්තා නම් පාරේ යන වාහන වලට අවහිරතාවය නැති වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකට මෙහෙම කරන්න. අපේ වාහනයක හරි පටවලා ඔය ටික කොහේට හරි ගිහින් දාලා ඒක ඉවරයක් කරන්න.

**ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එතකොට ඒක ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක එහෙම ඉවර කරලා දාන්න. හැබැයි ආයේ දාන්න දෙන්න බැහැ ඒ මිනිහට මුකුත් ඒකෙ. කී පාරක් අපිත් ඕක කියන්නද, අපේ වාහනයක හරි පටවාගෙන කොහෙ හරි ගිහින් දාන්න. බෝඩ් එකක් ගහන්න මෙතන කුණු දාන්න තහනම් කියලා. ආයෙ දැම්මොත් ඒ මිනිස්සු අත්අඩංගුවට අර ගන්න පොලීසියට කියලා. එතකොට ඉවරයිනේ. මේක කරන්න බැහැනේ. ගෙන්නලත් මම කිවුවා. එයා ආවා එක දවසක් ඔය කියන එක මොකක් හරි වාහනයක පටවා ගෙන ගිහින් කොහේට හරි දාන්න. ඊට පස්සේ දාන්න දෙන්න එපා. එතකොට ඉවරයිනේ.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-11-05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. තාක්ෂණික සේවා කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-11-05 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව</u> ඃ- නැත**

**<u>04. පරිසරය සහ පහසුකම් කමිටුව</u> ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>04. වෙනත් ලේඛන</u> ඃ- නැත**

<u>(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u>

<u>පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ නොවැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, ප්‍රගතිය ගැන සාකච්ඡා කරන්න වෙන්නේ පහුගිය කාලයේ ගනිපු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නැවත මතක් කරලා සමාලෝචනය කිරීමක් සමඟ. ගරු සභාපතිතුමනි, දිගටම මේ කාරණය මම සභාගත කරා. ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ ප්‍රශ්නය මේක. ගරු සභාපතිතුමනි, මේ කාරණයට ඔබතුමා අවධානය යොමු කර වන්න. අපි කලින් කරපු යෝජනාවක් මේක. මේකට සමස්ථ සභාවේ එකඟත්වයත් එක්ක තීන්දුවක් ගත්තා ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ නිවස අසල තිබෙන කාණුව ප්‍රතිසංස්කරණය කරන්න. ඒකෙ යෝජනාව නැවත සකස් කරලා ඔබතුමා මැදිහත් වෙලා ස්ථානීය පරීක්ෂණයක් කරලා සභාවේ සියළු මන්ත්‍රීවරු මැදිහත්වෙලා අවසානයේ තීන්දුවක් ගත්තා ඒ දෙපාර්ශවයම සමථයකට පත් කරන්න කාණු දෙකක් දෙපැත්තෙන් හදලා හරි මේක විසඳනවා කියලා. ඒ ක්‍රියාමාර්ගය ගන්න. පහුගිය දවස්වල පැවිල්ලත් එක්ක ඒකට ඉඩකඩ තිබුණා. ඒක මම ඔබතුමාට මතක් කරා පෞද්ගලිකවත් ඒක ඉක්මන් කරලා දෙන්න කියලා. ආයෙම වැහැලා යට වුණාට පස්සේ වතුර එක්ක දඟලනවට වඩා වැස්ස පායපු දවස්වල වතුර නැතුව කාණුව කපලා මාර්ගය සාදා ගන්න තිබුණා වතුර බැහැලා යන්න. ඒක ඉතාමත් අවම වියදමකින් ඒ වෙලාවේදී කර ගන්න තිබුණා. මේ වෙන කොටත් ඒ සම්බන්ධව ඔබතුමා ගනිපු ක්‍රියාමාර්ගය සම්බන්ධව ප්‍රගතිය අවස්ථාවේදී මට පැහැදිළි කිරීමක් කරන්න. මේ කාරණය දැන් දිගින් දිගට යනවා මාස ගණනාවක් තිස්සේ. මිනිස්සු අපහසුතාවයට ලක් වෙනවා. මේක මහා සාහසිකයි. කල්පනා කරලා බලන්න ඔබතුමා. මේකට මුහුණ දෙනවා නම් ඔබතුමා මොකද කරන්නේ කියලා. දැන් සෑහෙන්න කාලයක් තිස්සේ මේ ප්‍රශ්නය තියෙනවා. අවුරුදු 10 ක් පීඩාවට පත් වෙච්ච මනුස්සයෙක් මේ.

ඊළඟ කාරණාව ගරු සභාපතිතුමනි, අප පහුගිය කාලයේ දැන් මෙතනදී ඔබතුමා සාකච්ඡා වලදී මතු කරපු කාරණා එක්ක අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම්, අනතුරුදායක ස්ථාන සහ ගස් සම්බන්ධයෙන් සභාවේ පත් කරපු කමිටුවේ නිර්දේශ සහ නිරීක්ෂණ වාර්තා සභාගත කරලා තිබුණා. ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සාකච්ඡා කරන්න කියලා තීරණය වුණා නැවත අපි ඒ කමිටුව එක්ක. මේ සමහර ඒවාට අනුමැතිය දීලා, කමිටු තීන්දු අරගෙන අදාළ ආයතන වල නිර්දේශ සහ අනුමැතිය සහිතව තමයි මේක ක්‍රියාත්මක කර ගෙන යන්නේ. සමහර ඒවාට අපි මැදිහත්වීමේදී ප්‍රායෝගික ප්‍රශ්න තිබුණත් සමහර ඒවායේදී නීතිමය ප්‍රශ්නත් මතු වෙනවා. මම කියන්නේ අපි නිවැරදිව ක්‍රියාමාර්ග වලට යන කොට ආපහු නීතිමය ක්‍රියාමාර්ග ගන්න බැහැනේ සමහර දේවල් වලට. සමහර ඒවායේ තීන්දු තීරණ අරගෙන, කමිටු නිර්දේශ දීලා ඒවා අනුමත කරලා තියෙනවා. වෙනත් ප්‍රායෝගික ප්‍රශ්නත් තියෙනවා. ඒ නිසා මේවා සම්බන්ධව සාකච්ඡා කර ගන්න. පළාත් පාලන ආයතනය සහ එන්.බී.ආර්.ඕ. එක සම්බන්ධීකරණය කරලා කමිටුවේ රැස්වීමක් අපි කැඳවලා සාකච්ඡා කරමු කියලත් කිව්වා. ඒ සම්බන්ධව මේ වන විට තත්ත්වය මොකක්ද කියලා දන්නේ නැහැ. ඒකට අපි නිශ්චිතව ඉක්මන් ක්‍රියාමාර්ගයක් අරගෙන මේවා ඉවරයක් කරලා දාමු.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එදා සාකච්ඡා කරානේ නඩු දාන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒක නෙමෙයි සභාපතිතුමා මම කිව්වේ. නඩු දාන එක නෙමෙයි, ඒවායේ නීතිමය තත්ත්වයන් ගැන සාකච්ඡා කරන්න ඒ ආයතන එක්ක සම්බන්ධීකරණය කරලා සාකච්ඡාවක් දෙන්නම් කිව්වනේ. ඒ කමිටුවේ සහ අදාළ ආයතන වල තාක්ෂණ නිලධාරීන් සහ ඒ නිර්දේශයන් සම්බන්ධව අපිට දැනුවත් කිරීමක් කරන්න ඕන. මොකද, ඒ අවබෝධය සහිතව මේ ක්‍රියාමාර්ග ගන්න ඕන. නැත්නම් නිකම්ම නිකං නඩු දාන්න ලිපිගොනු උස්සගෙන ගිහිල්ලා කාටවත් දීලා වැඩක් නැහැනේ. එතකොට ඒවායේ තියෙන නීතිමය තත්ත්වයන් අනුවනේ අපි කරුණු කාරණා ගොනු කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඊළඟ සැලසුම් කමිටුවට අපිව කැඳවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** බ්‍රහස්පතින්දට කැඳවන්නම් සාකච්ඡාවක් අනෙක් මන්ත්‍රීවරුන්ටත් එක්කම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඉදිරි ක්‍රියාමාර්ග ගන්න ඒවාට ඉක්මන් කරලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා :-** ටෙක්ලා මන්ත්‍රීතුමියට අසනීපයි කියලා සභා රැස්වීමට සහභාගි වෙන්න විදියක් නැහැ කියලා කිව්වා. එතුමියට නිවාඩු අනුමත කරන්න කියලා ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** ශ්‍යාමිකා මන්ත්‍රීතුමියටත් එන්න විදියක් නැහැ කියලා කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ටෙක්ලා මන්ත්‍රීතුමියටයි, ශ්‍යාමිකා මන්ත්‍රීතුමියටයි නිවාඩු අනුමත කරන්න මම යෝජනා කරනවා.

**ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අද උදේ අපිට ලියුමක් ගෙනල්ලා දීලා තියෙනවා. වටරැක අර තියෙන්නේ අර්බුධකාරී අඩි අටේ පාරක ප්‍රශ්නයක්. පුෂ්පකුමාර කියලා කෙනෙක් ගෙනත් දීලා තියෙන්නේ අර කඩපු තාප්පය ගැන. ඒ පාර හදලා දෙන එක හරි සභාපතිතුමා. ඒක ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ නිසාම දැන් අනතුරු කිහිපයකුත් මතු වෙලා තියෙනවානේ. ඒක අඩි අටට නෙමෙයිනේ තිබුණේ. ඒක බැඳලා දීලා සමථයකට පත් වෙලා ප්‍රශ්නය ඉවර කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැඳලා දෙන්න කිවුවේ මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කැපුවම බැඳලා දෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය සල්ලිත් අරගෙනනේ. අනිත් පාර්ශවය මුදල් බැඳලා තියෙනවා බැම්ම කැඩීමට සහ බැඳීමට. රුපියල් අසූ හය දහසක් ගෙවලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නම් මම දන්නේ නැහැ කියන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්න මම ඒකට උත්තරයක් දෙන්නම්. දැන් අපේ සභාවෙන් ඒ අය ඉල්ලීමක් කරා ඒක කඩලා දෙන්න කියලා. අපි ගිහිල්ලා කරේ ගල් ටික ගලවලා ඉවත් කරපු එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම කරේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම කරේ. සල්ලි බැඳලා තියෙනවා. ඒක ඒ අය කරගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට එහෙම ලියුමක් දුන්නේ නැහැ හැබැයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇවිල්ලා මෙතන තියලා ගියා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාවේ අපි ඔක්කොටම දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට දුන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා වගඋත්තර කාරයෙක් කරලා දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමා, අලස් මහතාගේ ප්‍රශ්නය තියෙන්නේ. මේකට ඔබතුමන්ලා මැදිහත් වෙලා කාගෙවත් පැත්ත ගන්න එක නෙමෙයි කරන්න ඕන. නමුත් එකක් තියෙනවා. ඒ මිනිස්සු ගස් කපලා කපලා ඉවර කරලා. දැන් අනිත් ගහත් බැන්දා. ඒක හින්දා දැන් බලන්න මේ මිනිස්සු වැරැද්දක් කරලා තියෙනවා. කොනටම වෙනකම් කණ්ඩිය කපාගෙන ගිහිල්ලා කාගෙන්වත් අවසරයක් නැතුව. ඒකට මැදිහත් වෙලා මේක සමථයකට පත් කරලා දෙන්න. දැන් ගහ බැඳලා තියෙන්නේ. ඒකට විසඳුමක් දෙන්න මැදිහත් වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේදී ඔබතුමා කියන එක හරි. කණ්ඩියේ ප්‍රශ්නය තියෙනවා. නමුත් ගහ අනතුරුදායකයි. මට තියෙන ප්‍රශ්නය ඒක. ඔබතුමා ඕකේ අනිත් පැත්තත් කතා කරන්න. කැන්දපලතුඩුව වත්තේ සිරිසේන විදුහල්පතිතුමා බැඳලා තිබුණ ගහ කඩන් වැටුණා අනෙක් පැත්තේ ගෙදරට. ඒ කියන්නේ ගහක් බැඳීම සාර්ථක නැහැ කියලානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ගහ බැඳලා තිබුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. බැඳලා තිබුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කඩන් වැටිච්ච ගහ බැඳපු එකක් නෙමෙයි. කඩන් වැටුණේ බැඳපු ගහක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැඳපු ගහක් කඩන් වැටුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක් වුණත් එකක් තියෙනවා. කණ්ඩිය කැපීම තුළම තමයි නිර්මාණය වෙන්නේ ගහ මේවා වෙන එක. ගස් කපලනේ. ඔබතුමාලා නැවත පාරක් ඒක බලන්න. ඒ මිනිස්සුන්ගේ එකම පොල් ගහ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලමු. බොහොම ස්තුතියි සියළු දෙනාටම අද සභාවට සහ අයවැය සභාව කර ගෙන යන්න මට සහයෝගය ලබා දීම පිළිබඳව.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020-12-15 වන අඟහරුවාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.